# උග්‍ර සහ නිදන්ගත

## ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සාමය තුළ
## ආගමික ප්‍රචණ්ඩත්වය



# ආවේණික සහ දරුණු වූ
# ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුද්ධ ආගමික ප්‍රචණ්ඩත්වය


ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය

සහ

ජකිටාස්

(ජාත්‍යන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානය)



2015

ආවේණික සහ දරුණුවූ ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුද්ධ ආගමික ප්‍රචණ්ඩත්වය

කොළඹ, 2015

ප්‍රකාශන හිමිකම ජනවාර්ගික අධ්‍යයනය සඳහා වු ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ ඊකිටාස් ජාත්‍යන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානය

මෙම ප්‍රකාශනය යම් සංවිධානයක් විසින් මානව හිමිකම් අධ්‍යයන කටයුතු සඳහා යොදාගන්නේ නම්, එය නැවත ප්‍රකාශනය කලහැකි වේ. එවැනි අවස්ථාවකදී, එම ප්‍රකාශනයේ මූලාශ්‍රය සඳහන් කර ඒ බව ජනවාර්ගික අධ්‍යයනය සඳහා වු ජාත්‍යන්තර මධ්‍යස්ථානයට සහ ඊකිටාස් ජාත්‍යන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානයට දැන්විය යුතුවේ.

අයිසීඊඑස් (ICES) සහ ඊකිටාස් (Equitas) යන ආයතනවල කිසිම අනුමැතියකින් තොරව, මෙම ප්‍රකාශනයේ කොටසක් හෝ නැවත සුදුසු ලෙස යොදාගැනීම, කුමන ක්‍රමයකින් හෝ බෙදා හැරීම හෝ ප්‍රකාශයට පත්කිරීම, පරිගණක දත්ත ගබඩාවල තැන්පත් කිරීම හෝ නැවත පිටපත් කිරීම, ව්‍යාපාරික කටයුතු සඳහා යොදාගැනීම හෝ නැවත මුද්‍රණය කර බෙදාහැරීම තහනම් වේ.

ප්‍රකාශන හිමිකම © ජනවාර්ගික අධ්‍යයනය සඳහා වු ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ ඊකිටාස් (Equitas) – ජාත්‍යන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානය.
ISBN – 978-955-580-168-3
Legal Deposit -

පිට කවරය නිර්මාණය යශාන් ඛලිෆේහ් විසිනි.
(Cover Artwork by Yazan Khalifeh)

# ආවේණික සහ දරුණුවූ:

# ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුද්ධ ආගමික ප්‍රචණ්ඩත්වය

*ගෙහාන් ගුණතිලක්*[*]

***විසිනි***

[*] ගිහාන් ගුණතිලක මහතා නීතිඥයෙක් සහ කොළඹ පසුබිම් කරගත් පර්යේෂකයෙක් වේ. ඔහු වෙරිටේ රිෂර්ච් (Verité Research) ආයතනයේ පර්යේෂණ අධ්‍යක්ෂවරයා වන අතරම, සිඩ්නි විශ්ව විද්‍යාලය, කොළඹ විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රීකරණය සහ සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ආචාර්යවරයෙක් ලෙසද කටයුතු කරයි. වර්තමානයේදී ඔහු ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයේ නිව් කොලේජ්හි පොදු රාජ්‍ය මණ්ඩල ශිෂ්‍යත්වලාභියෙක් ලෙස කටයුතු කරයි.

## ස්තුතිය Acknowledgements

මෙම පර්යේෂණය **ආගමික සමගිය වැඩිදියුනු කිරීමේ ව්‍යාපෘතsfha** (***Promoting Religious Harmony Project)*** එක් අංගයක් වන අතර එහි ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ විවිධ ආගමික කණ්ඩායම් අතර අවබෝධය වැඩිදියුණු කිරීමට, සාමාජිය සමගිය දියුණු කිරීමටත් සහ අන්තර් ආගමික සහජීවනය පෝෂ්‍ය කිරීමටත් බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ :

***ජනවාර්ගික අධ්‍යයනය සඳහා වු ජාත්‍යන්තර මධ්‍යස්ථානය*** (***International Centre for Ethnic Studies*** )
ස්වාධීන පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස, ජනවාර්ගික කටයුතු ගැන, දේශපාලන අනන්‍යතාවය, ගැටුම් නිරාකරණය, යුද්ධයෙන් පසු සාමදානය, ප්‍රජාතන්ත්‍රවාදය, පාලනය, මානව හිමිකම් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගැන අවබෝධය යොමුකර ඇත. ICES හි දූත මෙහෙවර/පරමාර්ථය ජනවාර්ගික කටයුතු, ගැඹුරුවට අධ්‍යයන කිරීමට, දේශපාලනය හා ගැටුම් හඳුනාගැනීම, පර්යේෂණ, ප්‍රකාශන, සංවාද, නිර්මාණාත්මක ප්‍රකාශ/කියමන් හා දැනුම බෙදාහදා ගැනීම තුලින් සාධාරණ හා සාමකාමී සමාජයක් ඇතිකිරීමයි.

***Equitas–ඊකිටාස්-ජාත්‍යන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානය*** (***International Centre for Human Rights Education)*** ලාභ නොලබන රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර සමානත්වතාවය වැඩිදියුණු කිරීමට ක්‍රියාකරන අතර සමාජ සාධාරණත්වය සහ මානව ගරුත්වය, කැනඩාවේ සහ ලෝකයේ අනිකුත් රටවල්වලත් මානව හිමිකම් අධ්‍යාපන වැඩසටහන යටතේ වැඩිදියුණු කිරීමට කටයුතු කරයි.

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වු ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICES) සහ Equitas ජාත්‍යන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානය (Equitas) මෙම ව්‍යාපෘතියේ විවිධ අංශයන් ක්‍රියාත්මක කිරීමට සක්‍රියව දායකවූ අයට ඔවුන්ගේ කාලය සහ ප්‍රවීණතාවය කැපකිරීම ගැන ඔවුන්ට ණයගැතිවේ. මෙම වාර්තාව ලිවීමට දායකවූ ගෙහාන් ගුණතිලක මහතාට, පරයේෂණ කටයුතු සඳහා සහායවූ Verité Research ආයතනයේ ජනීන් ප්‍රනාන්දුට සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය කුමුදු කුසුම් කුමාර සහ විවෘත විශ්ව විද්‍යාලයේ ආචාර්ය.හරිණී අමරසූරිය යන දෙදෙනාටම මෙම වාර්තාව සමාලෝචනය කර, ඒ ගැන අදහස් දැක්වීම ගැන අපගේ ස්තුතිය පිරිනැමේ. එසේම මෙම ව්‍යාපෘතියේ නොයෙක් අංශවලින් සහාය දැක්වූ කේතකී කඳනාආරච්චි, රජනී රත්නායක, සමිත හෙට්ටිගේ, චමින්ද්‍රි සපරමාදු යන අයට අපගේ කෘතඥතාවය මින් ප්‍රකාශ කරමු.

කැනඩා රජයට අයත් විදේශ කටයුතු, වෙළඳ සහ සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට මුල්‍යමය දායකත්වය ලබාදී ඇත.

## ආවේණික සහ දරුණුවූ ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුද්ධ ආගමික ප්‍රචණ්ඩත්වය

## පටුන

**පෙරවදන**
**සාරාංශය**

**හැඳින්වීම** ....................................................................................Error! Bookmark not defined.

**1. නෛතික, ප්‍රතිපත්තිමය සහ ආයතනික රාමුව ........................................................ 3**

1.1 ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ හොඳ ව්‍යවහාරයන්/ භාවිතයන් ........................................ 3

1.2 ව්‍යවස්ථානුකූල රාමුව Constitutional Framework ............................................ 8

1.3 ආගමික ප්‍රචණ්ඩත්වය සහ වෛරී කථනය පිළිබඳ නීති ........................................ 10

1.4 ප්‍රතිපත්ති සහ ආයතනික රාමුව Policy and Institutional framework ..................... 12

**2. ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත Data on Religious Violence ....................... 16**

2.1 ආගමික පහරදීම් වර්ගීකරණය Categorisation of religious attacks .......................... 16

2.2 අපරාධකරුවන් වර්ග කිරීම Classification of perpetrator .................................. 18

2.3 ආගමික පහරදීම් සංඛ්‍යාත්මකව සිතියම් ගතකිරීම ................................................... 19

Quantitative mapping of religious attacks ....................**Error! Bookmark not defined.**

2.4 විෂය අධ්‍යයනය Case studies ..................................................................... 28

2.5 ජනවිකාශනය අනුව ආගමික පහරදීම් සිතියම් ගතකිරීම ........................................ 31

Demographic mapping of religious attack.................... **Error! Bookmark not defined.**

2.6 නිදන්ගත සහ දරුණු ප්‍රචණ්ඩත්වය Chronic and acute violence ..................... 36

3.1 සමාජ-සංස්කෘතික සන්දර්භය Socio-cultural context ......................... 37

3.2 ආර්ථික සන්දර්භය Economic context ................................ 40

3.3 දේශපාලන සන්දර්භය Political context ............................. 42

3.4 විශේෂිත දේශීය සන්දර්භය Particular local context ............................................ 47

3.5 පශ්චාත්-රාජපක්ෂ සංවර්ධන Post-Rajapaksa development ................................. 48

**4. මාධ්‍යයේ කාර්ය භාරය (භූමිකාව) The Role of the Media ...................................... 49**

**5. සමාප්තිය Conclusion ............................................................................................. 51**

## පෙරවදන Foreword

### ආගම සහ විශ්වාස පිළිබඳ නිදහස ප්‍රවර්ධනය කිරීම/වැඩිදියුණු කිරීම
### Promoting Freedom of Religion and Belief

පසුගිය වසර දෙක තුලදී ජාත්‍යන්තර ජනවර්ගික ආගමික මධ්‍යස්ථානය(ICES) සහ Equitas මොන්ට්‍රියල්හි පිහිටි ජාත්‍යන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානයේ (Equitas) සහයෝගිත්වයෙන් ආගමික සමගිය සහ අන්තර් ආගමික සංවාද පිළිබඳ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි.

පර්යේෂණ, සංවාද, අධ්‍යාපනික සහ ප්‍රජාව මැදිහත්වීම හරහා මෙම ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකාවේ විවධ ආගමික කණ්ඩායම් අතර අවබෝධය වැඩිදියුණු කිරීමට, සමාජ සමගිය වර්ධනය කිරීමට, අන්තර් ජනවාර්ගික සහ අන්තර් ආගමික සහජීවනය(coexistence) ඇතිකිරීමට ද බලාපොරොත්තු වේ. දිගුකාලීනව, මෙම ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකාවේ අන්තර් ආගමික නොඉවසුම් ගතිය (tensions) අඩුකිරීමට අපේක්ෂා කරයි, එසේම ඉවසීමේ ගුණය සහ අවබෝධය ජනනය කිරීමට, ආගමික විවධත්වය ප්‍රවර්ධනය කිරීමට සහ වෙනත් සමාජවල ඇති මෙවැනි සමාන ගැටුම් ගැන ආදර්ශයන් වැඩිදියුණු කිරීමටද අපේක්ෂා කරයි.

එහි මුල පිරිමක් ලෙස ICES සහ Equitas ආයතන, ආගමික නිදහස සහ විශ්වාසයන් ගැන අධ්‍යයනයක් කිරීමට පත්කරන ලදී. මෙම අධ්‍යයනය කොටස් පහකින් ඉදිරිපත් කර ඇත. පළමුවැනි කොටස, විවධ වර්ගයේ ආගමික පහරදීම් සහ එයට සම්බන්ධ අපරාධකරුවන් ගැන විමසා බැලීමද, දෙවැනි කොටසින් ශ්‍රී ලංකාවේ ආගමික නිදහසට සම්බන්ධ නෛතික සහ ආයතිනික රාමුව ගැන ද විමසා බැලීම කරයි. තුන්වන කොටසින් සන්දර්භයන් ගැන අවධානය යොමුකර ඇති අතර, සහ ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වයට පසුබිම් වූ කරුණු ගැන විශේෂයෙන් සමාජ සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භයන් ගැන විශ්ලේෂණයක් සැපයීම කරයි. අවසාන කොටසින් මාධ්‍යයේ භූමිකාව එනම් එහි කාර්යය භාරය විශේෂයෙන් සමාජ මාධ්‍යය, ආගමික නිදහස සහ ආගමික ප්‍රචණ්ඩත්වය වැඩිකිරීමට/උසිගැන්වීමට මුල්වූ සමහර කථාවන් ගැන විශ්ලේෂණය කරයි. සමාප්ති කොටසින් මෙරට ආගමික නිදහසට සහ ආගමික ප්‍රචණ්ඩත්වයට අදාලවෙන ප්‍රධාන නිරීක්ෂණයන් සහ නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ සහ අනිකුත් සමාජවලදද සමාන ගැටුම්වලට මුහුණදීමට හැකි අන්තර් ග්‍රහණය කල හැකි ගුණයන් ගොඩනැගීමට සහ සානුකම්පිතය ඇතිකිරීමට හැකිවෙන පරිදි එමගින් විවාදවලට ආගම් සහ විශ්වාස පිළිබඳ නිදහස ගැන කථාවන්ට දායකවේ යන බලාපොරොත්තුවෙන් අපි මෙම අධ්‍යයනය ඉදිරිපත් කරමු. එසේම මෙමගින් නීති බලාත්මක කිරීම, ආයතන සවිබල ගැන්වීම, ප්‍රජා සම්බන්ධවීම් සහ සමාජ මාධ්‍ය ජාලයන් මගින් ප්‍රතිපත්ති සහ ව්‍යවහාරයන් පෝෂණය වේයයි අපි උදෙක්ම බලාපොරොත්තු වෙමු.

| | |
|---|---|
| *ඉයන් හැමිල්ටන්* | *මාරියෝ ගෝමස්* |
| *විධායක අධ්‍යක්ෂ* | *විධායක අධ්‍යක්ෂ* |
| *Equitas – ජාත්‍යන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානය* | *ICES* |

*නොවැම්බර් 2015*

## සාරාංශය Executive Summary

දශක තුනක් තිස්සේ ශ්‍රී ලංකාවේ පැවති යුද්ධය 2009 මැයි මාසයේදී අවසාන වුවත්, ජනවාර්ගික සහ ආගමික ප්‍රචණ්ඩත්වයන් රටේ දිගටම සිදුවේ. පශ්චාත් යුද්ධ කථාබස් නිසා අලුත් නොඉවසුම් තත්වයක් ඇති වී වැරදි මග යමින් සුලු ආගමික පිරිස්වලට පහරදෙන පරිසරයක් නිර්මාණය වී ඇත. මේ නිසා කිසිම දුර්විපාකයන් නොලබා සිටි මුස්ලිම් සහ ක්‍රිස්තියානි සුලු ආගමික කොටස්වලට පහරදී ඇත.

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ ආගමික නිදහසෙහි තත්වය පරික්ෂාකර බලනු ඇත. එමගින් ආගමික පහරදීම් හා එයට සම්බන්ධ වු ක්‍රියාකරන්නන් ගැන වර්ගකිරීම සිදුකරන ආකාරය ගැන ද සාකච්ජා කරනු ඇත. මෙහිදී ප්‍රචණ්ඩත්වය (‘violence’) යන පුලුල් නිර්වචනය යොදාගෙන ඇති අතර එයට ස්පර්ශ කලහැකි, (tangible) වර්ගයේ ශාරීරික සහ ශාරීරික නොවන සහ ව්‍යුහාත්මක විදියේ ප්‍රචණ්ඩත්වයන් අයත් වේ. පස්වැදෑරුම් ආගමික පහරදීම් ඒ අනුව හදුනාගෙන ඇත. ඒවා නම්

1) පුද්ගලයින්ට ශාරීරිකව පහරදීම,
2) දේපල වලට හානිකිරීම,
3) තැතිගැන්වීම, තර්ජනය කිරීම සහ බලහාත්කාරකම් කිරීම,
4) වෛර/ද්වේශ කිරීමේ ව්‍යාපාරය හෝ බොරු ප්‍රචාරණ යන්ත්‍ර සහ
5) වෙනස්කර සැළකීමේ පුරුදු වේ. තවදුරටත්, නොයෙක් විදියේ අපරාධකරුවන් හදුනාගෙන ඇත. (a) රජයේ ආයතන සහ රාජ්‍ය සේවකයින්. (b) දේශපාලන සහ සමාජ සංවිධාන සහ දේශපාලඥයින්. (c) ආගමික ආයතන සහ පැවිදි පිරිස. (d) වාණිජයට නැතිනම් වෙළදාමට උනන්දුවෙන කණ්ඩායම් සහ පෞද්ගලික අංශයේ ආයතන, සහ (d) කිසිම දෙයකට සම්බන්ධ නැති, හදුනානොගත් පුද්ගලයින් සහ කණ්ඩායම් මේ ගණයට වැටේ. මෙම අධ්‍යයනයෙන් තවදුරටත්, මෙම ප්‍රචණ්ඩත්වය සිදුවූ, ආගමික නිදහසට සම්බන්ධ, නීතිමය, ප්‍රතිපත්ති සහ ආයතනික රාමුව සහ සමාජ සංස්කෘතික ආර්ථික හා දේශපාලන සන්දර්භයන් (contexts) පරික්ෂා කරයි’

නොයෙක් විදියේ සොයාගැනීම් මෙම අධ්‍යයනයේ විශ්ලේෂණයෙන් එලිදරව්වී තිබෙනවා. මෙම විශ්ලේෂණය සංඛාත්මක කොටස් (2013 හා 2014 දී) වාර්තා වුන ප්‍රචණ්ඩ ක්‍රියා පාදක කරගෙන සහ ජනවිකාශ දත්ත අනුව (demographic data) සහ ග්‍රෑන්ඩ්පාස්, අලුත්ගම, සහ දකුණු පළාත මූලික කරගෙන කරන ලද විෂය අධ්‍යයනයන් අනුව කල ගුණාත්මක කොටස් මුල්කරගෙන සිදුකරඇත. මින් මතුවූ කරුණු පහත සදහන් ලෙස සාකච්ජා කර ඇත.

පළමුවෙන්, ශ්‍රී ලංකාවේ සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්වයන්, අත්‍යාවශ්‍ය හැඩයන් දෙකකින් දක්වා ඇත. අනිත් අතට සුලු ආගමික කොටස් දිගටම, සෙමින් සිදුවන පහරදීම්වලට භාජනය වේ. එය තවදුරටත් පෙලගැස්මෙන් බලනවිට, වෛරකිරීමේ නැතහොත් ද්වේශ කිරීමේ ව්‍යාපාරයන් සහ මඩ ප්‍රචාරයන්, තර්ජනය කිරීම්, තැති ගැන්වීම්, දේපලවලට කරන සුලු තරමේ හානි සහ වරින්වර සිදුකරන ශාරීරික ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවේ. මෙවැනි ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා (‘chronic’) .ආවේනික. ප්‍රචණ්ඩත්වය ලෙස විස්තර කලහැකිවේ. අනිත් අතට, ආගමික ප්‍රජාවන් කඩින්කඩ සිදුවන සිද්ධීන් නිසා ඉතා දරුණු ගණයේ ප්‍රචණ්ඩත්වයට පත් වේ. මෙවැනි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය විශේෂයෙන් බරපතල වන අතර, ඒවාහි ගතිලක්ෂණ අනුව පුලුල්ව පැතිරගිය ශරීරික පහරදීම්, දේපල විනාශකිරීම් සහ පොදුවේ නීතිය සහ සාමය බිදවැටීම පෙන්විය හැකිය. මෙවැනි ප්‍රචණ්ඩත්වය (‘acute’ violence) දරුණු ප්‍රචණ්ඩත්වය ලෙස විස්තර කල හැකිය. අපගේ අවබෝධය අනුව මෙම දෙබෙදුම (dichotomy) ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබද ප්‍රශ්නය විසදීමට සහ ක්‍රියාකාරී මැදහත්වීමකට උපක්‍රමයක් සොයාගැනීමට ඉතා වැදගත් වේ.

දෙවනුව, ආගමික පහරදීම් පිළිබද භූගෝලීය දත්ත, ජනවිකාශ දත්ත සමග සංසන්දනය කරද්දී ඉතා වැදගත් නැඹුරුවක් මතුවුණි. පහල හෝ මධ්‍යම මට්ටමක ආගමික විවිධත්වයක්

ඇති සහ සාපේක්ෂක වශයෙන් සුලු ආගමිකයින් වාසය කරන ප්‍රදේශයන්වල සිටින ජනතාවට සුලු ආගමිකයින්ට විරුද්ධව සිදුවන දරුණු ප්‍රචණ්ඩත්වයන් ගැන අත්විදිමට සිදුවෙන බව පෙනී යයි. එසේම, එම ප්‍රදේශයන් දරුණු ප්‍රචණ්ඩත්වය කරා යාමට විශාල නැඹුරුවක් විදහා පෙන්වා ඇත්තේ ඇයි යන්න උපකල්පනය කිරීමට හැකි වේ. අනිත් අතට, සාපේක්ෂ වශයෙන්, කුඩා ජනගහණයක් අයත්වන ඉලක්කගත සුලු ජාතික ප්‍රජාව නිරාවරණය වීමෙන්, ඔවුන්ට අනතුරක් වියහැකි බවටත් ආරක්ෂාවක් නැති බවටත් ප්‍රයතක්ෂ වේ. මෙම ප්‍රදේශයේ සිටින ප්‍රධාන ප්‍රජාවට අයත් අපරාධකරුවන් පලිගැනීමට බිය නොමැති අතර, එමනිසාම ඔවුන් ධෛර්යවන්ත වී සිටී. අනිත් අතට, පහල විවිධත්වය උත්පාදනය කරන සංකල්පයකි ක්‍රියාශීලී සත්කාර කරන්නා සහ ආගන්තුකයා (.යදිඑ-ටමිෑඑ. ]හබ්පසජ) සංකල්පය. මෙහි ප්‍රධාන ප්‍රජාව සත්කාර කරන්නන් වශයෙන් මෙම ප්‍රදේශයේ පෙනීසිටි අතර, සුලු ප්‍රජාව ආගන්තුකයින් ලෙස පෙනීසිටි. සුලු ජාතික ප්‍රජාව මෙම සැකසුමහි ප්‍රතයක්ෂ සීමාව අභිබවා ගියවිට, සන්දර්භය නැතහොත් ඒ පරිසරය සත්කාරකයා-බලෙන් ඇතුලුවන්නා (.යදිඑ-සබඑරමාැර.) සංකල්පයට මාරුවිය හැකිය. තර්ජන, තැතිගැන්වීම් සමග දරුණු පහරදීම්, සහ වරින්වර සිදුවන පහරදීම් හෝ දේපල විනාශකිරීම් පසුව සිද්ධ වේ. මේ අතරතුර, විශාල වශයෙන් වෙනස්වූ ප්‍රදේශයන්ට වෙනස් විදියේ ප්‍රශ්නවලට මුහුණදීමට සිදුවේ. එවැනි ප්‍රදේශවල සාපේක්ෂ වශයෙන් දරුණු ප්‍රචණ්ඩත්වයන් සුලු වශයෙන් දකින්න පුලුවන්. තවදුරටත්, දැනට සිටින දේශීය වටපිටාවේ ප්‍රතිඵලයක් ලෙස සමහර ජාතිවාදී වැරදි ක්‍රියාමාර්ග නිසා, ඔවුන් දරුණු ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට සිදුවිය හැකියි. හදිසියේ ඇතිවන සිදුවීමක් සමග සංවිධානාත්මක කණ්ඩායම්වල පෙළඹවීම උඩ එවැනි හදිසි දරුණු ප්‍රචණ්ඩත්වය මතුවීමට අවශ්‍ය තත්වය ඇතිකරන්න පුලුවන්. ග්‍රෑන්ඩ්පාස් සහ අලුත්ගම සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා පැහැදිලිවම පෙන්නුම් කරනවා ප්‍රාදේශිය/ස්ථානීය වශයෙන් සිදුවූ නොසන්සුන් ගතිය දරුණු ප්‍රචණ්ඩත්වයක් දක්වා පැතිර ගියේ වෛරී කණ්ඩායම් විසින් කරන ලද හදිසියේ මතුවූ සිදුවීම් නිසා බවයි.

තුන්වනුව, නම්‍යශීලී ව්‍යවස්ථානුකුල සහ නීතිප්‍රකාර රාමුව එක පැත්තකින්ද, පසුගිය රජයේ සහ වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශන මගින්ද, ආගමික ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සඳහා රැකවරණ රාමුවක් සලසා තිබේ. විශේෂයෙන් නිදන්ගතවූ ප්‍රචණ්ඩත්වයන් වැලැක්වීමටයි. වර්තමාන රාමුව තුල ඇති මූලික ප්‍රශ්නය නම් නීතිය බලගැන්වීමයි. මෙරටේ ආගමික නිදහස ගැන ඇති සවිස්තර නීති විද්‍යාත්මක අධ්‍යයන මගින්, ආගමික නිදහස ආරක්ෂා කිරීමට සහ වැඩිදියුණු කිරීමට අධිකරණ කැමැත්ත නොමැතිකම බව අනාවරණය කරයි. මේ අතරතුර පශ්චාත් යුද්ධ කාලපරිච්ජෙදය තුලවූ ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ කතාන්දර, නීතිය බලාත්මක කරන බලධාරින්ගේ අක්‍රියභාවය පෙන්වන පොදු ලක්ෂණයක් විය.

සිවුවනුව, ආගමික ප්‍රචණ්ඩත්වයන් සිදුවන සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භයන් තුලින් කරන විශ්ලේෂණයෙන්, රටේ ඇති සමහර පොදු වැරදි මාර්ගයන් හෙලිකරයි. සුලු ආගමික කොටස්වලට විරුද්ධව දරුණු ප්‍රචණ්ඩත්වයන් වරින්වර සිදුවන්නේ සුවිශේෂිත ප්‍රජාවක් තුල එක් තැනක් කරා යන සන්දර්භානුගත කරුණු උඩ සිදුවන :යදිඑ-සබඑරමාැර ]හබ්පසජ- සත්කාරකයා-බලෙන් ඇතුලුවන්නා සංකල්පයයි. කොහොම නමුත්, 2013 සහ 2014 වසරවලදී සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්වයන් ගැන දැක ඇති සංඛ්‍යාත්මක උදාහරණයනට වඩා, විශේෂිත ප්‍රාදේශිය වශයෙන් සිදුවූ ප්‍රචණ්ඩත්වයන් ඇවිස්සීම වඩා නිවැරදියි සන්දර්භානුගත කරුණුවලට වඩා. මෙම සංකීර්ණ සන්දර්භානුගත වටපිටාව, නීති බලාත්මක කිරීමේ සහ ආයතනික ප්‍රතිසංස්කරණයයෙන් ඔබ්බට ගිය ප්‍රවේශයක් අවශ්‍ය කරයි. මෙලෙස තීරණාත්මකවූ මෙම ප්‍රාදේශිය සන්දර්භයන් නිරාකරණයකට යාමට හාරා අවුස්සයි. ඒවා අවසානයේදී ප්‍රජා මට්ටමින් සොයාගෙන ක්‍රියාත්මක කරයි.

අවසාන වශයෙන්, ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ පවත්වා ගනිමින් ආගමික වෛරය සහ ප්‍රචණ්ඩත්වයට විරුද්ධව ක්‍රියාකිරීමට සමාජ මාධ්‍ය උපකාරීවුනා. සමාජ මාධ්‍යය නිසැකයෙන්ම දෙපැත්ත කැපෙන කඩුවකි. අනිත් අතට අපි වෛරී කථාවන් වරින්වර සමාජ මාධ්‍ය ඔස්සේ සම්ප්‍රේෂණය කරයි/ප්‍රචාරය කරනු/ දකිනු ලබයි. කෙසේ නමුත් එය සීමා නොකල නාලිකාවයි. එමගින් රජය විසින් අනුග්‍රහය දක්වන ආගමික පහරදීම් වාර්තාකරයි. අනිත් අතට පොදු ජනයාට මෙසේ සිදුවන පහරදීම් ගැන දැනුම්දිය හැකිය. ඉන් ක්ෂණික විරෝධයක් මතුකල හැකිය. තවදුරටත්, සමාජ මාධ්‍යය කරළියන් ප්‍රතිවිරුද්ධ පණිවුඩ යැවීමට ඉතා තීරණාත්මකයි,

පොදු ඩොමේන් (public domain) වල ගොඩනැගී ඇති වෛරී කථාවන් නිෂ්ක්‍රිය කිරීමට එමගින් පිටිවහලක් සපයයි.

මෙම අධ්‍යයනය, එමනිසා සොයාගත් කරුණු අනුව කිසියම් මැදිහත්වීමක් ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සිවිල් සමාජය විසින් සලකා බැලිය යුතු බවට යෝජනා කරයි. පළමුවෙන්, වෛරී කථාබහ සම්බන්ධ නීති තදින්ම බලාත්මක කිරීම ඉතා වැදගත් වන්නේ ඉන් දරුණු ප්‍රචණ්ඩත්වයේ ප්‍රධානතම අංගයක් වූ වෛරී කණ්ඩායම් විසින් කරන පෙළඹවීම් ඉවත්කිරීමට හැකිවීමයි. දෙවනුව, ආයතන, ආගමික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමට සහ ආගමික නිදහස වැඩිදියුණු කිරීමට නීති බලගන්වන ආයතන සහ අධිකරණය සවිබලගැන්වීම සහ ඒවාහි ධාරිතාවයන් වැඩිකිරීම අත්‍යාවශ්‍ය වේ. තුන්වනුව, දරුණු ප්‍රචණ්ඩත්වයට භාජනය විය හැකි ප්‍රදේශ ලෙස හඳුනාගත් තැන්වලට, විශේෂයෙන් අඩු විවිධත්ව මට්ටමක සිටින සහ අඩු සුලුජාතීන් සංඛ්‍යාවක් සිටින ප්‍රදේශවලට ප්‍රජාව මූලික කරගත් කල් ඇතිව දැනුම්දීමේ ක්‍රමයක් සංවර්ධනය කලයුතු වේ. හතරවනුව, මැදිහත්වීමේ අරමුණ සාමය ගොඩනැගීමේ සහ මානව හිමිකම් අධ්‍යාපනය ඉතා වැදගත් වෙනවා. ක්‍රියාශීලී සත්කාර කරන්නා සහ ආගන්තුකයා ‘host-guest’ dynamic සංකල්පය ගැන වන කථාබහ වෙනස්කිරීමට එමගින් වරින්වර සිදුවන ආගමික නොඉවසීමට හා ප්‍රචණ්ඩත්වය ඇතිවීමට මුක්කු ගසයි. අවසාන වශයෙන්, අත්‍යාවශ්‍ය දෙයක්වූ සමාජ මාධ්‍යයේ විෂය ක්ෂේත්‍රය ශක්තිමත්ව ආරක්ෂා කර ඇත. රජය විසින් ප්‍රධාන මාධ්‍යයන් පාලනය කරන විට, විශේෂයෙන් දරුණු ප්‍රචණ්ඩත්වයක් තිබෙන විට මෙම විෂය ක්ෂේත්‍රය තොරතුරු නාලිකාවන් රඳවා තබාගැනීමට ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනය ඒ අනුව නිර්මාණය කිරීමේදී, මැදිහත්වීමේදී, නිවාරණය කිරීමේදී සහ සුව කිරීමේදී ස්වභාව ධර්මයේ වැදගත්කම තේරුම්ගැනීම සහ ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වයේ සන්දර්භය/ස්වභාවය තේරුම්ගැනීම අවධාරණය කරනවා.

**ප්‍රචණ්ඩත්වය රෝගයක් වේ, ඒ රෝගය එය භාවිතාකරන හැම කෙනෙක්ම එයට හේතුව නොසලකා දූෂණයට ලක්කරයි.**

ක්‍රිස්ටෝපර් ලින් හෙඩ්ජස්
ගත්කතුවර, මාධ්‍යවේදි සහ සමාජ ක්‍රියාකරු

**Violence is a disease, a disease that corrupts all who use it regardless of the cause**

Christopher Lynn Hedges
Author, Journalist and Activist

හැඳින්වීම

දශක තුනක් තිස්සේ පැවති යුද්ධය 2009 මැයි මාසයේදී අවසන්වීමත් සමගම රටේ පවතින ජනවාර්ගික සහ ආගමික ප්‍රචණ්ඩත්වය නැවැත්වීමට හැකිවේ යන බලාපොරොත්තුව වැඩිවී ඇත. තවමත් පශ්චාත් යුද්ධ කතිකාවත් මගින් ජනවාර්ගික ජාතිත්වය පුනර්ජීවනය (resurgence) වැඩිකර ඇති අතර එමගින් දේශපාලනය හඳුනාගැනීමට හැකිවේ.[1] මෙම දේශනයන් අදත් කලබලකාරී තත්වයන් සහ වැරදි පාරක් ඇතිකර ඇති අතර එමගින් පෝෂණය කල පරිසරය නිසා ආගමික සුලුතරයක්වූ පිරිස්වලට ඒවායින් සිදුවිය හැකි දඩුවම් ගැනද නොසලකා පහරදීම් සිදුවී ඇත.

ප්‍රචණ්ඩත්වය එහි ඇති බහුවිධ ස්වභාවය නිසා ඉතාමත් සංකීර්ණ මෙන්ම ඒ පිළිබඳ නිර්වචනය කිරීම ද ඉතා අපහසුවේ.[2] මෙම නිර්වචනය සඳහා න්‍යායත්මක සහ ප්‍රායෝග සිද්ධි අධ්‍යයනවලදී පුලුල් අවධානයක් ලැබී ඇත. එහෙත් මේ පිළිබඳව නිශ්චිත පරාමිතියක් සඳහා පොදු එකඟතාවයකට ද එළඹී නොමැත. ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රචණ්ඩත්වය නිර්වචනය කර ඇත්තේ චේතනාත්මකව භෞතික හෝ ශරීර බලය යොදාගැනීම, තර්ජනය කිරීම හෝ සත්‍ය වශයන් තව කෙනෙකුට, කණ්ඩායමකට හෝ ප්‍රජාවකට විරුද්ධව කටයුතු කිරීම. එසේම ඉන් විය හැකි තුවාලවීම්, මරණය, මානසික හිංසාව, අනර්ථය, කුවර්ජනය නැතහොත් වියෝගයයි.[3]මේ දක්වා ප්‍රඩණ්ඩත්වය නිර්වචනය කිරීමට සමහර න්‍යායාචාරීන් භෞතික නොවන සහ ව්‍යුහාත්මය ආකාරය ඇතුලත් කිරීමට ස්ථිර ලෙසම කියා සිටී. රැල්ෆ් ටැනර් සාකල්ප/සමුදාය ප්‍රවේශය (holistic) නිර්වචනය භෞතික එකකට සීමාකරන්න බැරිබවට තර්ක කරයි. නමුත් බලහත්කාරයෙන් පෞද්ගලික නිදහසට මැදිහත්වීම, සාහසික හෝ සරාගීව හැසිරීම හෝ භාෂාව යොදාගැනීම මෙන්ම අවසාන වශයෙන් රාගය දනවන හෝ උන්මාදයට පත්වීම යන්නද එසේම එයට ඇතුලත් කල හැකි බව කියයි.[4] මේ අතරතුරල ජොහාන් ගල්තුන් (’structural violence’) ‘ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය’. යන කරුණ ගැන සඳහන් කරමින් දක්වන්නේ සමාජ ව්‍යුහය හෝ සමාජ ආයතන මිනිසුන්ට ඔවුන්ගේ ප්‍රධාන අවශ්‍යතා සපයාගැනීම මගහැරීම මගින් ඔවුන්ට හානිකරන බවයි.[5] වෙනස් ලෙස සැලකීමේ (Discriminatory) පුරුදු, සම්ප්‍රදායික ලෙස, භෞතික නැතිනම් ශාරීරික හෝ ශාරීරික නොවන ප්‍රචණ්ඩත්වය ගණනට නොවැටුන ද එය ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය ගණනට වැටියහැක. මෙම අධ්‍යයනය විශේෂිතව යොමුවී තිබෙන්නේ ආගමික සුලු කණ්ඩායම් කෙරෙහි එල්ලවන ප්‍රචණ්ඩ ක්‍රියා කෙරෙහිය. මේ අතරතුර පාරිභාෂික ශබ්දමාලාව පිළිබදව මතභේද තිබුණ ද, මෙම අධ්‍යයනයේදී ආගමික ප්‍රචණඩත්වය සඳහා පුලුල් නිර්වචනයක් යොදාගෙන ඇත. එයට ඇතුලත් වන්නේ ශරීරික, ශරීරික නොවන සහ තරමක් දුරට ව්‍යුහාත්මක දෘෂ්ටියෙන් බැලීමය.

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය විමසා බලයි. එසේම එය ආගමික පහරදීම් වර්ගීකරණය කිරීම ගැනත් මෙම පහරදීමට සම්බන්ධ පුද්ගලයින් ගැනද සාකච්ජා කරයි. එසේම, සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන නැඹුරුව හේතුවෙන් ආගමික ප්‍රචණ්ඩත්වය සිදුවිය. මේ ක්‍රියාවලියේදී මෙම අධ්‍යයනය උත්සාහ ගන්නේ ආගමික ප්‍රචණ්ඩත්වය, එහි ස්වභාවය සහ එහි නැඹුරුව අනුව වළක්වා ගැනීම නැතහොත් (deconstruct) බිඳදැමීමය. මෙම අධ්‍යයනයේ විශ්ලේෂණයට අනුව ඉතාමත් වැදගත් හැඩයක් ගත් ප්‍රචණ්ඩත්ව දෙවර්ගය වන්නේ ‘chronic’ නැතිනම් ආවේණිකවූ අඩු-තීව්‍රතාවක් ඇති

---

[1] ‘Reconciliation, Ethnic Cohesion and Peace-Building’, *International Centre for Ethnic Studies: Research Paper No: 8*, June 2013.

[2] Willem de Haan, ‘Violence as an Essentially Contested Concept’ in Sophie Body-Gendrot & Pieter Spierenburg (eds.), *Violence in Europe: Historical and Contemporary Perspectives* (2008), at 28.

[3] World Health Organisation, *WHO global consultation on violence and health* (1996), at 4, cited in World Health Organisation, *Global status report on violence prevention 2014* (2015), at 2.

[4] R.E.S. Tanner, *Violence and religion: Cross-cultural opinions and consequences* (2007), at 5.

[5] Johan Galtung, ‘Violence, Peace, and Peace Research’ (1969) 6(3) Journal of Peace Research 167-191.

කාලයක් තිස්සේ පවතින ප්‍රචණ්ඩත්වය, සහ 'acute' නැතිනම් 'දරුණුවූ' කොටස් වශයෙන් එන (episodic forms) තනිව සිදුවන (sporadically) ප්‍රචණ්ඩත්වයයි.

මෙම අධ්‍යයනය කොටස් පහකින් ඉදිරිපත් කරඇත. පළමු කොටස මගින් ශ්‍රී ලංකාවේ ආගමික නිදහසට අදාළවන සමස්ත නෛතික සහ ආයතනික රාමුව පිළිබඳව පිරික්සයි. එය තවදුරටත් ස්වදේශීය සහ ජාත්‍යන්තර නීති, ප්‍රතිපත්ති සහ ආගමික පහරදීම් වැලැක්වීමට ගන්නා ක්‍රියාවලින්හි භාවිතය මෙන්ම ඒවාට සම්බන්ධ අපරාධකරුවන්ට විරුද්ධව චෝදනා ගොනුකිරීමද විශ්ලේෂණය කරනු ඇත. දෙවන කොටස විස්තරාත්මක වන අතර එහිදී ආගමික පහරදීම් සහ අපරාධකරුවන් පිළිබඳව දක්වා ඇත. මෙම කොටසේම ශ්‍රී ලංකාවේ ආගමික පහරදීම් සංඛ්‍යාත්මකව සහ ජනවිකාශන සිතියම් මගින්ද ඉදිරිපත් කරඇත. තුන්වන කොටස යොමුකර ඇත්තේ ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය සිදුවන සන්දර්භය නැතහොත් නැඹුරුව, සහ සමාජ සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන නැඹුරුව විශ්ලේෂණය කිරීමටය. මෙම කොටසින්, ප්‍රධාන වශයෙන් මේ රටේ සිදුවන ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවලට පැහැදිලිව මූලික වශයෙන් හේතුවන කරුණු ගැන පැහැදිලි කරන අතර, නිවැරදිව තේරුම්ගත් සමාප්තිය සඳහා ප්‍රධාන වශයෙන්ම සිදුවිය හැකි හේතූන් දැක්විය නොහැකිය. හතරවන කොටසින් ප්‍රචණ්ඩත්වය සහ එය හා බැඳුණු කරන කියන කතාබහ වැඩිදියුණු කිරීමට සමාජ ජාල මාධ්‍යයන් සහ ජනමාධ්‍යයන් විසින් කරන ක්‍රියාදාමය විශ්ලේෂණය කරයි. සමාප්තිය කොටසින් පසුව ශ්‍රී ලංකාවේ ආගමික නිදහස සහ ආගමික ප්‍රචණ්ඩත්වයට හේතුවන ප්‍රධාන කරුණු සහ නිර්දේශයන් ඉදිරිපත් කරයි. මෙම නිර්දේශයන් දිගටම පැවතිය හැකි රැකවරණය සහ ආගමික සහජීවනය වැඩිදියුණු කිරීමට සහ අනාගතයේදී සිදුවිය හැකි ආගමික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට හා ලිහිල් කිරීමට උපකාරී වේ.

## 1. නෛතික, ප්‍රතිපත්තිමය සහ ආයතනික රාමුව

මෙම කොටසින් ආගමික නිදහස සහ ආගමික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට යොදාගන්නා නෛතික, ප්‍රතිපත්ති සහ ආයතනික රාමුව පිළිබඳව පරීක්ෂාකර බලයි. මෙම කොටස තවදුරත් මෙම විෂයයට අදාල නෛතික, ප්‍රතිපත්ති සහ ආයතන පිළිබදව සාකච්ජා කරයි. එසේම නිතිමය රැකවරණ රාමුවේ දැනට තිබෙන හිදැස් අනාවරණය කිරීමට අපේක්ෂා කරයි.

### 1.1 ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ යහපත් භාවිතයන්

ආගමික නිදහස විවිධ ජාත්‍යන්තර ගිවිසුම්වල හඳුනාගෙන තිබේ. මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයේ (Universal Declaration of Human Rights (UDHR) ) 18 වෙනි වගන්තියේ ඉඩ සලසනවා 'හැම කෙනෙකුටම තමන්ගේ අදහස් ප්‍රකාශකිරීමේ, හෘද සාක්ෂිය සහ ආගම ගැන ඇති අයිතිය' ගැන.[6] එසේම සිවිල් සහ දේශපාලන අයිතිය පිළිබද ප්‍රතිඥාවේ (International Covenant on Civil and Political Rights (ICCPR))18 වෙනි වගන්තියේ සඳහන් වී තිබෙනවා 'පුද්ගලයාගේ ආගමික නිදහස' ලෙස ආගමක් හෝ විශ්වාසයක් ඔහුගේ කැමැත්ත අනුව තෝරාගැනීමට ඇති නිදහස, සහ පුද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ අනිත් අය සමග ප්‍රජාවක් විදියට ඔහුගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමට, වැඳීමට, පිළිවෙත් කිරීමට, භාවිතා කිරීමට සහ ඉගැන්වීමට ඇති නිදහසද එයට ඇතුලත් කර තිබේ.[7]මෙම ප්‍රතිඥාවේ තවදුරටත් සඳහන් කර තිබෙන ආකාරයට ආගමික නිදහසට යම් සීමාවක් තිබේනම් එය සිදුවිය යුත්තේ නීතියට අනුව පනවා ඇති අයුරින් වන අතර, ඒවා පොදුජන ආරක්ෂාව, නීතිය හා සාමය රැකීමට, සෞඛ්‍යය හෝ ආචාරවිධි හෝ මූලික අයිතිවාසිකම් සහ අනෙකුන්ගේ නිදහස වෙනුවෙන්ය. ජාත්‍යන්තර නීතියේ ප්‍රතිෂ්ඨාපිත කරඇති[8] ආකාරයට ආගමක් පිළිගැනීම, ආගමික විශ්වාස වැළඳගැනීම එක පැත්තකින් සහ ආගමික විශ්වාසයන් ප්‍රකාශකිරීමට ඇති නිදහස අනිත් පැත්තකින්ද, ආගමික නිදහසට ඇතුලත් වේ.ශ්‍රී ලංකාව මෙම නිතිමය රාමුවට පාර්ශවකරුවෙක් වන අතර එබැවින් ආගමික නිදහස රැකගැනීමට සහ වැඩිදියුණු කිරීමට ජාත්‍යන්තරව බැඳීසිටී.

සිවිල් සහ දේශපාලන අයිතිය පිළිබද ජාත්‍යන්තර ප්‍රතිඥාවේ (ICCPR) සඳහන් වන සාමාන්‍ය ආගමික නිදහස රැකබලාගැනීම, ඊට පසුව ඇතිකරන ලද කිසිදු ගිවිසුමකට අන්තර්ගත කර නොමැත. (Carolyn Evans) කැරොලින් එවන්ස් තර්ක කරන ආකාරයට එවැනි ගිවිසුමක් සකස් කිරීමට ප්‍රමාණවත් තරම් ජාත්‍යන්තර පොදු එකඟතාවයක් හෝ දේශපාලන අභිප්‍රායක් තිබී නැත.[9] 1981 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, සියළුම ආකාරයේ අසහනයන් බැහැරකිරීමට සහ ආගමික විශ්වාස මත ඇතිවී තිබෙන අසමානව සැලකීම පිළිබඳව ප්‍රකාශයක් සම්මත කරගන්නා ලදී.[10]1993 දී තවදුරටත්, ඊට පසුව සියළුම ආකාරයේ අසහනයන් ඉවත් කිරීමට යෝජනාවක් සම්මත කරගත්හ.[11] කෙසේ වුවද මෙම මෙවලම් ජාත්‍යන්තර ගිවිසුම් මගින් බැඳීම් කරනැත. ඒවා ආගමික නිදහස තවදුරටත් විස්තර කරදීමට යොදාගන්නා ලදි. උදාහරණයක් වශයෙන් 1981 ප්‍රකාශනයෙන් පහත සඳහන් විශේෂිත අයිතිවාසිකම් නිගමනයන් ලෙස සිතීමට ඇති නිදහස, හෘද සාක්ෂිය සහ ආගමික හෝ විශ්වාසයන් විදහා පෙන්වා ඇත.

---

[6] Article 18, UN General Assembly, Universal Declaration of Human Rights, 10 December 1948, 217 A (III).

[7] Article 18(1), UN General Assembly, International Covenant on Civil and Political Rights (ICCPR), 16 December 1966, United Nations, Treaty Series, vol. 999, at 171.

[8] Article 18(3) ICCPR.

[9] See Carolyn Evans, *Legal Aspects of the Protection of Religious Freedom in Australia* (2009); Carolyn Evans, 'Time for a Treaty? The Legal Sufficiency of the Declaration on the Elimination of All Forms of Intolerance and Discrimination' (2007) Brigham Young University Law Review 617, 625–7

[10] UN General Assembly, Declaration on the Elimination of All Forms of Intolerance and of Discrimination Based on Religion or Belief, 25 November 1981, A/RES/36/55.

[11] UN General Assembly, 'Elimination of all forms of religious intolerance', G.A. res. 48/128, 48 U.N. GAOR Supp. (No. 49) at 247, U.N. Doc. A/48/49 (1993).

a) වැඳුම් පිදුම් කිරිමට හෝ ආගමික හෝ විශ්වාස පිළිබඳව එකතුවීමට, ස්ථානයක් පිහිටුවීම සහ එය මේ කටයුතු සඳහා නඩත්තු කිරීම;
b) සුදුසු පුණ්‍යාධාර හෝ මානවවාදී ආයතන පිහිටුවීම සහ නඩත්තුකිරීම;
c) ආගම් හෝ විශ්වාසයන්ට සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර සහ වෙනත් සිරිත් විරිත් ගැන සඳහන් අවශ්‍ය ලිපි ලේඛන සකස් කිරීම, ඒවා අත්පත් කරගැනීම සහ සුදුසු පරිදි තපරිශීලනය කිරීම;
d) මෙම ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශනයන් ලිවීම. ප්‍රකාශයට පත්කිරීම සහ විසුරුවා හැරීම;
e) මේ කාරණය සඳහා සුදුසු ස්ථානවල ආගම හෝ විශ්වාසය පිළිබඳව ඉගැන්වීම;
f) පුද්ගලයින්ගෙන් සහ ආයතනවලින් ස්වේඡාවෙන් ලබාදෙන මූල්‍යමය හා වෙනත් ආධාර ඉල්ලා සිටීම හෝ ලබාගැනීම;
g) ඕනෑම ආගමක හෝ විශ්වාසකට අවශ්‍යතාවයන් අනුව සහ ප්‍රමිතීන් අනුව, පුහුණු කිරීමට,පත්කිරීමට, ඡන්දයෙන් තෝරාගැනීමට හෝ සුදුසු නායකයින් විසින් නම්කිරීමට;
h) යම් ආගමක හෝ විශ්වාසයක ශික්ෂාපදයන් අනුව විවේක දිනයන් පිළිපැදීම සහ නිවාඩු දිනයන් හා ආගමික උත්සව සැමරීම සහ;
i) ආගම් සහ විශ්වාසයන් සම්බන්ධව ජාතික තලයේ සහ ජාත්‍යන්තර තලයේදී පුද්ගලයින් සහ ප්‍රජාවන් සමග සන්නිවේදනයන් ස්ථාපිත කිරීම සහ නඩත්තු කරගෙනයාම.

මේ අතරතුර, එක්සත් ජාතින්ගේ (UN) මානව හිමිකම් කමිටුව විසින් නිකුත්කල අංක 22 දරණ පොදු ප්‍රකාශය මගින්, ICCPR 18 වන වගන්තියේ සහතික කල ආගමික නිදහස තවදුරටත් අර්ථකතනය කර ඇත.[12] මෙම සාමාන්‍ය ප්‍රකාශය අවම වශයෙන් කරුණු දෙකක් මත ඉතා වැදගත් වේ. පළමු කරුණ වන්නේ 18 වන වගන්තියේ දේවවාදී සහ දේවවාදී නොවන විශ්වාසයන් පිළිගැනීම මින් තවදුරටත් සහතික කරතිබ්මය. දෙවැනි කරුණ වන්නේ ආගමික නිදහස නීතිමය වශයෙන් සීමාකරන ආකාරය පිළිබඳ උපදේශ මාලාවක එහි පැහැදිලිව දක්වා තිබීමය.සාමාන්‍ය ප්‍රකාශයට අනුව ආගමක් වැළඳගැනීම, ආගමක් පිළිගැනීම, ආගමික නිදහස පිළිබඳ අභ්‍යන්තර ස්වරූපය යන කරුණු ගැන කිසිවකුට මැදිහත්විය නොහැකිය. මෙම අන්දමේ නිදහස පරම නිදහසවේ. කෙසේ නමුත්, ආගමක් හෝ විශ්වාසයන් පැහැදිලිව දැක්වීමේ අයිතිය, නියම කරන ලද හේතුන් මත, අන්‍යයන්ට නිදහසට ඇති අයිතියද ඇතුලත්ව සමහරවිට සීමාකල හැකිවේ. එය කෙලින්ම සම්බන්ධවූ ඔවුන් කියාපාන විශේෂිත අවශ්‍යතාවට සමානපාතිකවූ දෙයක් නම් මෙවැනි සීමාකිරීම් වලට ඉඩදිය හැකිය.[13]

ආගමික නිදහස ඵලදායි ලෙස යොදාගැනීමට අත්‍යාවශ්‍යවූ තත්වයන් නම් වෛරී කථනයන්ගෙන් රැකවරණය සහතික කිරීමයි. සියලුම ආකාරයේ ජාතිවාදී වෙනස්ලෙස සැලකීම් ඉවත්කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය (The International Convention on the Elimination of all Forms of Racial Discrimination. (CERD)[14]වෛරී කථනයන්ට එරෙහි පළමු ජාත්‍යන්තර ගිවිසුමවේ. ගිවිසුමේ 4(a) හි අනුව වෛරී කථනය'hate speech' යන පුළුල් අර්ථකථනයට ඇතුළත් ක්‍රියාකාරිකම් හතරක් දක්වාඇත:

a. ජාතියක් ශ්‍රේෂ්ඨත්වයෙන් උසස් යන මතය අනුව ප්‍රචාරණය කිරීම
b. ජාතිවාදී වෛරය පාදක කරගෙන ප්‍රචාරණය කිරීම
c. ජාතිවාදීව වෙනස්කර සැලකීමට පෙළඹවීම
d. ජාතිවාදීව උසිගැන්වූ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම.[15]

---

[12] UN Human Rights Committee, CCPR General Comment No. 22: Article 18 (Freedom of Thought, Conscience or Religion), 30 July 1993, CCPR/C/21/Rev.1/Add.4).
[13] *Ibid.* at para.8.
[14] UN General Assembly, International Convention on the Elimination of All Forms of Racial Discrimination, 21 December 1965, United Nations, Treaty Series, vol. 660, at 195.
[15] Also see CERD Committee, General Comment No. 15 of 23 March 1993.

CERD ගිවිසුම ආගමික කණ්ඩායම් ඉලක්ක කරගත් වෛරී කථනයන් පිළිබඳව කෙලින්ම කටයුතු නොකරයි. කෙසේ නමුත්, ICCPR හි 20(2) වගන්තියෙන් සලසා තිබෙන ආකාරයට:

> දේශීය, ජාතිවාදී හෝ ආගමික වශයෙන් වෛරයට පත්කිරීමට පෙළඹවීමට පක්ෂව කතාකිරීම මෙන්ම වෙනස්කර සැලකීමට, එදිරිවාදිකම් හෝ ප්‍රචණ්ඩත්වය නීතියෙන් තහනම් කලයුතුයි (අවධාරණය එකතුකර).

මෙසේ CERD වල සඳහන් පුළුල් ප්‍රතිපත්ති ICCPR හරහා පුළුල් කරඇති අතර එමගින් සුවිශේෂ ආගමික කණ්ඩායමක් ආමන්ත්‍රණය කිරීම ඉලක්කකර ඇත. (advocacy of hatred) ‘වෛරයට අනුබලදෙනවා’ යන වචනය නිත්‍ය වශයෙන්ම අර්ථකථනය කරඇත්තේ එවැනි වෛරකිරීම් උසිගැන්වීමටය.[16] එමනිසා, මහත් ඕනෑකමින් කරන මෙය වෛරයෙන් කරන කතාබහ ලෙස සැලකීම, එසේම කථිකයා ඔහුගේ කතාවෙන් වෛරය වැඩිදියුණු කිරීමට අනුබලදීමත්, වෙනස්කර සැලකීමට උල්පන්දම් දීම, එදිරිවාදිකම් හෝ ප්‍රචණ්ඩත්වය, ඉන් අදහස් වේ. මෙම අර්ථ දැක්වීමේ රාමුව ඉතා වැදගත් වේ. ඉන් නිරූපණය කරන ප්‍රභේදය හෝ සමාන වර්ගය, වෛරී ව්‍යාපාරය හෝ ප්‍රචාරක කටයුතු ආදිය මෙම අධ්‍යයනයේ ඊලග අදියරේදී සාකච්ජා කරයි.

එක්සත් ජාතින්ගේ (UN) මානව හිමිකම් කමිටුව නිකුත්කල අංක 22 දරණ සාමාන්‍ය ප්‍රකාශය විශේෂයෙන් වෛරී කථනයන් යන කරුණට අදාල වේ. එය තවදුරටත් සුලු ආගමික කොටස් ආරක්ෂා කිරීම රජයට අයත් කාර්යයක් ලෙස විස්තර සහිතව දක්වා ඇත. එය තවදුරටත් ICCPR හි 20(2) වගන්තියෙන් විස්තර වේ. තවද එහි අන්තර්ගත ආකාරයට :

> [I] සුළු ආගමික කොටස්වල අයිතිවාසිකම් උල්ලංඝණය/කඩකිරීම කිරීම්වලට විරුද්ධව ක්‍රියාකාරීවීම හා ඒවා ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ. එසේම අනිකුත් ආගමික කණ්ඩායම්වලද 18 සහ 27 වගන්තිවලින් සහතික කරඇති අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ මෙම කණ්ඩායම් කෙරෙහි එල්ලවන ප්‍රචණ්ඩක්‍රියා හෝ හිංසාකිරීම්/වදදීම් වලින් ආරක්ෂා කිරීමයි.[17]

මෙසේ, ආගමික කරුණු මත පෙළඹවීමෙන් සිදුවන ප්‍රචණ්ඩත්ව ක්‍රියාවලින් සුළු ආගමික කොටස් ආරක්ෂා කිරීම රජය සතු විශේෂිතවූ හා අත්‍යාවශ්‍යයෙන්ම කලයුතු දෙයක් ලෙස බැඳිසිටී.

වෛරී කථනයන් තහනම් කිරීම මෙම බැඳී සිටීමේ කොටසක් වේ. සමහර අධිකරණ බලසීමාවන් වෛරී කථනයන් ගැන ඇති ජාත්‍යන්තර ප්‍රමිතින් ඉක්මගොස් සහ තවදුරටත් ප්‍රචණ්ඩත්වය අවුස්සන කතා තහනම් කර ඇත. උදාහරණයක් වශයෙන්, අමෙරිකා එක්සත් ජනපදයේ (U.S.), පෙළඹවීමට පත්වන, වෙනස්කර සැලකීමට පත්වන වෛරී කථනයන් හෝ එදිරිවාදිකම් පමණක් තහනම් කර නැත. කෙසේ නමුත්, අමෙරිකා එක්සත් ජනපද ව්‍යවස්ථාව අනුව කතාවන් මගින් ප්‍රචණ්ඩත්වය ඇවිස්සීමට බලාපොරොත්තුවන හා අවුස්සන හෝ යන දෙකම ආරක්ෂා කර නැත.[18]

---

[16] See for example, *Faurisson v. France*, UN Human Rights Committee, Communication No. 550/1993 (1996), individual opinion of Elizabeth Evatt and David Kretzmer, co-signed by Eckart Klein, at para.9.

[17] CCPR General Comment No. 22, *op. cit*. at para.9. Article 27 of the ICCPR provides: ‘මෙම රාජ්‍යයන්වල ජනවාර්ගික, ආගමික හෝ භාෂාමය අතින් වෙනස්වූ සුලු ජාතින් සිටින අතර, එම සුලු ජාතිකයින්ට අයත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් තිබෙන අනෙකුත් සාමාජිකයින් සිටින වෙනත් කණ්ඩායම් අතරද ඔවුන්ගේ සංස්කෘතිය භුක්තිවිඳින අතර ආගම ඇදහීමට, ඔවුන්ගේ භාෂාව පාවිච්චි කිරීමටද අයිතිය ඇත.’

[18] See *Chaplinsky v. New Hampshire* (1942) 315 U.S. 568; *Brandenburg v. Ohio* (1969) 395 U.S. 444; *R.A.V. v. City of St. Paul* (1992) 505 U.S. 377. For a compelling critique of U.S. tolerance of certain types of hate speech, see Jeremy Waldron, *The Harm in Hate Speech* (2012).

සුළු ජාතීන් ප්‍රචණ්ඩ ක්‍රියාවලින් ආරක්ෂා කිරීමට ගන්නා නිවැරදිගැනීම ක්‍රියාමාර්ගයන් පිළිබඳව අංක 22 දරණ පොදු ප්‍රකාශයෙහි පැහැදිලිව සඳහන් කර නැත. එමනිසා, නැවතත් ෂකකජසෘ වල 2:2- වගන්තිය දෙස නැවත හැරී බැලීම ප්‍රයෝජනවත් වේ. ඒ අනුව සුදුසු පියවර ගැනීමට රාජ්‍යයකට තිබෙන පොදු බැඳීම ගැන සහ සම්මුතියෙන් හඳුනාගත් අයිතිවාසිකම් වලට ශක්තියක් ලබාදීම ගැන එහි සඳහන් වෙනවා. ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කල පුද්ගලයින්ට විරුද්ධව සුදුසු ක්‍රියාකාරී පිලියමක් ගැනීමට රාජ්‍යයක් තවදුරටත් බැඳී සිටින බව, සම්මුතියේ 2:3- වගන්ති අනුව, ගිවිසගෙන ඇත. මෙසේ ප්‍රචණ්ඩත්වයට, එය සිදුවී විට *ඵලදායි* ප්‍රතිචාර දක්වීමට සහ වැලැක්වීමට, අනාගතයේදී සිදුවිය හැකි ප්‍රචණ්ඩත්වය *වැලැක්වීම* රාජ්‍යයකට බැදීමක් තිබෙනවා.

එක්සත් ජාතීන්ගේ (UN) මානව හිමිකම් කොමිටිය නිකුත්කල අංක 31 දරණ පොදු ප්‍රකාශය අනුව මෙම බැඳීම් පසුව විස්තර සහිතව දක්වා ඇත. ප්‍රචණ්ඩත්වයට විරුද්ධව දැක්වූ ප්‍රතිචාර අනුව පොදු ප්‍රකාශයෙහි තවදුරටත්, රාජ්‍යයක් විසින් ගතයුතු ක්‍රියාකාරී පිළියම් ලෙස පහත දැක්වෙන දේවල්ද ඇතුලක් වේ.[19]

a. දැනට සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා නවතා දැමීම
b. ස්වදේශීය නීතියට අනුව ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව අයිවාසිකම් කියාපෑමට සුදුසු අධිකරණ සහ පරිපාලන යාන්ත්‍රණයක් පිහිටුවීම
c. නිදහස් සහ අපක්ෂපාත ආයතන මගින් ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව දෝෂාරෝපණයන් හැකි ඉක්මනින් විමර්ෂණය කිරීම
d. වින්දිතයින්ට (to victims) වන්දි සැපයීම, වන්දිගෙවීම, ප්‍රතිෂ්ඨාපනය, පුනරුත්ථාපනය සහ 'measures of satisfaction' සතුටුකිරීමේ වැඩ පිළිවෙළවල් වන, ප්‍රසිද්ධියේ සමාව අයැදීම, ප්‍රසිද්ධියේ අනුස්මරණය කිරීම, අවලංගු-නොකර සිටීම පිළිබඳ සහතිකය සහ අදාල නීතිරීති සහ ව්‍යවහාරයන් වෙනස්කිරීම ඒවාට වේ.

ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ කාරණය සම්බන්ධයෙන් පොදු ප්‍රකාශය මෙසේ සඳහන් කරයි. සම්මුතියේ ප්‍රතිඥාවේ පරමාර්ථ වියයුත්තේ කිසිම බැදීමක් නොමැතිව පරාජය කිරීමයි......... ප්‍රතිඥාවේ සඳහන් ප්‍රචණ්ඩත්ව ක්‍රියා නැවත සිදුවීම වැලැක්වීමට ක්‍රියාමාර්ගයන් ගැනීමයි.. එය තවදුරටත් පැහැදිලි කරන අන්දමට ICCPR හි 2:2- වගන්තිය යටතේ ඇති බැදීම් සුදුසු නොවේ සහ ඉක්මන් ප්‍රතිඵල නොලැබේ. එසේම මෙම බැදීම්වලට එකගවීමට නොහැකිවීම දේශපාලන, සමාජයීය, සංස්කෘතික හෝ ආර්ථික සලකා බැලීම්වලින් කල නිර්දේශයන් යුක්ති සහගත නොවන බව පෙනේ.[20]

UN මානව හිමිකම් කමිටුවේ පොදු ප්‍රකාශය හැරෙන්නට, තේරුම්ගත හැකි එකඟත්වයක් ඇති ආගමික ප්‍රචණ්ඩත්වය වැලැක්විය හැකි ජාත්‍යන්තරව හොඳම පුරුද්ද මෙයයි. ප්‍රාදේශීය මග පෙන්වීම්, කොහොම නමුත් හොදම ව්‍යවහාරයන් මතුවීමට පිළිබඳව ඇළුවීමක් සපයාදෙයි. උදාහරණයක් වශයෙන්, යුරෝපීය සංගමය ආගමික නිදහස හෝ විශ්වාසයන් වැඩිදියුණුකිරීමට සහ රැකගැනීමට උපදෙස් මාලාවක් සපයා ඇත.[21]
මෙම උපදෙස් මාලාව නැවත නැවතත් කිරීම හෙවත් පුනර්වාචනය ICCPR හි සහ එක්සත් ජාතීන්ගේ (UN) මානව හිමිකම් කොමිටියේ පොදු ප්‍රකාශයන් වලද ප්‍රමිතීන් විදහා දක්වයි. ඒවා මානව හිමිකම් ආරක්ෂා කිරීමට, එසේම ආගමික හෝ විශ්වාසයන් දරන පුද්ගලයින්ට විරුද්ධව කරන ප්‍රචණ්ඩත්ව ක්‍රියාවල යෙදෙන්නන්ට විරුද්ධව දඬුවම් කිරීමට, ඒවා කිරීම වැලැක්වීමට, විමර්ශනය කිරීමට කාර්යක්ෂමව කටයුතු කිරීමට රාජ්‍යයකට අනුග්‍රහ දක්වයි[22]

---

[19] UN Human Rights Committee (HRC), General Comment No. 31 [80], The nature of the general legal obligation imposed on States Parties to the Covenant, 26 May 2004, CCPR/C/21/Rev.1/Add.13, at paras.15-16.
[20] *Ibid.* at para.14.
[21] Council of the European Union, *EU guidelines on the promotion and protection of freedom of religion or belief* (2013).
[22] *Ibid.* at para.29.

මෙම උපදෙස්මාලාව තවදුරටත් රාජ්‍යයකට සියළුම විදියේ ප්‍රචණ්ඩ ක්‍රියාවලට විරුද්ධවීමට සහ සියලුම අපරාධකරුවන් අධිකරණයට ගෙනඒමට උනන්දුකරයි[23] මෙසේ ඇතුලත් කල දේවල් ඒ විදියටම බැඳි සිටිය යුතු දේවල් නොවේ, නමුත් රාජ්‍යය විසින් ගන්නා ක්‍රියාකාරි මාර්ගය අනුව කොහොමද හරියටම ආගමික ප්‍රචණ්ඩත්වය පිළිකුල් සහගත දෙයක් ලෙස අවධාරණය කෙරේ. ප්‍රසිද්ධියේ කරන දෝෂාරෝපණය ගැන අවධාරණය කිරිම මෙන්ම ඒ ගැන සිතාබැලිම මගින් රාජ්‍යයක් විසින් කරන පොදු දේශනයන් හැඩගැස්වීමට සහ ආගමික සහජීවනට වැඩිදියුණු කිරිමට කටයුතු කලයුතු වේ.

ප්‍රචණ්ඩත්වයට විරුද්ධව දෝෂාරෝපණය කිරිම බොහෝදුරට ප්‍රතිචාර දක්වන අතර එය ප්‍රචණ්ඩත්වයට පත්වීමට ඇති ඉඩකඩ වැලැක්වීමට ප්‍රමාණවත් නොවේ. පොදු දේශනයන් හැඩගැස්වීමට ඇති රාජ්‍යයක කාර්යභාරය දෙෂ්ෂාරෝපණයට එහා ගිය එකක් වියයුතුය.

ප්‍රචණ්ඩත්වය සහ සමාජ සංස්කෘතික, ආර්ථික සහ දේශපාලනික සන්දර්භයන් අතර ඇති සම්බන්ධතාවය ඒ අනුව පිළිගතයුතුයගතවදුරටත් ප්‍රචණ්ඩත්වයට හේතුවූ නිදානයට කරුණු සෙවීම ඉතාමත් තිරණාත්මක දෙයක් වුනා. එවැනි ප්‍රචණ්ඩත්වයන් මගහැරීමට, සහ .අන්තර් ආගමික-සාමය ගොඩනැගීම. යන වචනයෙන් වැදගත් හැඩගැසීමක් ජනිත වේ.. ඇමරිකා එක්සත් ජනපදය පාදක කරගත් කරුණාව සහ සාමය ගොඩනැගීමේ මධ්‍යස්ථානය (The Karunawa Centre for Peacebuilding), විසින් ශ්‍රී ලංකාවේ අන්තර් ආගමික-සාමය ගොඩනැගීම සදහා මුලපිරිමක් වශයෙන් පුහුණුකිරිමේ අත්පොතක් නිපදවා ඇත/සකස්කර ඇතග[24] මෙම අත්පොතට සමහර හොඳ පුරුදු පාදක වී ඇත්තේ අන්තර් ආගමික-සාමය ගොඩනැගීමට සහ ආගමික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමයි. එය සාමය ගොඩනැගීමේ ත්‍රිවිධ ක්‍රියාවලියක් ලෙස සලකා එයට කලහැකි මැදිහත්වීම් කළ හැකි සංඛ්‍යාවක් ඇතුළත් 'කරයි.[25]

1. සමාජීය සාමය ගොඩනැගීම
   a.අන්‍යොන්‍ය අවබෝධය සඳහා සංවාද
   b. සංහිදියාව සහ ඉවසිම සදහා වැඩසටහන්
   c.සිතේ ඇතිවන කම්පනය සහ සමාජීය සුවකිරීම සදහා මැදිහත්වීම
   d.සාමය පිළිබද අධ්‍යාපනය

2. ආර්ථිකව සාමය ගොඩනැගීම
   a ආර්ථික උත්තේජන වැඩසටහන්
   b.යටිතල ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම
   c. ආර්ථික ව්‍යාපාර හරහා සාමකාමී සබඳතා වැඩිදියුණු කිරිම

3. දේශපාලනිකව සාමය ගොඩනැගීම
   a ව්‍යවස්ථානුකූල ප්‍රතිසංස්කරණ
   b මාරුවෙමින් පවතින අධිකරණය
   c. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ආයතන තැනීම
   d. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය

එවැනි ක්‍රියාමාර්ගයන් පිළිබිඹු කරනවා මැදිහත්වීමේ ආකාරය අන්තර් ආගමික ගැටුම්වලට හේතුවූ නිදානයට/මුල් හේතුව ඇමතිමට සහ ආගමික ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට අත්‍යාවශ්‍ය වේ. මෙම ක්‍රියාමාර්ගයන් පිළිවෙලට සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භවය උඩ ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය මතුවී තිබේ. මානව හිමිකම් අධ්‍යාපනය සමග

---

[23] *Ibid.* at para.24.

[24] කරුණා සාමය ගොඩනැගීමේ මධ්‍යස්ථානය, A Trainers Guide to Inter-faith Peacebuilding in Sri Lanka, at http://www.karunacenter.org/uploads/9/6/8/0/9680374/__karunacenter-_inter-faith-tot-guide-2013.pdf.

[25] *Ibid.* at 7. එහි සදහන් වෙනවා, මෙම අධ්‍යයනයට අදාල අත්පොත සකස්කර ඇත්තේ, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය කොට්ඨාශයේ අන්තර්-ආගමික සාමය ගොඩනැගීම ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන අනුවයි. .

ඒකාබද්ධව එළඹෙනවා වැඩිදියුණු කිරීමට සමානත්වයේ මූලධර්ම, ඇතුලත් කිරීම සහ විවධත්වයට ඇති බහුමානය, [26] මෙම ක්‍රියාමාර්ගයන් ප්‍රයෝජනවත් ආරම්භයක් සනිටුහන් කිරීමට විශේෂිත මැදහත්වීම් සැළසුම් කිරීමට, මෙම අධ්‍යයනයේ සමාප්ති කොටසේදි සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

## 1ග2 ව්‍යවස්ථානුකූල රාමුව Constitutional fraework

ශ්‍රී ලංකාවේ ආගමික නිදහසට අදාලවූ ව්‍යවස්ථානුකූල රාමුව (The overraching ) ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලවේ. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වෙනි වගන්තිය සිතීමේ නිදහස, හෘදසාක්ෂිය සහ ආගමික නිදහස සහතික කරයි. තවදුරටත් පසුව සඳහන් කල ව්‍යවස්ථාවේ 15 වගන්තියෙන් කිසිම සීමාවකට යටත් නොවන පූර්‍ණ අයිතියක් ලෙස සකස්කර ඇත. මෙම අයිතිය විශේෂයෙන් මහාධිකරණයේ ගත් තීන්දුවක් අනුව (චමරසිාසජඑසදබ) මානව හිමිකම් අයිතිය අපහාසයට ලක්වී ඇත. නීතිවිද්‍යාවේ මෙම විෂයය තරමක් දුරට විරලය. *ප්‍රෙමලාල්ට එදිරිව වීරසූරිය* විසින් උසාවියේදි ගත් නඩුවේදි[27] මෙසේ සඳහන් වේ.

> ආගමක මුල්බැසගත් විශ්වාසයන් ආරක්ෂාකර ඇත. ආගමික විශ්වාස ආරක්‍ෂා කිරීම සඳහ ඒවා තර්කානුකූල වියයුතු නැති, පිළිගතහැකි, ගැලපෙන හෝ තේරුම්ගතහැකි ඒවා විය යුතුය. එසේ නැතහොත්, හිමිකම්පෑම, විස්මයකාර සහ පැහැදිලිව ආගමික නොවෙන අභිප්‍රාරණයකි/පෙලඹවීමකි, රැකවරණය සොයන පුද්ගලයෙක් ඔහුගේ ආගමේ විධානයන් එය අධිකරණ ක්‍රියාවලියේ සහ නිපුණත්වයේ කොටසක් නොවන බව විමසාබැලමෙන් නිවැරදිව තේරුම් ගන්නවා. අධිකරණය ආගමික ග්‍රන්ථයන් අර්ථනිරූපණය කිරීමේ බේරුම්කරුවකු නොවිය යුතු අතර මෙන්ම ආගමික විශ්වාසයන් විමර්ශනය කර බැලීමද සිදුනොකල යුතුය.

ජාතික සුරක්ෂිතා අරමුදලට අනිවාර්යෙන් දායකත්වය සැපයිමට විරුද්ධව හෘද සාක්ෂියට අනුකූලව ඉදිරිපත් කරන ලද නඩුව. පෙත්සම්කරු, රජයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ බෞද්ධ සේවකයෙක්, වැටුපෙන් අඩුකිරීමට නියෝගකල චක්‍රලේඛණය මගින් ඔහුගේ හෘද සාක්ෂියට අනුකූලතාවයට විරුද්ධවන අතර, ඉන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තියට අනුව ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇතිබවට ඔහු තර්ක කරයි. පෙත්සම්කරුට චක්‍රලේඛණයට එකළුවීමට කිසිම පැනවීමක් කලනොහැකිබව අධිකරණය හඳුනා ගති. තවරටත් එය අවසානයේදි චක්‍රලේඛණය මගින් එයට අනුකුලතාවයක් නොදැක්වීම උඩ කිසිම දඩයක් නියම නොකල නිසා ඉල්ලුම්පත නිශ්ප්‍රභා කලේය. ඒ අනුව කිසිම අයිතියක් උල්ලංගණය කරනැත. මෙම නඩු තීන්දුව කොහොමනමුත්, වැදගත් ආදර්ශයක් ලෙස අධිකරණය විසින් ආගමික නිදහස සීමාරහිත බව පිළිගැනීම ගැන ඉතිරිවෙනවා.

මේ අතරතුර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය මගින් සියලුම පුද්ගලයින් ආගම පාදක කරගෙන වෙනස් ලෙස නොසැලකිය යුතුබවට වූ අයිතිය සහතික කරයි.[28]12:2- වගන්තිය කිසිම පුරවැසියකු ජාතිය, ආගම, කුලය, ස්ත්‍රී පුරුෂ බව උඩ, දේශපාලන අදහස් උඩ, උපන් ස්ථානය උඩ හෝ වෙනත් කිසිම දෙයක් පාදක කරගෙන වෙනස්කර සැලකීම නොකල යුතුය. තවදුරටත් 12:3- වගන්තියෙන්, කිසිම පුද්ගලයෙක්......... ආගම පාදක කරගෙන.....කිසිම ආබාධිතත්වයකට, වගකීමට, සිමාකිරීමකට හෝ තත්වයන් ගැන......ඔහුගේ ආගම වන්දනා කරන ස්ථානයන් අනුව පත්නොකර යුතුබව ප්‍රකාශ කරයි. [29]
ව්‍යවස්ථාවේ 14:1 වන වගන්තිය හැම පුරවැසියෙක්ම, ඔහු විසින් හෝ අනිත් අය සමග එකතුව ප්‍රසිද්ධයේ හෝ පුද්ගලිකව ඔහුගේ ආගම හෝ විශ්වාසයන් ඇදහීමට, චාරිත්‍ර වාරිත්‍ර

---

[26] මම ව්‍යාපාතිය මානව හිමිකම් අධ්‍යාපන අංශයත් සහිතව 2014-2015 කාලයේදි ශ්‍රී ලංකාවේදි, ජ්‍යාත්තන්තර ජනවාර්ගික අධ්‍යයන මධ්‍යස්ථානය සහ ඊකිටාස්- ජ්‍යාත්තන්තර මානව හිමිකම් අධ්‍යාපනික මධ්‍යස්ථානය විසින් නියාමු ව්‍යාපෘතියක් ලෙස කරනලදි. ඉන් ඩෛර්මත් කරන ප්‍රතිඵල ලැබී ඇත..
[27] [1985] 2 Sri.L.R. 177.
[28] 12(2) වගන්තිය, 1978 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
[29] *Ibid.* Article 12(3).

අනුගමනය කිරීමට, ව්‍යවහාරය සහ ඉගැන්වීමට ඇති නිදහසට හිමිකම් ලැබේ. මෙම සුවිශේෂ විධිවිධානයන් මගින් ඔවුන්ගේ ආගමික විශ්වාසයන් ඇදහීමට පුරවැසියකුයන්ට ඇති අයිතිවාසිකම් අන්තර්ගත කරයි. 10 වන වගන්තියට වෙනස් විදියට කොහොම නමුත්, 14:1-:ඊ- වගන්තියේ අන්තර්ගතව ඇති අයිතිවාසිකම් 15:7- වගන්තිය මගින් සහත සඳහන් පරිදි සීමා කරඇත.

> ජාතික ආරක්ෂාව, රටේ යථා පැවැත්ම (public order) සහ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම හෝ අවශ්‍ය පිළිගැනීම සුරක්ෂිත කිරීමේ අරමුනින් සහ අනිත් අයගේ නිදහස පිළිබඳ අයිතියට ගරුකිරීම, හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභ සාධනයට ඕනෑවන අවශ්‍යතා සපුරාගැනීම.[30]

ආගමික විශ්වාසයන් පිළිගෙන ඒවා වැලඳගැනීමට ඇති නිදහස සහ ආගමික විශ්වාසයන් පැහැදිලිව දැක්වීමට/ඇදහීමට ඇති නිදහස අතර ඇති වෙනස, ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය ආශ්‍රයෙන් බලනවිට, මුලුමනින්ම නීතිවිද්‍යාවෙන් ආවරණය වුනි.

ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ (ඉ) ජේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම වියයුත්තේය. මේ සම්බන්ධයෙන්, 9 වන වගන්තිය යටතේ සියලුම ආගම් අතර සමානතාවය තවදුරටත් රීත්‍යානුකූලව (technically) ආරක්ෂා කර ඇත. එහෙත්, මේ වගන්තිය ගැන අධිකරණමය අර්ථ නිරූපණයෙන් පෙන්වන්නේ සමානාත්වයක් නොමැති බවයි. මෙම සමානාත්වයක් නොමැති බව ...ශ්‍රී ලංකාවේ සිරි කුරුස කන්‍යා සොයුරියන්ගේ සෙන්ට් ප්‍රැන්සිස් මැන්සින්ජන් තුන්වන නිකායට අයත් ඉමාකිවුලේට් ජෝසප් කන්‍යා සොයුරිය සහ උගන්වන කන්‍යා සොයුරියන් 80 දෙනෙක් විසින් ගොනුකල නඩුවෙන් දක්වනවා. 2004 දි, කතෝලික ආගමේ නිකායක් නීතිගත කිරීමට පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනතක් ලෙස පාඳලිමේනතුවට ඉදිරිපත්කල පනත අභියෝගයට ලක්කරමින් මෙම නඩුව සම්බන්ධවී තිබුනි. මෙම පනත/කෙටුම්පත, ව්‍යවස්ථාවේ 9 වන වගන්තියට පටහැනිබවට මහාධිකරණයේදී අභියෝගයට ලක්කර තිබුනි. අධිකරණය විසින් කෙටුම්පතේ 3 වන ජෙදයෙන් උපකල්පනය කලපරිදි ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම සහ පතුරුවා හැරීම, දැනට රටේ පවතින බුද්ධ ධර්මය හෝ බුද්ධ සාසනයට හානිවිය හැකි බැවින් එයට ඉඩදිය නොහැකිබවට අධිකරණය විසින් මෙම කෙටුම්පත රඳවා තබන ලදි.

නම්‍යශීලිවූ (overraching) ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථානුකූල රාමුව තුල ආගමික නිදහස තිබෙනබව පිළිගන්නවා. ඒ අතරතුර තරමක් දුරට, නිදහස පිළිබඳ සීමාවන් නිර්ණය කිරීමේදී දෙගිඩියාවක් මතුවන බව පෙනේ. ආගම් ප්‍රචාරක කටයුතු කිරීම, උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ තිබෙන සියලුම ආගම්වලට, ව්‍යවස්ථානුකූලව අර්ථනිරූපණය කරනලද විධිවිධානවල බලය අනුව මෙම ආගමික ප්‍රචාර කටයුතුවලට මෙම අයිතිය සපයා නොමැත. ආගමික නිදහස ගැනවූ අධිකරණමය ප්‍රවේශය ඉතා පලල් පරාශයක් (spectrum) තුල පැතිරී ඇත. මෙම පරාසය අවසානයේදී, රජය විසින් ව්‍යවස්ථානුකූලව බැඳීසිටින බෞද්ධාගම පොෂ්‍යකිරීම දැකියහැකි අතර, එය තවදුරටත් ආගම පැතිරීමට පුද්ගලයින්ට ඇති පොදු අයිතිවාසිකම්වලින් ඔබ්බට ගොස් පැතිර පවතින බවපෙනේ. ප්ලළු කෙලවරේ සුළු ආගමික භක්තිකයින්ට සපයා ඇත්තේ (existential status) නැතහොත් අනුභූති/සංදෘෂ්ටික තත්වයක් පමණකි. උදාහරණ වශයෙන් සමහර විශ්වාසයන් පිළිගැනීමට හා ඒවා වැළඳගැනීමට පමණකි. මෙම භක්තිකයින් කොහොම නමුත් මේ අයට ඔවුන්ගේ ආගම් ප්‍රචාරය කිරීමට අනිත් ඒවා හා සමානාත්මක ආරක්ෂිත අයිතිවාසිකම් නැතිබව පෙනීයයි.

මේ අතරතුර ව්‍යවස්ථාවේ 15(7) වගන්තියෙන්, නිදහසේ කථාකිරීම, කිසියම් විශේෂිත හේතූන් උඩ සීමාකර තිබේ. එයට ඇතුලත් වේ.අනිත් අයගේ නිදහස සහ අයිතිවාසිකම් වෙනුවෙන්

---

[30] *Ibid.* Article 15(7).

දියයුතු පිළිගැනීම සහ උපහාරය සුරක්ෂිත කිරීමේ අරමුණින් එසේ කරයි. මේ සම්බන්ධයෙන් නිදහසේ කථාකිරීම සමහරවිට සීමාකිරීමට සිදුවේ. එම කථාවලින් ආගමික නිදහස සීමාවේ නම් හෝ ආගමික ප්‍රචණ්ඩත්වයට පොළඹවනවා නම්, එවැනි දේ වලින් පොදු සාමය ආරක්ෂා කිරීමට අපහසුවන අහිතකර තත්වයක් ඇතිවේ. එමනිසා, කථාකිරීමේ නිදහස සහ භාව ප්‍රකාශනය නැතිනම් උච්චාවරණය අවලංගු කරන දෙයක් ලෙස ආගමික නිදහස අර්ථකථනය කල හැකි අතර ආගමික නිදහස තබා ඇත්තේ අවසර දියහැකි, ප්‍රකාශයට පත්විය හැකි සීමාවක් තුළය. කෙසේ නමුත්, සිහියේ තබා ගත යුතු දෙයක් නම් බුද්ධාගම හැරෙන්නට අනිකුත් ආගම් සහ විශ්වාසයන්වල ප්‍රචාරණය ව්‍යවස්ථාවෙන් ආරක්ෂාකර දි නොමැති ආගමික නිදහසේ එක් අංගයක් වේ.

### 1.3 ආගමික ප්‍රචණ්ඩත්වය සහ වෛරි කථනය පිළිබඳ නීති

ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය යටතේ ආගමික හැගීම් පිඩාවට ලක්කරන හෝ එකමුතුබව නැතිකරන ආකාරයේ කථාවන් කිරීම තහනම් කිරීමට හැකි නීති සමුදායකින් පරිපූර්ණ වී සිටී. දණ්ඩනීති සංග්‍රහය උදාහරණයක් වශයෙන්, එවැනි වරදවල්/අපරාධ රාශියක් එයට ඇතුලත් කරතිබේ.

1. 290 වගන්තිය: කිසියම් වර්ගයේ වන්දනාමාන කරන ස්ථානයකට නින්දා කිරීමේ චේතනාවෙන් හානිකිරීම හෝ අපවිත්‍ර කිරීම

2. 290b වගන්තිය: වන්දනාමාන කරන ස්ථානයකට නින්දාකිරීමේ චේතනාවෙන් ක්‍රියාකිරීම.

3. 291 වගන්තිය: ආගමික සමුළුවකට බාධා කිරීම

4. 291A වගන්තිය: ආගමික හැගීම් රිද්දවීමට හිතාමතාම හඬනගා වචන ශබ්දකිරීම

5. 291B වගන්තිය: හිතාමතා කරන ද්වේෂ සහගත ක්‍රියාවන් මගින් යම් සමුහයක ආගමික හැගීම් වලට අවනම්බු කිරීම බලාපොරොත්තුවෙන් යම් සමුහයක ආගමක් හෝ ආගමික විශ්වාසවලට නින්දාකිරීම

අමතරව, පහත දැක්වෙන නීති සම්පාදක විධිවිධාන, සාමය බිඳ වැටීම, ශාරීරික පහරදීම්, තර්ජන සහ තැතිගැන්වීම් ඇතුලුව සමහර වර්ගයේ පහරදීම් වලට කෙලින්ම සම්බන්ධ වේ.

> පොලිස් ආඥාපනතේ S.79(2) වගන්තියට යම්කිසි පුද්ගලයෙක් පොදු ස්ථානයක සිට හෝ යම් පොදු රැස්වීමකදී හෝ භය උපදවන, අපහාසාත්මක හෝ නින්දාසහගත වචන පාවිච්චි කරනවානම්, හෝ ඔහු සාමය කඩවීම බලාපොරොත්තුවෙන් එසේ හැසිරෙනවා නම් හෝ එවැනි අවස්ථාවක් ඇතිකරනවා නම්, මෙම වගන්තිය යටතේ ඔහු මෙම වරදට වරදකරුවෙක් වේ.

> දණ්ඩනීති සංග්‍රහයේ S.483 වගන්තිය: යම් පුද්ගලයෙක් තව කෙනෙකුට, ඔහුගේ ශරීරයට, කීර්තියට හෝ දේපල සම්බන්ධව තර්ජනය කරනවා නම් හෝ පුද්ගලයකුට හෝ කාගේහරි කීර්තියට ඔහු එම පුද්ගලයා ගැන උනන්දුවෙනවානම්, ඔහු භයගැන්වීමේ අදහසින් හෝ යම් පුද්ගලයෙකුට ඔහුට නීතිමය අයිති නැති දෙයක් කිරීමට සලසනවා නම් හෝ ඔහුට නීතිමය වශයෙන් කලහැකි කාර්යයක් කිරීම අත්හැරීම, එවැනි තර්ජන ගර්ජන කිරීම්, අපරාධි ක්‍රියා සිදුකිරීම්, තැති ගැන්වීම් ආදිය සිදුවීම කෙසේ හෝ ඉවත්කිරීම,

> අපරාධ නඩුවිධාන සංග්‍රහයෙහි S.81: යටතේ, මහේස්ත්‍රාත්වරයෙකුට තොරතුරු දැනගන්න ලැබුනොත්, යම් පුද්ලයෙක් විසින් සාමය කඩකිරීමකට සූදානම්වන බව හෝ යම්කිසි වැරදි කටයුත්තක් කිරීමට සැරසෙනවා නම් ඉන් සාමය කඩවෙනවා නම් හෝ එවැන්නක් සිදුවන්නේ මහේස්ත්‍රාත් අධිකරණ බලප්‍රදේශයක හෝ එවැනි සීමාවක් තුල ඔහු විසින් කරන ලද ක්‍රියාව නිසා සාමය කඩවෙනවා නම් හෝ එවැනි ප්‍රදේශයක් මහේස්ත්‍රාත් අධිකරණ බල සීමාවට එහාගිය ප්‍රදේශයක් නම් හෝ එවිට එම පුද්ගලයාට හේතු දැක්විය යුතුයි ඇයි ඔහුව වසර දෙකකට නොවැඩි කාලයකට බැඳුම්කරයකට යටත්විය යුත්තේ ඇප ඇතිව හො නැතිව, සාමය ආරක්ෂා කිරීම පිණිස උසාවිය විසින් තිරණය කරන පරිදි.

මේ අතර, ආගමික නිදහසට හානිකර ආකාරයේ කථාවන් තහනම් කරඇති පනත්වලද, එම කථාවන් තහනම් කිරීමට විධිවිධාන ඇතුලත්ව තිබේ. 2007 අංක 56 දරණ ICCPR පනතේ ‌ෙ3(1) වගන්තියට අනුව ‘කිසිම පුද්ගලයෙක් යුද්ධය ප්‍රචාරය නොකළ යුතු වන අතර හෝ රකාජාතික, ජාතිවාදි හෝ ආගමික වෛරයට පක්ෂව කතා නොකල යුතු අතර ඉන් වෙනස්කර සැලකීමට, එදිරිවාදිකමට හෝ ප්‍රචණ්ඩත්වයට පෙළඹීමට පත්වේ’. මෙම වැරදි මහාධිකරණයේ අධිකරණ බලසීමාවට අයත්වන අතර මෙම වැරදි සම්බන්ධ නඩුවිභාගවලට උසාවියේ ඉහළ ප්‍රමුඛත්වය දි ඇත.

තව ද, 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ(PTA) 2(1)(h) වගන්තිය යටතේ පහත සඳහන් විස්තර සපයාඇත:

> යම් පුද්ගලයෙකු වචනයෙන් එක්කෝ කථා කිරීමෙන් හෝ කියවීමට බලාපොරොත්තුවන හෝ පෙනෙන නියෝජනයක් හෝ අනිත් අතට ප්‍රචණ්ඩත්වයට බලය පැවරීම හෝ  ආගමික, ජාතිවාදි හෝ ජාතින් අතර එකමුතුකම නැතිවීම හෝ ව්‍යාපාද හැගීම්  හෝ  එදිරිවාදිකම් විවිධ ප්‍රජාවන් අතර හෝ  ජාතිවාදි හෝ ආගමික කණ්ඩායම්..වරදට වැරදිකාරයෙක් වේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) විවේචනයට භාජනවී ඇත්තේ එය ජාත්‍යන්තර නිතියට අනුකූල නොවන බැවිනි.[31] රජය මෑතදි එය සමාලෝචනය කිරීමට සහ පනත අවලංගු කිරීමට කැපවී සිටි.[32] යම් සිදුවීමකදි, 2(1)(h) වගන්තිය විශේෂිතව, වෛරි කථනයෙහි යෙදිසිටින්නන්ට විරුද්ධව අභිචෝදනා ඉදිරිපත් කිරීමේ අරමුණෙන් යොදාගෙන නැත. මෙම වගන්තිය වෙනත් ආකාරයේ ප්‍රශ්නයක් ඇතිකර තිබේ. එය සුළු ජනවාර්ගික  සාමාජිකයින් ඉලක්ක කරගෙන විශේෂිතව යොදාගෙන ඇත. බොහෝවිට, සුළු ජනවාර්ගික කොටස් ගැනවූ රජයේ ප්‍රතිපත්ති විවේචනය කරන අයට විරුද්ධව යොදාගෙන ඇත. උදාහරණ වශයෙන්, 2009 දි, මෙම විධිවිධාන යටතේ පහත සඳහන් වචන ලිවීම ගැන, ජේ.එස්. තිස්සයිනායගම් වරදකරු විය:‘රජය කිසිදු සිවිල් රටවැසියෙකුට(දෙමළ පුරවැසියන්ට) ආරක්ෂාව නොදෙන බව හොඳටම පැහැදිලියි, ඇත්ත වශයෙන්ම රජයේ ආරක්ෂක හමුදා මේ ඝාතනවලට සම්බන්ධ අපරාධකරුවන් වේ.[33] අති ප්‍රමුඛ සිංහල හමුදාව දාමරිකකම් කිරීම ු සම්බන්ධව චෝදනා කරන බව දක්වමින් ඔහු ඕනෑකමින් සිංහල පාඨකයින් ද්‍රවිඩ අයට විරුද්ධව ප්‍රචණ්ඩත්වයට පොළඹවන බව පැමිණිලි පක්ෂය විසින් සාර්ථකව තර්ක කරනු ලබයි, එම PTA විධිවිධාන යටතේම,  මුස්ලිම්වරුන්ට විරුද්ධව සිදුකරන ප්‍රචණ්ඩක්‍රියා සම්බන්ධයෙන්

---

[31] බලන්න කිෂාලි පින්ටෝ-ජයවර්ධන, ජයන්ත ද අල්මේදා ගුණරත්න සහ ගෙහාන් ගුණතිලක, *The Judicial Mind: Responding to the Protection of Minority Rights,* Law & Society Trust (2014).

[32] UN Human Rights Council Resolution, ‘Promoting reconciliation, accountability and human rights in Sri Lanka’, adopted at the 30th Session of the UN Human Rights Council, 29 September 2015, A/HRC/30/L.29, at para.12.

[33] පින්තු-ජයවර්ධන *et al*, *op. cit*. at 243 අධිකරණය නිත්‍ය පිළිවෙලට ද්‍රවිඩ නඩුකියන්නෙක්/වැරදිකරුවෙක් PTA යටතේ සිරභාරයට ගෙන රඳවාගෙන සිටින අතර ඔහුව වැරදිකරුවෙක් කරයි නැතිනම් ඔහුගේ පෙත්සම නිශ්ප්‍රභා කරයි. මෙයට හාත්පසින්ම, පොදු ආරක්ෂක නීති සංග්‍රහය යටතේ සිංහල නඩුකියන්නා/වැරදිකරුට වාසිවනලෙස දෙන නඩුතීන්දුවකින්, නඩුව ඉවතට දමන බව . මෙම අධ්‍යයනයෙන් නිරාවරණය කරනවා.

කරන විමර්ෂණය කිරීම් අක්‍රියවීම ගැන ඉතා බරපතල ලෙස විවේචනය කිරීම නිසා අසාද්සාලිව හිරභාරයට ගැනීමට උපයෝගී කරගන්නා ලදී.[34] ඊට හාත්පසින්ම වෙනස්ලෙස බොදුබලසේනා (BBS) මහලේකම්ට විරුද්ධව කිසිදු පියවරක් ගෙනනැත. ඔහු අළුත්ගමදී කළ ජනතාව අවුස්සන කථාවෙන් සිංහලයෙකුට හෝ හානිකිරීමට පැමිණෙන මුස්ලිම්වරු ශ්‍රී ලංකාවෙන් අතුගාදමන බවට පොරොන්දුවිය.[35] මෙම කථාවෙන් පසුව සිදුවූ අතිශයින්ම නින්දා සහගතවූ අළුත්ගම ජාතිවාදී කෝලාහල නිසා අවම වශයෙන් හතර දෙනෙක් මරණයට පත්වූ අතර සියයකට අධික පිරිසක් තුවාලවිය.[36] එහෙත් මෙම කණ්ඩායමේ කිසිවකුවත් මේ සම්බන්ධව අධිචෝදනා ලබා නොමැත.

ශ්‍රී ලාංකිය නීති රාමුව ආගමික නිදහසට අදාලතාවය ගැන සහ ඒ සඳහා භාවිතාකිරීමේදී බරපතල අභියෝගයන්ට මුහුණදීමට සිදුවී ඇත. අනිත් අතට, ආගමික නිදහස සනාථකිරීමට සහ සුළුආගමික කොටස් ආරක්ෂා කිරීමට අවශ්‍ය ප්‍රගතිශීලි නඩුතීන්දු අතිශයින්ම දුර්ලභ වේ. අනිත් අතට, නීතියේ විධිවිධාන සැලසීමෙන් අදහස් කරන්නේ ආගමික නිදහස ආරක්ෂා කිරීම රජය විවේචනය කරන සමහර සුළු ජාතීන්ට එරෙහිව යොදාගෙන තිබේ. ඒ අතරතුර, වෛරී කථනයන් කරන අපරාධකරුවන් දුර්විපාක නොලබා සිටීම (impunity). එසේම ඊළඟ කොටසින් විස්තර කරන පරිදි රජයේ අනුග්‍රහය මේ සඳහා ලැබී ඇත. මෙම සරලනොවූ නීතිමය රාමුව මගින් ප්‍රජා සම්බන්ධතා අඩුවී ඇත. එසේම අන්තවාදී කණ්ඩායම් වලට ප්‍රචණ්ඩ ක්‍රියා කිරීමටත්, දඬුවමින් බේරී සිටීමටත් ඉඩකඩ සලසා ඇත

### 1.4 ප්‍රතිපත්ති සහ ආයතනික රාමුව Policy and Institutional framework

ආගමික නිදහස සහ ආගමික එකමුතුකම සංකේතවත් කරන ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති රාමුව පැහැදිලිව ශක්තිමත් කරඇත. පසුගිය වසර පහ තුල ශ්‍රී ලංකා රජය විසින් විදහා දක්වන ප්‍රතිපත්ති පිළිබදව කැපවීම් සම්බන්ධයෙන් සුවිශේෂ ලේඛණ දෙකක් සඳහන් කරඇත. ඉන් පළමුවැන්න වන්නේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වන 2011-2015-ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) 2011 දී ප්‍රකාශයට පත්කරඇත. විශ්ව කාලීන සමාලෝචනයේදී (Universal Periodic Review) (UPR) ශ්‍රී ලංකාව ස්වේච්ජාවෙන් වූ පොරොන්දුවක් මත, මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා සහ වැඩිදියුණු කිරීමට පස් අවුරුදු සැලැස්මක් සකස්කිරීම සඳහා 2008 වසරේදී ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) හෙළිදරව් විඇත. අපදා කළමණාකාරීත්ව සහ මානව හිමිකම් අමාත්‍යාංශය මෙම සැලසුම සකස්කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කටයුත්ත සඳහා මූලික කේන්ද්‍රිය ස්ථානය වේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයට 2012 වසරේදී ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ ජාතික වාර්තාවේ සඳහන් පරිදි දෙවැනි UPR සමාලෝචන වාර්තාව අනුව 'රජයේ කේන්ද්‍රිය ස්ථානය සහ සිවිල් සමාජයේ නියෝජිතයින්ට ජාතික ක්‍රියාකාරී සැලැස්ම NHRAP මුල සිටම සකස් කිරීමට සහභාගිවීමට ආරාධනය කරඇත'.[37]

ආගමික වැළැක්වීම ගැන කෙලින්ම වගකීමක්/බැඳීමක් ඇතුළත් වී නැතිබව ජාතික ක්‍රියාකිරී සැලැස්මේ සමස්ත විෂයපථය දෙස බලනවිට පෙනේ. ඒ වුනත් NHRAP වාර්තාවේ ඇතුළත් ආගමික නිදහස පිළිබද ප්‍රධාන වගකීම් ඉටුකිරීමට විශේෂිත රේඛිය අමාත්‍යාංශයන් වෙත පවරා ඇත. උදාහරණ වශයෙන් පාසැල්වල ආගමික නිදහස ගැන ඇති අයුතු/අනවශ්‍ය සීමාකිරීම් මෙම සැලසුමේ ප්‍රශ්නයක් ලෙස හඳුනාගෙන ඇත.[38] මේ යටතේ, පාසැල් විෂය

---

[34] *Ibid*. at 263.
[35] See INFORM, Repression of Dissent in Sri Lanka (June 2014), at 3.
[36] Amnesty International, *Sri Lanka: Act now to prevent further bloodshed in anti-Muslim violence*, 17 June 2014, at http://www.amnesty.org/en/for-media/press-releases/sri-lanka-act-now-prevent-further-bloodshed-anti-muslim-violence-2014-06-17.
[37] National report submitted in accordance with paragraph 5 of the annex to Human Rights Council resolution 16/21: Sri Lanka, A/HRC/WG.6/14/LKA/1, 10 August 2012, at para.10.
[38] Government of Sri Lanka, *The National Action Plan for the Protection and Promotion of Human Rights – 2011-2016*, item 11.

මාලාවට ආගමික නිදහස ගැන දැනුවත් කිරීමේ වගකීම ගැනීම ගැන සහතික වීමට, මෙම සැලසුම නිකුත්කර මාස තුනක් ඇතුළත සුදුසු අධ්‍යාපන චක්‍රලේඛන නිකුත් කිරීමට මෙම සැලසුමේ ඇතුළත් කර තිබේ. අධ්‍යාපන අමාත්‍යාංශයට මෙම වගකීම ඉටුකිරීමේ කාර්යභාරය පවරා ඇත. ආගමික නිදහස ගැන ඊළඟ වැදගත් වගකීම වන්නේ ආගම පදනම් කරගෙන සේවය කරන ස්ථානයේ සිදුවන වෙනස් ලෙස සැලකීම ඉවත්කිරීමයි. පෞද්ගලික අංශයේ මේ ගැන සොයාබැලීමට වෙන්වූ බලයක් නැතිකම ඉස්මතු කරඇති අතර, අධිකරණ අමාත්‍යාංශයට, මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම නිකුත්කර මාස හයක් ඇතුළත එවැනි අධිකාරී බලයක් ඇතිකිරීමට වැඩ පවරා ඇත.[39]

මෙම වගකීම් භාරගැනීම තිබියදිත් මේවා ක්‍රියාත්මක කිරීමට සම්බන්ධීකරණ අංශයක් පත්කර නොමැත. අපදා කළමණාකාරීත්ව සහ මානව හිමිකම් අමාත්‍යාංශය දැනට අහෝසිකර ඇති අතර ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා නව කේන්ද්‍රිය ස්ථානයක් තවමත් හඳුනාගෙන නැත. එමනිසා, ජාතික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ආගමික නිදහස ආරක්ෂා කිරීමට සහ වැඩිදියුණු කිරීමට රජය විසින් භාරගන්නා ලද වගකීම් තවම ඉටුකර නොමැත.

දෙවන සුවිශේෂ ලේඛණයවන්නේ 2011 දී ප්‍රකාශිත උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිෂම් සභාවේ(LLRC) වාර්තාවය.[40] එය අන්තර්-ආගමික සමගිය ඇතිකිරීම සඳහා විශේෂිතවූ ප්‍රශ්නය ගැන ක්‍රියාකරයි. මෙම කොමිෂම් සභාව පත්කරන ලද්දේ තවදුරටත් ජාතික එකමුතුකම සහ සංහිඳියාව සියළුම ප්‍රජාවන් අතර වැඩිදියුණු කිරීමට අවශ්‍ය 'ආයතනික, පරිපාලන සහ නීති සම්පාදන ක්‍රියාදාමයන් ගැනීම අවශ්‍යවේ විශේෂිත විධි නියෝගයක් යටතේ විමසාබලා වාර්තා කිරීමටයි.'[41] LLRC නිර්දේශයන්, 2012 ජූලි මස නිකුත් කළ ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඒකාබද්ධ කර ඇති අතර ඉන් සංහිඳියාව පිළිබඳ රජයේ ප්‍රතිපත්තියට අත්‍යාවශ්‍ය කොටස් සකස්කර ඇත. මෙයින් LLRC නිර්දේශයන් කිහිපයක් අන්තර්-ආගමික සමගිය සහ ආගමික නිදහසට  අදාල වේ.

රජය විසින් තදින්ම ක්‍රියාමාර්ගයන් ගතයුතුබවට අන්තර්-ආගමික අසහනය වැළැක්වීමට සහ එවැනි සිදුවීම් නිතර නිතර ඇතිවීම වැළැක්වීමට හැකි සෑම උත්සාහයක්ම ගතයුතු බවට ද LLRC නිර්දේශ කරයි.[42] බෞද්ධ සාසන සහ ආගමික කටයුතු අමාත්‍යාංශය සහ නීතිය සහ සාමය පිළිබද අමාත්‍යාංශය මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කාර්යය පවරා තිබෙනවා. වර්තමාන රජය යටතේ ක්‍රියාත්මක කිරීමේ වගකීම දැන් උරුමවී තිබෙන්නේ සමාන අමාත්‍යාංශවලටය. නිර්දේශයන් තරමක් දුරට ක්‍රියාත්මකවී තිබේ. දෙනලද තොරතුරු වලට අනුව ආගමික ප්‍රචණ්ඩත්වය 2013 දී සහ 2014 දී සිදුවී ඇති බවට සාක්ෂි ඇති අතර 2015 එවැන්නක් සිදුවී නැතිබවට සාක්ෂි තිබේ. කොහොම නමුත්, මේ අධ්‍යයනයේදී පසුව සාකච්ජා කළ පරිදි, පශ්චාත් 2015 ජනවාරි රජය, පසුගිය කාලයේ ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරතවූ අපරාධකරුවන්ට අධිචෝදනා කිරීම ඉතාමත් හෙමින් සිදුවන බව පෙනේ.

කොමිෂම තවදුරටත් ජනවාර්ගිකත්වය, ආගම, සහ සාහිත්‍යය ගැන කරන වෛර කථා සම්බන්ධ ප්‍රඥප්තීන් සහ (deterrent) නිවර්තක නීති තදින්ම බලගැන්වීමට නිර්දේශ කරන ලදි.[43] ජනාධිපති කාර්යාලයට මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට පවරා තිබුනි. 2014 සැප්තැම්බර් මස නිකුත්කල රජයේ ප්‍රගති වාර්තාව අනුව, දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ ජාතික උත්සව පැවැත්වෙන අවස්ථාවලදී, සියලුම ජනවාර්ගික කණ්ඩායම්වල අයිතිවාසිකම් සහ නියෝජනය ආරක්ෂා කිරීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් සියළුම දිස්ත්‍රික්

---

[39] *Ibid*, item 16.
[40] *Report of the Commission of Inquiry on Lessons Learnt and Reconciliation* (November 2011) ('LLRC Report').
[41] *Ibid*, Clause V of the Warrant.
[42] *Ibid*. para.9.267.
[43] *Ibid.* para.9.283.

ලේකම්වරුන්ට උපදෙස් දී තිබුනි.[44] වෛරී කථාවන් ගැන සත්‍ය වශයෙන්ම, අළුත් නීති පැනවීම ගැන කිසිම ප්‍රගතියක් වාර්තාවී නොමැත.- කොහොම නමුත් 2015 ජුනි මස නිකුත්කල රජයේ ප්‍රගති වාර්තාව අනුව, අමාත්‍ය මණ්ඩලය ඇත්තටම නව නීතිය අනුමත කළබව කියාසිටී.[45] එය ,සඳහන් කිරීමට උචිත වේ, කෙසේ නමුත්, වර්තමාන නීතිමය රාමුව වෛරී කථාවන් සම්බන්ධ ප්‍රමාණවත් පරිදි කටයුතු කරඇති බව සහ මෙම ප්‍රශ්නය රැඳී ඇත්තේ දැනට පවත්නා නීතිරීති බලගැන්වීම මතය.

මීට අමතරව, ප්‍රජා නායකයින් සහ ආගමික නායකයින් ඇතුළු මහජනතාවට රජය ඇපවී සිටිනවා සාමකාමී සිදුවීම් සංවිධානය කිරීමට සහ කිසිම සීමාවක් නොමැතිව රැස්වීම් පැවැත්වීමට LLRC නිර්දේශ කර තිබෙනවා.[46] එසේ තිබියදීත් සාමකාමී එකමුතුවලට ඇති අවහිර කිරීම් පිළිබඳ නොයෙකුත් වාර්තා ඇත. ඉන්ෆෝම් නමැති මානව හිමිකම් ප්‍රලේඛන මධ්‍යස්ථානයට (INFORM Human Rights Documentation Centre) අනුව, 2014 දී පමණක් සාමකාමී එකමුතුවීම් සහ සම්මේලනයන් උල්ලංඝණය කිරීම් 84 ක් සිදුවී ඇත.[47] මෙම පහරදීම් දිගටම සිදුවීමෙන් මෙම නිර්දේශයන් ක්‍රියාත්මක නොකළ බවට දැක්විය හැකිය.

සමහර නිර්දේශයන් සිවිල් සමාජයේ ක්‍රියාදාමයන්ට බලපාන ඒවා ලෙස LLRC ඉදිරිපත් කර ඇත. උදාහරණ වශයෙන් දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටමෙන් අන්තර්-ආගමික සංහිඳියා සහ සාම කමිටු පිහිටුවීමට නිර්දේශ කිරීම. මේ කමිටුවල ප්‍රධාන පරමාර්ථයන් වන්නේ 'බිම් මට්ටමේ යෙදවුම් සැපයීම ක්‍රියාත්මක කිරීමේ ඉලක්ක කරගෙන අන්තර් ජනවාර්ගික සහ අන්තර් ආගමික සහජීවනය ක්‍රියාත්මක කිරීමෙන් ස්වාධීන පැමිණිලි කමිටුවල ක්‍රියාකාරීත්වය සඳහා සහාය සැපයීමය'.[48] මෙම කමිටු පත්කරන තෙක්, රජය විසින් වාර්තා කළ පරිදි බෞද්ධ භික්ෂූන් සහ හින්දු පූජකවරුන් සහභාගිවූ වැඩසටහන් පොළොන්නරුවේ ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන රටේ අනිත් පළාත්වල පැවැත්වීමට නියමිත සමාන වැඩසටහන් සඳහා ප්‍රයෝජනවත් ආදර්ශයක් (templates) විය හැකිය, ඒවා සැපයුවොත් ඔවුන්ට ඒවා එම ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට ඔවුන් ඒවා අතට දැනෙන ධනාත්මක වෙනසකට පරිවර්තනය කිරීමට හැකිවනු ඇත.[49]

ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා ස්ථිර කාර්යාලයක් ස්ථාපිත කිරීමට 2015 අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරඇත. හිටපු ජනාධිපතිවරිය වර්තමානයේ මෙහි සභාපතිවරිය ලෙස කටයුතු කරන අතර එහි මණ්ඩලය සමන්විත වන්නේ ජාතික සහ ආගමික පසුබිමක් ඇති අයගෙන්ය. මෙහි කාර්යය භාරය තවමත් අර්ථ නිරූපණය කර නොමැති අතර එය නිළ වශයෙන් ආරම්භ කළ යුතු අතර එහි ක්‍රියාකාරී වැඩසටහන දියත් කළයුතු වේ. කොහොම නමුත්, ඒ සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරඇති (mandate document) විධි නියෝගයන් අඩංගු ලේඛණයට අනුව ආගමික සමගිය ප්‍රවර්ධනය කිරීම සහ ආගමික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම, පැහැදිලිවම අදහස් කරඇත.

ඉහත සඳහන් සාකච්ජාව, නීතිමය, ප්‍රතිපත්ති සහ ආයතනික රාමුව ආගමික නිදහස ආරක්ෂාකිරීමට සහ වැඩිදියුණුකිරීමට අදාලව සහ ආගමික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට ප්‍රමාණවත් හඬක් නඟන බව පෙනියයි. මේ අතරතුර වෛරී කථා පිළිබඳ නීති සම්පාදනය නව රජය් න්‍යායපත්‍රයේ ඇති දෙයක් වන අතර, එවැනි නීති සම්පාදනයකින් දැනට පවතින

[44] Government of Sri Lanka, *National Plan of Action for the Implementation of LLRC Recommendations – Responsibilities by Thematic Area* (September 2014).
[45] Government of Sri Lanka, *National Plan of Action for the Implementation of LLRC Recommendations – Responsibilities by Thematic Area* (June 2015).
[46] LLRC Report, para.9.118.
[47] INFORM Human Rights Documentation Centre, *Freedoms of Assembly and Association in Sri Lanka* (September 2014), at https://ihrdc.files.wordpress.com/2014/08/freedom-of-assembly-association-in-sri-lanka-inform-20sep2014.pdf.
[48] LLRC Report, para.9.221.
[49] Government of Sri Lanka, *National Plan of Action for the Implementation of LLRC Recommendations – Responsibilities by Thematic Area* (September 2014).

වෛරී කථා සම්බන්ධ නීතිවලට, දණ්ඩ නීති සංග්‍රහය සහ ICCPR පනත ඇතුළත්ව සැලකියයුතු වටිනාකමක් ලැබේයයි සිතිය නොහැක. සමාන සහ විෂයානුබද්ධ නීති බලගැන්වීමක් නොමැතිකම මෙම කරුණු ගැන පැනනගින බරපතල ප්‍රශ්නයක් වේ. මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන්ම ආයතනික ප්‍රශ්නයකි. එය අධිකරණ සහ නීති ක්‍රියාත්මක කරන නිලධාරීන් ඇතුළුව රාජ්‍ය සේවකයින්ගේ, නොහැකියාව සහ අකමැතිකම නිසා ආගමික පහරදීම් වැළැක්වීමට සහ අධි චෝදනා ගොනු කිරීමට නොහැකිවීමට අදාළ වන අතර සමස්තයක් වශයෙන් ආගමික සහජීවනය ඇතිකිරීමට වාතාවරණයක් සකස්කිරීමට නොහැකිවීමද වේ. ආයතනික අසමත්කම සහ උදාසීනත්වය දක්වන මිම්මක් වන ආයතනික අවනතභාවය, ශ්‍රී ලංකාවේ ප්‍රජා සම්බන්ධතා සඳහා පැතිර පවත්නා සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භයන්ට බලපාන බව පෙනේ. මෙම සන්දර්භානුගත (contextual) මුහුණුවරවල් පසුව මෙම අධ්‍යයනයෙන් ගවේශණය කරනු ඇත.

## 2. ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත Data on Religious Violence

### 2.1 ආගමික පහරදීම් වර්ගීකරණය Categorisation of religious attacks

ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරන ලද අධ්‍යයන කිහිපයක් ආගමික පහරදීම් ආකාරය ගැන පැහැදිලි වර්ගීකරණයක් ඉදිරිපත් කරඇත. 2014 මාර්තු මාසයේදි, වන් ටෙක්ස් ඉනිසියටිව් One Text Initiative (OTI) විසින් ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රස් සඳහා පළකරන ලදුව (SLMC),[50] පසුව එය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබද මහ කොමසාරිස් වෙත යවන ලදි. එම වාර්තාව මගින් ප්‍රයෝජනවත් වර්ගීකරණයක් පහරදීම් පිළිබඳව දක්වා ඇත.

1. ශරීරික ප්‍රචණ්ඩත්වය
2. දේපළ විනාශකිරීම
3. තර්ජනය කිරීම, භයගැන්වීම හෝ බලහත්කාරකම් කිරීම
4. ද්වේෂ කිරීමේ ව්‍යාපාරය හෝ ප්‍රචාරක කටයුතු
5. වෙන්කොට සැලකීමේ පුරුද්ද

ශ්‍රී.ල.මු.කො.(SLMC) අධ්‍යයනය 'පහරදීම' යන්න පිළිබඳව පැහැදිලි අර්ථකථනයක් ඉදිරිපත්කර නොමැත. මෙම වචනය වෙන තැනක සඳහන් කර ඇත්තේ ශරීරික ප්‍රචණ්ඩත්වය ලෙසටය.[51] එවැනි විවෘත ක්‍රියාවන්, පුද්ගලයෙකුට විරුද්ධව සිදුකරන ශරීරික ක්‍රියාවන් ඇතුලත්ව, දේපල විනාශකිරීම සහ වෙනත් ක්‍රියා තර්ජනයෙන් තැතිගැන්වීම, තර්ජන ගර්ජන සහ බලහත්කාරකම් කිරීම ආදිය පහසුවෙන් සොයාගත හැකි අතර සහ ප්‍රමාණය මැනගත හැකිය.

එමෙන්ම, වෛරී ව්‍යාපාරයන් සහ ප්‍රචාරණ කටයුතු ප්‍රචණ්ඩ ක්‍රියාවලට සහ විනාශකිරීම්වලට පදනමක් ඇතිකරදි ඇත. මෙසේ ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය ගැන කරන විශ්ලේෂණවලට වෛරී කථනයන් ඇතුලත්කර තිබීම ඉතා තීරණාත්මක දෙයකි. ප්‍රචණ්ඩත්වය පිළිබඳ වැනර්ගේ පුලුල් නිර්වචනය ගැන නැවත වරක් හැරී බලනවිට SLMC අධ්‍යයනයට ශාරීරික නොවන/භෞතික නොවන පහරදීම් අඩංගුකිරීම සාධාරණ කලහැකි වේ. එපමණක් නොව සංසන්දනාත්මකව බැලිමේදි වෛර ව්‍යාපාරය සහ ප්‍රචාරණ කටයුතු ආදිය මැනිය නොහැකි දේවල් වේ. SLMC අධ්‍යයනයට වෙන්කොට සැලකීමේ පුරුදුද ඇතුළත් කර ඇත. එසේම, මෙවැනි ඇතුළත් කිරීම් නිසා ඒවායේ නිර්වචනයන් පුලුල් පරාසයක පැතිර ඇති නිසා, ක්ෂණික විවේචනවලට ලක්වෙන බවද සඳහන් කර තිබේ. තවදුරටත් එවැනි ඇතුළත් කිරීම්, වෙන්කොට සැලකීමේ පුරුදු අනුව සාධාරණය කළ හැකි වේ. රජය විසින් සම්බාධක ඇතිකරනවා නම් ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය වැඩිවීමට ඉඩ තිබේ. උදාහරණ වශයෙන් ආගම පදනම් කරගෙන මූලික අවශ්‍යතා ආයතිනක වශයෙන් අහිමිකිරීම පෙන්විය හැකිය.

පහත සඳහන් වගුව ඒ ඒ වර්ගය යටතට ගැණෙන සිදුවීම් පිළිබද උදාහරණ දක්වයි. මෙම පහරදීම්වල පැහැදිලි විශේෂාංගය වන්නේ ඒවා ආගම මත අභිප්‍රේරණයවූ/උසිගැන්වුණවූ හෝ විශේෂිත ආගමික කණ්ඩායමකට එල්ලකර පහරදීමයි. මෙම සියලුම උදාහරණ සපයාගත්තේ LMC අධ්‍යයනයෙනි.

---

[50] ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය , ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය: *ජනවාරි 2013 – දෙසැම්බර් 2013* (2014).

[51] උදාහරණ වශයෙන්, the Centre for Policy Alternatives ප්‍රතිපත්ති කේන්ද්‍රය 'පහරදීම' නිර්වචනය කරනවා ආගමික ස්ථානවලට එරෙහිව ශාරීරිකව කරන පහරදීම්, එයට ඇතුලත් වෙනවා, එය පිහිටි ගොඩනැගිල්ලට හානි කිරීම, සොරාගැනීම, ගොඩනැගිල්ල ඇතුලත තිබෙන භාණ්ඩ සොරාගැනීම හෝ විනාශකිරීම, එහි ඇතුලත සිටි පුද්ගලයින්ට තුවාල සිදුකිරීම හෝ මරණයට පත්කිරීමයි.'. බලන්න Centre for Policy Alternatives, *Religious Violence in Post-war Sri Lanka – Incidents and Attacks* (September 2014), available at: http://groundviews.org/2014/09/16/infographic-religious-violence-in-post-war-sri-lanka.

**වගුව 1: සිද්ධීන් පිළිබඳව උදාහරණ (වර්ග අනුව)**

| වර්ගය (Category) | සිද්ධිය (Incident) |
|---|---|
| ශාරීරික ප්‍රචණ්ඩත්වය | මනම්පිටිය තැපැල් කාර්යාලයට අනුයුක්තව සිටි මුස්ලිම් ගැහැණු සේවිකාවට පහරදී ඇත. පහරදුන් පුද්ගලයින් ඇයගේ පර්ධාව (*fardha)* ඉවත්කිරීමට උත්සාහ කරඇත. (2013 මාර්තු 18 දා, පොළොන්නරුව).<br><br>කලහකාරී ගම්වැසියන් පිරිසක් දේවගැතියෙකුට පහරදී යාඥා හමුවීමක් කඩාකප්පල් කර ඇත.<br>(2013 පෙබරවාරි 24 දා, වෙන්නප්පුවල පුත්තලම) |
| දේපල විනාශ කිරීම | භික්ෂූන් කණ්ඩායමක් බේරුවල පිහිටි භෝජනාගාරයකට හානිකර ඇත. (2013 ජනවාරි 23, බේරුවල).<br><br>බොදුබලසේනා BBS සාමාජිකයින් බිලිවර්ස් පෙලෝෂිප් Believers Fellowship පල්ලියේ ගොඩනැගිලි සහ දේපල වලට අලාභ හානි කර ඇත. (2013 මාර්තු 24, අම්බලන්තොට, හම්බන්තොට). |
| තැතිගැන්වීම, තර්ජන ගර්ජන හෝ බලහාත්කාරකම් | ජාතික බලසේනාව (JBS) විසින් සංවිධානය කරනලද මාධ්‍ය සාකච්ජාවට, බොදුබල සේනාව BBS විසින් කඩාපැන නින්දා පරිභවකර එහි පැමිණ සිටි මුස්ලිම් පූජකවරුන්ට සහ JBS මහාලේකම් වටරැක විජිත හිමියන්ට තර්ජනය කරඇත. (2013 අප්‍රේල් 9, කොම්පඤ්ඤ වීදිය, කොළඹ).<br><br>අසල්වැසි නිවැසියන් විසින් Gospel to the World Church පල්ලියේ පැවති යාඥා රැස්වීම කඩාකප්පල් කර, ඒ සඳහා පැමිණි අයට තර්ජනය කර මෙම රැස්වීම් දිගටම පැවත්වුව හොත් පහරදෙන බවට ද පවසා ඇත. (2013 ජුලි 26, මැදවච්චිය, අනුරාධපුරය). |
| වෛරී ව්‍යාපාරය සහ ප්‍රචාරණ කටයුතු | 'රටේ සිදුවන අපරාධවලින් වැඩි කොටසක්, හොර බඩු ජාවාරම, ආදායම් බදු නොගෙවා මගහැරීම, මත්ද්‍රව්‍ය ජාවාරම ආදිය වේ. එම වැරදි සිදුකරන්නේ මුස්ලිම්වරුන් බව BBS මහ ලේකම් ප්‍රකාශ කරසිටි'. (2013 ජුලි 13ල මාධ්‍ය වාර්තාව).<br><br>සතුන් මැරීම ගැන සඳහන් කරමින් BBS මහ ලේකම් මුස්ලිම්වරුන් ඔවුන්ගේ වත් පිළිවෙත් සිංහල සහ ද්‍රවිඩ ප්‍රදේශවලට පැතිරීම නොකළ යුතු අතර, බුද්ධාගමට අපහාස නොකරන ලෙසත් ප්‍රකාශ කර සිටී. ඔහු තවදුරටත්, රජය මේ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට අපොහොසත් වුවහොත්, ඔවුන් විසින් සියලුදේම විනාශ කරන බවට අනතුරු අඟවා සිටිනවා, (2013 දෙසැම්බර් 12,මාධ්‍ය වාර්තාව). |
| වෙන්කර සැලකමේ පුරුදු | මුස්ලිම්වරුන්ට, ජාතික හැඳුනුම්පත් සඳහා හිජාබ් *hijab හෝ ෆේස් fez තොප්පි පැළඳීමට ඉඩ නොදෙන බව මාධ්‍යය වාර්තාකර තිබුණි.*<br><br>Assembly of God ඇසැම්බ්ලි ඔෆ් ගොඩ් පල්ලියේ යාඥා රැස්වීම් නවත්වන ලෙස පොලිසිය විසින් නියෝග කරඇත. (2013 මාර්තු 19, වලස්මුල්ල හම්බන්තොට). |

## 2.2 අපරාධකරුවන් වර්ග කිරීම (Classification of perpetrators)

පහරදීම් වර්ග කිරීමට අමතරව අපරාධකරුවන් වර්ග කිරීම, ප්‍රචණ්ඩත්වයේ නැඹුරුව විශ්ලේෂණය කිරීම සඳහා අත්‍යාවශ්‍ය වේ. නැවත වරක්, OTI විසින් ප්‍රකාශිත වාර්තාව හැරෙන්නට, පැහැදිලි ප්‍රභේදකරණයක් (categorisation) ලබාගැනීමට නොහැකි බව හොඳින් පෙනී යයි. එම වාර්තාවේ පහත සඳහන් ප්‍රභේදයන් සපයා ඇත.

1. රජයේ ආයතන හෝ රාජ්‍ය සේවකයින්
2. දේශපාලන හෝ සමාජීය ව්‍යාපාරයන් හෝ දේශපාලනඥයින්
3. ආගමික ආයතන හෝ පූජකවරු
4. වාණිජමය උනන්දුවක් දක්වන කණ්ඩායම් හෝ පුද්ගලික ව්‍යාපාරයන්
5. සම්බන්ධ නොවුන හෝ හඳුනානොගත් පුද්ගලයින් හෝ කණ්ඩායම්

මෙම වර්ගීකරණය තරමක් ප්‍රයෝජනවත් එකකි. ඉන් අනාවරණය වන්නේ සියල්ල දත් ක්‍රියාකරුවන්, සමාජ-දේශපාලන විෂයෙහි, රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සහ ආගමික ප්‍රජාවන් ආදිය. ශ්‍රී ලංකාවේ ආගමික පහරදීම් වලට සම්බන්ධ අපරාධකරුවන් මෙම වර්ගීකරණයට අයත් වේ.

'රාජ්‍ය ආයතන' යන්නෙන් සඳහන් වන්නේ 'විධායක' සහ 'පරිපාලන'' කාර්යයන් ක්‍රියාත්මක කරන ආයතනයි. විධායක සහ පරිපාලන යන වචනයන්ට අර්ථ දැක්වීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126:1 වගන්තියෙන්, මානව හිමිකම් ඉල්ලීම ගැනවූ විෂය පථයේ නිර්වචනය කර ඇත. නිතීවිද්‍යාව මේ සම්බන්ධයෙන් තේරුම් ගැනීමට උදව් වේ. මහාධිකරණයේදී පැවති *ජයකොඩිට විරුද්ධව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සහ රොබින්සන් හොටෙල් සමාගම සහ අනිකුත් අය සමග* නඩුවේදී[52] රාජ්‍ය ආයතන මෙම වචනවල අර්ථ දක්වා ඇත්තේ 'රජයේ බලසහිත සහ පාලනය' යටතේ ඇති ආයතන ලෙසයි. මෙම නිර්වචනයේ සුවිශේෂ බව වන්නේ ආයතන වල ක්‍රියාකාරිත්වයන් මෙම නිර්වචනය යටතේ වැටෙන නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වෙනි වගන්තිය යටතේ, එම ආයතනයන්ට මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමේ වගකීම දැරීමට සිදුවේ. රජයේ ආයතන යටතට සියලුම රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජයට අයත් පොදු ව්‍යවසායයන් සහ රජයේ ඒජන්තවරුන් අයත් වේ. රාජ්‍ය සේවකයින් යන්නට, වැඩි වශයෙන් විධායක සහ පරිපාලන කටයුතු කරගෙනයාමට රජය විසින් පත්කරගන්නා ලද පුද්ගලයින් ඇතුලත් වේ. මෙම උප වර්ගයට අමතරව අධිකරණ නිළධාරීන්ද ඇතුලුකල හැකියි, ඔවුන් සාමාන්‍ය ගණයට නොවැටන අතර කලින් විස්තර කලපරිදි විධායක සහ පරිපාලන විෂයපතයට වැටෙන ක්‍රියාවලියේ නිරත වූවන් ද නොවේ. SLMC අධ්‍යයනයේදී අර්ථ දැක්වීමේ විෂය පථයේදී ඇත්තටම අධිකරණ නිළධාරීන් ඇතුලත් කලාද යන්න පැහැදිලි නැත. මෙම අධ්‍යයනයේ සඳහන් පහරදීම් ලැයිස්තුවේ කිසිම තැනක විනිසුරුවන් කෙලින්ම සම්බන්ධ බවක් නොපෙනේ. එපමනක් නොව, එහි ආගමික පහරදීම්වලට පිළියමක් ලෙස වෙනම ප්‍රශ්න කිරීමේ ක්‍රියාවලියක් කරගෙන ගිය බැව් සඳහන් වෙනව, එය මූලික අයිතිවාසිකම් භාවිතේ රාමුවෙන් පිටත සිදුවන ක්‍රියාවලියකි. ඔප්පු වූ නරක හැසිරීම නිසා විනිසුරුවෙක් ඉවත්කිරීම සම්බන්ධයෙන් සිදුවන විනය පරීක්ෂණ සිදුකරන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව (පහල උසාවියේ විනිසුරුවන්ට එරෙහිව) විසිනි. දෝෂාභියෝග පරිපාටිය (impeachement proceedings) අභියාචන මහාධිකරණයේ සහ ශ්‍රේෂ්ඩාධිකරණයේ විනිසුරුවන් සඳහාද ක්‍රියාත්මක වේ.

.දේශපාලකයින්. යන්නට යන්නෙන් අදහස් කරන්නේ ව්‍යවස්ථාදායකයට හෝ විධායක ආයතනවලට තෝරා පත්කරගත් නියෝජිතයින්ට, ඔවුන් මහමැතිවරණයේදී අපේක්ෂකයින් ලෙස ඉදිරියට පැමිනි සහ පිළිගත් දේශපාලන පක්ෂවල ප්‍රධාන තනතුරු හොබවමින් සිටින අයයි. දේශපාලන සංවිධාන සහ සමාජ සංවිධාන විසින් දේශපාලන පක්ෂවලට දේශපාලන

[52] [2001] 1 Sri. L.R. 365.

සංවිධාන වලට අවධිමත් දේශපාලන සහ සමාජීය වශයෙන් උනන්දුවන කණ්ඩායම් විශේෂික ඉලක්ක සහ පරමාර්ථ සොයා හඹායයි. චාල්ස් ටිලි (Charles Tilly) වෙනමම නිර්වචනයක් දේශපාලන ව්‍යාපාරයට සහ සමාජ ව්‍යාපාරයට, සපයමින්, අප්‍රකට නමුත් ඉතා වැදගත් වෙනසක් මෙම ව්‍යාපාර දෙකේම ඇති බව සඳහන් කරයි. දේශපාලන ව්‍යාපාරය, එක කරුණක් වටේ හෝ කරුනු කීපයක් වටේ හෝ බෙදාගත් සැලකිල්ලට ගත යුතු කරුනු වටේ සංවිධානයවීම ලෙස ඔහු නිර්වචනය කරයි. එවැනි ව්‍යාපාරයක් වරින්වර දේශපාලන ඉඩකඩින් වාසි ලබාගැනීමට උත්සාහ කරයි. ව්‍යාපාරයක් රැකගැනීමට හෝ පතුරුවා හැරීමට ඔවුන්ගේ අවශ්‍යතා විශේෂිතව ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායම් මෙම නිර්වචනය යටතට ගැනේ. සමාජ ව්‍යාපාරයන් ඊට හාත්පසින්ම වෙනස්ව, බහුතර අවධිමත්ව පුද්ගලයින් රාසියකින් සැදි කණ්ඩායම් හෝ සංවිධානයන්, දේශපාලන සහ සාමාජීය කරුණු ගැන අවධානය යොමුකර ඇත..[53] කාන්තා අයිතින්, ළමා අයිතින්, පරිසරය රැකගැනීම, විවාහයේ සමානතා ආදිය සම්බන්ධව අවධානය යොමුකල ව්‍යාපාරයන් මෙම ගණයට අයත්වේ.

ආගමික ආයතන සහ පූජකවරු යන්නෙන් අදහස් කරන්නේ යම් කිසි ආගමික විශ්වාසයන් මත ඇතිකරගත් සංවිධාන සහ ඒ සඳහා කැපවී සිටින පූජකත්වයට පත්වූ පුද්ගලයන්ය. මෙම ගණයට වැටෙන්නේ විධිමත් ආයතන පමණක් නොවේ, උදාහරණ වශයෙන් නීතිය යටතේ ලියාපදිංචි වූ ආයතන රජය විසින් පිළිගෙන ඇත. එමනිසා, මෙම ගණයට වැටෙන ආයතනවල විෂය පථය අවධිමත් අංශයට වැටෙන ආගමික විශ්වාස මත ඇතිවූ සංවිධාන තෙක්ම දිවයන අතර ඔවුන් එම ආගමික විශ්වාස නියෝජනය කරන පුද්ගලයින් වේ.

වාණිජ ව්‍යාපාර සම්බන්ධ කණ්ඩායම් සහ පුද්ගලික අංශයේ ආයතන යනුවෙන් අදහස් කරන්නේ පෞද්ගලික අංශයට අයත් සියලුම නීතිගත සහ නීතිගත නොකල ආයතනයි. වාණිජ මණ්ඩලය සහ ව්‍යාපාර සංගමයන් නියම වශයෙන් නිර්වචනය කරන විට අයත් වන්නේ වාණිජ ව්‍යාපාර සම්බන්ධ කණ්ඩායම් වලටයි. කර්මාන්ත හෝ කර්මාන්ත අංශය විශේෂිත සංගමයන් සහ කණ්ඩායම් නීතිමය අංගයන් ලෙස විධිමත් ලෙස හඳුනා නොගත්තත් නමුත් වාණිජමය අංශය සැලකිල්ලට ගනිමින් මෙම කණ්ඩායම නියේජනය කරයි. උදාහරණයක් වශයෙන් අවධිමත් ලෙස සංවිධානය වී ඇති යම් ප්‍රදේශයක සිටින ව්‍යාපාරිකයින්ගේ සංගමයන්ද මේ ගණයට වැටේ. මෙම ගණයට නීතිගත සහ නීතිගත නොවුන පුද්ගලික ව්‍යාපාරික ආයතන අයත්වේ. අවසාන වශයෙන්, පුද්ගලයින් සහ කණ්ඩායම් ඔවුන් විශේෂිත සංවිධානයකට අයිති නැති හෝ ඔවුන්ගේ ස්වරූපය හඳුනානොගත් පුද්ගලයින් වෙනමම වර්ග බර ඇත. හඳුනානොගත් පුදගලයින් කරන ශරීරික ප්‍රචණ්ඩ ක්‍රියාවන් සහ දේපොල වලට අලාභහානි කරන පුද්ගලයින් වෙනස 'නොවී මේ ගණයට වැටේ.

## 2෴3 ආගමික පහරදීම් සංඛ්‍යාත්මකව සිතියම් ගතකිරීම
## Quantitative mapping of religious attacks

ආගමික පහරදීම් ගැන නියම සංඛ්‍යාව පිළිබඳ දත්ත, අඩුම තරමේ ජාතික රාජ්‍ය නොවන සංවිධාන දෙකක් විසින් එකතුකර විශ්ලේෂණය කරඇත. ඒවා නම්, මුස්ලිම්වරුන් සඳහාවන කාර්යංශය සහ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඇවන්ජලිකල් සන්ධානයයි. (NCEASL) 2013 දී සිදුවූ ආගමික පහරදීම් පිළිබඳව දිස්ත්‍රික් මට්ටමෙන් තොරතුරු එකතුකිරීමක් සිදුවී නැත.

පහත සඳහන් රූපසටහනින් 2013 වසරේදී නියත ස්ථාන 166 ක සිදුවූ මුස්ලිම් විරෝධී පහරදීම් ඉදිරිපත් කර ඇත. (උදාහරණ වශයෙන් පහරදීම් සිදුවූයේ වැඳුම් පිදුම් කරන ස්ථානවලටයි-මුස්ලිම් පල්ලිවලට) තවදුරටත් සිදුවූ සිදුවීම් 75 ස්ථාන අරමුණු කරගෙන සිදුවූ ඒවා නොවේ. (උදාහරණ වශයෙන් මාධ්‍යයෙන් කල වෛරී ව්‍යාපාරය) මේ සිදුවීම් සියල්ල එකතුව පහරදීම් 241 කි.

[53] Charles Tilly, *Social Movements, 1768–2004* (2004), at 262.


## රූපසටහන 1: 2013 දී සිදුවූ මුස්ලිම්-විරෝධී පහරදීම්[54]




2013 දී ක්‍රිස්තියානි-විරෝධී පහරදීම් 69 වාර්තා විය. ක්‍රිස්තියානි  ප්‍රජාවට එරෙහිව සිදුවූ ප්‍රහාරයන්වල ප්‍රමාණය අනුව පමණක් අප තේරුම්ගත් විදියට ආගමික ප්‍රචණ්ඩත්වයේ බැරෑරුම්කම පූර්ව මතයන් (not prejudice) නොවිය යුතුබව ඉන් සඳහන් වේ. අඩු තරමේ පහරදීම්, මුස්ලිම් ප්‍රජාව හා සංසන්ධනය කරන විට, ආගමික නිදහසේ තත්වය මුස්ලිම් අයට වඩා ක්‍රිස්තියානි අය අතර හොඳින් ඇත ිබව මින් අදහස් නොකෙරේ. ප්‍රචණ්ඩත්වයේ බැරෑරුම්කම විශ්ලේෂණය කලයුත්තේ, සිදුවූ සිද්ධයේ ස්වභාවය, සිදුවූ සැරකම, නැවත නැවත එය සිදුවීමට ඇති නැඹුරුතාවය,(උදාහරණ වශයෙන් ප්‍රචණ්ඩත්වය නැවත වරක් එම ස්ථානයේම සිදුවීමට ඇති නැඹුරුතාවය) යන්න උඩයි. මෙම කරුණුවලට යම් සීමාවක් ඇතිබව සිහියේ තබාගෙන, පහත සඳහන් රූප සටහනින් මෙම පහරදීම් පැතිරතිබූ ආකාරය පෙන්වයි.

[54] Sri Lanka Muslim Congress, *op.cit.* at 2.

## රූපසටහන 2: 2013 දී සිදුවූ ක්‍රිස්තියානි-විරෝධි පහරදීම්[55]





[55] *Ibid.* at 3. ක්‍රිස්තියාන සංවිධානයන් සමාන ගණනක් වාර්තා කරඇත. U.S. රාජ්‍ය දෙපාර්තමේන්තුවට අනුව, *2013 Report on International Religious Freedom* (July 2014), 'මේ වසරතුල ක්‍රිස්තියානි සංවිධානයන් අඩුම තරමේ සාහසික පහරදීම් 60 ක් බෞද්ධ භික්ෂූන් විසින් ක්‍රිස්තියානි පල්ලිවලට විරුද්ධව පහරදී ඇත.'

හින්දු දේවලවලට එල්ලවූ පහරදීම් ප්‍රමාණය මෙතෙක් ගණනය කර නොමැතිබව සඳහන් වේ. කොහොම නමුත්, දෙමළ ජාතික සන්ධානයේ, විශේෂයෙන් එහි නායකයා වන ආර්.සම්බන්දන් මහතා, හින්දු දේවලවලට විරුද්ධව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව, පුනපුනා සිහියට නගයි.[56]

(UN Human Rights Council) එක්සත් ජාතින්ගේ මානව හිමිකම් මණ්ඩලයේ 24වන සහ 25 වන සැසිවලදී, ශ්‍රී ලංකාවේ ආගමික පහරදීම් පිළිබඳ ඇති සංඛ්‍යාත (figures) පිළිබඳව විශේෂ අවධානයක් යොමුවී ඇත.[57] එවකට එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය ලෙස කටයුතුකල නවි පිල්ලේයි මහත්මිය, පසුගිය 2014 පෙබරවාරි මාසයේ අවසාන වරට පැවැත්වූ සැසියේදී මේ ගැන විශේෂ සංවේගයෙන් සිටිනබව ප්‍රකාශ කරන ලදී. එසේම ඇය තවදුරටත් කැළඹී සිටින බව ප්‍රකාශ කල අතර, සුලු ආගමික කොටස්වලට එරෙහිව කරන පහරදීම් නිසා සුවිශේෂ රැල්ලක් ගොඩනැගී ඇතිබවත්, සමහර අන්තවාදී බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙයවනු ලබන සිංහල බෞද්ධ ජාතිවාදී කණ්ඩායම් මෙම ප්‍රචණ්ඩත්වය වැඩිවීමටට උල්පන්දම් දෙන බවටද ඇය ප්‍රකාශ කරඇත.[58]

මුස්ලිම්වරුන්ට විරුද්ධව සිදුවූ සැලකියයුතු පහරදීම් ප්‍රමාණයක් තිබියදී, 2013 දී සිදුවූ මුස්ලිම් විරෝධි පහරදීම් තවදුරටත්, පහරදීම් වර්ගය අනුව සහ අපරාධකරුවන් වර්ගය අනුව කොටස්වලට බෙදාඇත.

**රූපසටහන 3 : 2013 දී සිදුවූ මුස්ලිම්-විරෝධි පහරදීම් :පහරදීම් වර්ගය අනුව-**[59]




---


[56] See Parliamentary Debates (Hansard) – Official Report, Volume 219 - No. 3, 8 August 2013, at 325.

[57] See Oral update of the High Commissioner for Human Rights on promoting reconciliation and accountability in Sri Lanka, A/HRC/24/CRP.3/Rev.1, 25 September 2013; Promoting reconciliation and accountability in Sri Lanka: Report of the Office of the United Nations High Commissioner for Human Rights, A/HRC/25/23, 24 February 2014 ('2014 Report of the OHCHR').


[58] 2014 Report of the OHCHR, at para.20.

[59] ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය, *op. cit.* at 1. මෙම එකගනොවීමට ඇති එක සීමාවක් වන්නේ එක සිද්ධියකට එක විදියකට වඩා වැඩි ප්‍රමාණයක, වෙනස්විදියේ පහරදීම්ද ඇතුලත් වේ. එමනිසා රූපසටහනේ ඇති මුල පහරදීම් ගණන, සම්පූර්ණ සිදුවීම් ගණන ලෙස(reflect) ආවර්ජණය නොවේ. .

**රූපසටහන 4: 2013 දි සිදුවූ මුස්ලිම්-විරෝධි පහරදීම් :අපරාධකරුවන් වර්ගය අනුව-**[60]





**රූපසටහන 5: 2013 දි සිදුවූ ක්‍රිස්තියානි-විරෝධි පහරදීම් :පහරදීම් වර්ගය අනුව -**[61]





[60] *Ibid.* BBS සංවිධානය අර්ථදැක්වූ/නිර්වචනය කල වර්ගයකට වඩා වැඩි ගණනකට වැටෙන බවට එහි සඳහන් වෙනවා. පැහැදිලි කිරීමේ අදහසින් සහ එකවරකට වඩා වැඩි වාර ගණනක් ගණනය කිරීම (ද්විගුණනය) වැලැක්වීමට සහ පසුව "දේශපාලන සන්දර්භය" උපවගන්තියේ විස්තර කරන පරිදි, BBS වර්ගීකරණය කරඇත්තේ ආගමික ආයතනවලට විරුද්ධව කටයුතු කරන දේශපාලන ව්‍යාපාරයක් ලෙසයි.
[61] *Ibid.* at 27.

**රූපසටහන 6: 2013 දී සිදුවූ ක්‍රිස්තියානි-විරෝධී පහරදීම් :අපරාධකරුවන් වර්ගය අනුව-**




**2014 දී ප්‍රචණ්ඩත්වයට නැඹුරුවීම දිගටම සිදුවිය. මුස්ලිම්වරුන්ට විරුද්ධව සිදුවූ පහරදීම් අඩුමතරමේ 200 පමණ විය. පහත සඳහන් රූප සටහනින් මෙම පහරදීම්වල ව්‍යාප්තිය ඉදිරිපත් කරයි.**

**රූප සටහන 7: 2014 දී සිදුවූ මුස්ලිම්-විරෝධී පහරදීම්** [62]





2013 දත්ත වලට සමානව, ස්ථානයන්-විශේෂිත පහරදීම් ඉහත සඳහන් සිතියමේ දක්වා නොමැත. සිතියමේ දක්වා ඇති පහරදීම් 2014 දී ස්ථානයන්-විශේෂිතව සිදුවූ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයි. එසේම මුස්ලිම් මහලේකම් කාර්යාලයේ *2014 දී ශ්‍රී ලංකාවේ මුස්ලිම් විරෝධී හැඟීම්* යන මැයෙන් වූ වාර්තාව අනුව ලැයිස්තු ගත කර ඇති පහරදීම් ඇත්ත වශයෙන්ම මෙම වාර්තාවේ නිර්වචන කර ඇති පරිදි පහරදීම් ගනයට වැටෙන්නේ නැත. උදාහරණ වශයෙන් 2014 දී අනුරාධපුරයේදී මුස්ලිම් සහ සිංහලයින් අතර සිදුවූ ඉඩම් ආරවුල ආගමික පහරදීම් ලෙස නිර්වචනය කල නොහැකි අතර, මෙම ආරවුල ආගමික පෙළඹවීමක් උඩ සිදුවූවක් නොවේ. මුස්ලිම් ලේකම් කර්යාලයේ වාර්තාවේ ලැයිස්තු ගතකර ඇති පහරදීම් 214 කින් 200 ක්ම මේ ගනයට වැටෙන අතර මෙම අධ්‍යයනය සඳහා එම කරුණු යොදාගෙන ඇත.

ඊළගට පහත දැක්වෙන රූප සටහන් දෙකෙන්ම මෙම පහරදීම්වල ව්‍යාප්තිය, සිදුවීම් වර්ගය අනුව සහ අපරාධකරුවන් අනුව විස්තර කර ඇත.


---


[62] Secretariat for Muslims, *Anti Muslim Sentiment in Sri Lanka 2014* (2015).

**රූපසටහන 8: 2014 දී සිදුවූ මුස්ලිම්-විරෝධී පහරදීම් :සිදුවීම් වර්ගය අනුව-**




රූපස






මේ අතරතුර, ක්‍රිස්තියානුවන්ට විරුද්ධව 2013 දී සිදුවූ පහරදීම් 2014 දී 88 දක්වා වැඩිවී ඇත.[63] පහරදීම්වල ව්‍යාප්තිය සහ වර්ගීකරණය පහත දැක්වෙන රූපසටහනින් දැක්වේ.

[63] Source of Primary Data: ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවැන්ජලිකල් සන්ධානය

**රූපසටහන 10: 2014 දී සිදුවූ ක්‍රිස්තියානි-විරෝධි පහරදීම්**




**රූපසටහන 11: 2014 දී සිදුවූ ක්‍රිස්තියානි-විරෝධි පහරදීම් :සිදුවීම් වර්ගය අනුව-**




රූපසටහන 12ට 2014 දී සිදුවූ ක්‍රිස්තියානි-විරෝධි පහරදීම් :අපරාධකරුවන් වර්ගය අනුව-




මුස්ලිම්වරුන්ට විරුද්ධව සිදුකල පහරදීම් ගැන 2013 සහ 2014 වසරවල දත්ත නැඹුරුවීම් දෙකක් ආවරණය කරයි. පළමුවෙන්, 50 වඩා පහරදීම් ශාරීරික නොවන ඒවා වන අතර ඒවා වෛරී කථාවන් සහ ප්‍රචාරයන්ය. මෙම අධ්‍යයනය මගින් එම නැඹුරුවේ සුවිශේෂතාවය ගවේෂණය කරනු ඇත. දෙවනුව, 50 පමණ පහරදීම්වල අපරාධකරුවන් වන්නේ දේශපාලන නලුවන් හෝ දේශපාලන සහ සමාජ ව්‍යාපාරයන්ය. හතරෙන් කොටසකට වඩා සියලුම පහරදීම්වලට බලපාන තනි අපරාධකරුවා- ඊරීග බොදුබල සේනාවයි. එමනිසා, 2013 සහ 2014 කාලය තුලදී මුස්ලිම්වරුන්ට විරුද්ධව කල පහරදීම් වැඩිවීමට සමගාමීව සුවිශේෂී සංවිධානයේ ප්‍රමුඛත්වය සහ බලපෑම වැඩිවිය. මෙම අධ්‍යයනය, බොදුබල සේනා වැනි සංවිධානයන් මතුවීම, ඒවා වඩා ශක්තිමත්වීම එසේම ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය හේතුවූ සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භය තුල මෙවැනි ආයතන ස්ථානගතවූ අයුරුද පසුව විශ්ලේෂණය කිරීමට උත්සාහ ගන්නවා.

මුස්ලිම් විරෝධි පහරදීම්වලට වෙනස් ලෙසට, ආසන්න වශයෙන් 50 පමණ වූ ක්‍රිස්තියානි ලබ්ධිකයින්ට එරෙහිව සිදුවූ පහරදීම් කරනලද අපරාධකරුවන් වන්නේ හඳුනා නොගත් කණ්ඩායම් සහ පුද්ගලයින්ය. ගමේ ගම්වැසියන් සහ ගමේ ආගමික පූජකයින්, විශාල ප්‍රමාණයක් වන ශාරීරික ප්‍රචණ්ඩත්වය, දේපොල හානිකිරීම්, තර්ජනය කිරීම් සහ භය ගැන්වීම් වලට වගකිය යුතුයි. අමතරව රාජ්‍ය සේවකයින් වරින්වර කෙලින්ම හෝ නිශ්ශබ්දව ක්‍රිස්තියානිවරුන්ට-විරුද්ධව පහරදීම් වලට සහභාගිවී ඇත. මේ ගැන වූ විශේෂාංගය ඊලග කොටසින් ගවේශනය කරයි.

## 2.4 විෂය අධ්‍යයනය Case studies

මෙම කොටසින් පසුගිය වසර දෙක තල සිදුවූ වූ දූෂ්ටාන්ත අවස්ථා/සිදුවීම දෙකක් ගැන සහ එක භූගෝලීය අවස්ථාවක්/සිදුවීමක් වන්නේ දකුණු පළාතේ දිස්ත්‍රික්ක දෙකක සිදුවූ සිද්ධීන් ගැන සාකච්ඡා කරයග. මෙම දූෂ්ටාන්ත අවස්ථා/සිදුවීම දෙකම මුස්ලිම් ප්‍රජාවට විරුද්ධව එල්ලවූ පහරදීමය. පළමු එක සිදුවූයේ 2013 මැද හරියේදී සහ දෙවැනි එක එක් වසරකට පසුව සිදුවිය. මෙම සිදුවීම් තුනේම වැදගත් සමානකම් රැගෙන යයි. පලමුව මෙම අධ්‍යයනයේ තවදුරටත් පසුව විස්තර කරන පරිදි, මෙම ප්‍රදේශ දෙකේම ප්‍රදේශයටම විශේෂිතවූ තත්වයක් තිබුන අතර ප්‍රජාවට වැරදි වැටහීමක් ඇතිවීමට සහ නොඉවසුම් ගතියක් ඉන් මතුව තිබුනි. දෙවනුව, සංවිධානයවූ කොටස් මෙම සිදුවීම් දෙකේම සම්බන්ධව සිටියා. මෙම කණ්ඩායම් කලින් ඇතිවූ තිබුන තත්වය තවදුරටත් වැඩිකලා. එසේම අන්තිමට මතුවූ ප්‍රචණ්ඩත්වයට ඔවුන් උල්පන්දම් දුන්නා. තුන්වනුව හදිසියේ මතුවූ කරුනකින් ප්‍රචණ්ඩත්වය මතුවිය. එසේම 1983දී පැනනැගි ජනවාර්ගික කෝලාහල මතුවීමටද මේ හා සමාන සිද්ධීන්/කරුනු හේතුවූ බව සඳහන් වේ. මේ අතරතුර, 2013දී සිදුවූ පහරදීම් සහ 2014දිගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ක්‍රිස්ත්‍රියානි ප්‍රජාවට විරුද්ධව එල්ලවූ පහරදීම් ගැන මෙම භූගෝලීය විෂය අධ්‍යයනය අවධානය යෙුමුකරනු ඇත.

*ග්‍රෑන්ඩ්පාස් පල්ලියේ සිදුවීම* *The Grandpass mosque incident*

2013 වනවිටල ග්‍රෑන්ඩපාස් ප්‍රදේශයේ ප්‍රධාන පල්ලියවූ (Masjeed Deenul Islam) මස්ජිඩ් දිනුල් ඉස්ලාම් පල්ලිය-අසල තිබූ බෝගස ලගතිබූ ඉඩමට මුල්බැස තිබූ බැවින්, තවදුරටත් පුලුල් කිරීමට නොහැකි තැනකට පැමින තිබුනි. [64] නාගරික සංවර්ධන අධිකාරිය (UDA) කලින් මෙම ප්‍රදේශය සංවර්ධන කටයුතු සඳහා පවරාගැනීමට ප්‍රකාශකර තිබුනි. පවරාගැනීම යන්නෙන් අදහස් කරන්නේ මෙම පල්ලිය අවසානයේදී එතැනින් ඉවත්කල යුතුබවයි. මේ තත්වය යටතේ මේ ප්‍රදේශයේ මුස්ලිම් භක්තිකයින් විකල්පයක් වශයෙන් වෙනත් ගොඩගැගිල්ලක් ගෙන එය මුස්ලිම් යාඥා මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට කිරීමට යොදාගත්තා. මෙම ප්‍රදේශයේ සිටින සිංහල ප්‍රජාව සහ විශේෂයෙන්ම ලගම තිබෙන පන්සලකට සම්බන්ධ බෞද්ධ භික්ෂුන් වහන්සේලා, මෙම විකල්ප මධ්‍යස්ථානය පිහිටුවීම ගැන විරෝධය දැක්වීමට පටන්ගත්තේය. අන්තවාදී කණ්ඩායම් වන සිහල රාවය සහ රාවණා බලය සංවිධාන මෙම කරුණ වැඩිකිරීමට කටයුතු කලා. පසුව සඳහන් කල කණ්ඩායම 2013 පුනි මස 9 දින සහ පුලි මස 5 දින මෙම යාඥා මධ්‍යස්ථානයට විරුද්ධව විරෝධය පෑම් දෙකක් සිදුකර ඇත. [65] මෙම ස්ථානය එතැනින් ඉවත්කිරීමට කිහිපවරක් පොලිසියටද පැමිණිලි කර තිබුනි.[66] එසේවුවත්, බුද්ධ සාසන සහ ආගමික කිටයුතු අමාත්‍යංශය එම විකල්ප ස්ථානය යාඥා මධ්‍යස්ථානයක් පාවිච්චි කිරීමට අවසරදී තිබුනි. මෙම අවසර පත්‍රය මුලින්ම තාවකාලික එකක් ලෙස 2013 අගෝස්තු මස 10 වෙනිදා වනතෙක් නිකුත්කර තිබුන අතර පසුව එය තවදුරටත් දික්කර ඇත.

මෙම දික්කිරීමේ ආරංචිය නිසා එම ප්‍රදේශයේ සිටින සිංහලයින්ගේ ප්‍රකෝපකාරි ප්‍රතිචාරයන් ඉස්මතුවිය. 2013 අගෝස්තු මස 11 දින සිහල රාවයට සම්බන්ධ විරෝධතාකරුවන්, එතැන ආගම ඇදහීමේ ස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට ඔවුනට අවසර පත්‍රයක් නැතැයි කියමින් නව යාඥා මධ්‍යස්ථානයට පහරදී ඇත.[67] මෙම සිදුවීම එම ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාව සහ සිංහල විරෝධකරුවන් අතර ජනවාර්ගික ගැටුමක් දක්වා වර්ධනය විය. නීතිය හා සාමය රැකීමේ අධිකාරීන් මෙම ප්‍රචණ්ඩත්වය නැවැත්වීමට හෝ දේපොල හානිකිරීම නැවැත්වීමට කල දේවල් ප්‍රමණවත් නොවිය. කොහොම නමුත්, මෙම තත්වය අන්තිමේදී කාලයාගේ ඇවෑමෙන් පාලනය කරගැනීමට හැකිවූ අතර පසුව එය විසඳන ලදි. ඉන්සපුව, එකගවූ සම්මුතියට පැමිනි දෙය වූයේ නාගරික සංවර්ධන අධිකාරිය මෙම අත්පත්කරගැනීම නැවැත්වීම, මුස්ලිම්වරුන් නැවතවරක් මුලින්ම ගිය පල්ලියට යාම සහ බෝගස එම ස්ථානයෙන් ඉවත්කර මුල් පල්ලිය පුලුල් කිරීමට ඉඩ ලබාදීමයි.[68] නව යාඥා මධ්‍යස්ථානය සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය, කොහොම නමුත්, කාලය අවසානයේදී අවලංගු කරන ලදි. ප්‍රදේශයේ ඇති පන්සලේ ප්‍රධාන විහාරාධිපති ස්වාමීන් වහන්සේ සහ මුස්ලිම් ප්‍රජාවගේ නියෝජිතයා යන දෙදෙනාම මෙම පහරදීමට පැමිණි පුද්ගලයින් පිටස්තර අය බව ස්ථිරලෙස කියා සිටියහ[69]

*අලුත්ගම කෝලහාලය* *The Aluthgama riots*

2014 පුනි 15 දා දකුණු ලංකාවේ අලුත්ගම, දර්ගාටවුන්, වැලිපැන්න සහ බේරුවල-නගරවල ජනවාර්ගික කෝලාහල මතුවිය. මෙම ප්‍රදේශවල විශාල මුස්ලිම් ජනගහනයක් ඇති අතර

---

[64] නිල්මිණි විජේදාස, 'Grandpass: A commitment to peace after ugly clashes', *The Sunday Times*, 18 August 2013, at http://www.sundaytimes.lk/130818/news/grandpass-a-commitment-to-peace-after-ugly-clashes-58345.html., බෝගස බුද්ධාගමේ පූජණිය වස්තුවක් ලෙස සලකන බැවින් සහ පුදේශය ගැන නොසලකා බෝගස ඉවත්කිරීමට පුද්ගලයින් ඉඩනොදෙනබව එහි දැක්වෙනවා..

[65] SLMC, *op.cit.* at 19-21.

[66] SLMC, *op.cit.* at 19-21.

[67] Latheef Farook, 'Calculated Attack on Grandpass Mosque', *The Colombo Telegraph,* 14 August 2013, at https://www.colombotelegraph.com/index.php/calculated-attack-on-grandpass-mosque/.

[68] *Ibid.*

[69] Wijedasa, *op. cit*. However, as discussed in the subsection titled 'Particular local context', the claim that the violence was caused by outsiders requires further assessment.

ඔවුන් ජීවත්වන්නේ සිංහල ප්‍රජාවත් සමග එක දිගටමය. මෙම ප්‍රජාවන් දෙක අතර මිත්‍රකම දිගටම තිබුනත් එය දැනට පලුදුවී ඇත්තේ, පසුගිය දශකයකට පෙර ඇතිවූ ජනවාර්ගික කෝලාහල නිසායි.

2014 දී සිදුවූ ජාතිවාදී කෝලහාල ඉස්මතුවීමට හේතුව වී ඇත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් සහ මුස්ලිම්වරු තුන්දෙනෙක් අතර සිදුවූ කලහයයි.[70] මෙම සිද්ධියෙන් පසුව ජුනි 15 දා බෞද්ධ භික්ෂූන් වහන්සේට පහරදීම හෙලාදකිමින් විශාල පෙලපාලියක් සංවිධානය කර තිබුනි. බොදුබල සේනාව මෙම පෙළපාලියට සහභාගිවූ අතර එහි මහලේකම්, ගලබොඩඅත්තේ ඥාණසාර හිමියන් විසින් මුස්ලිම්වරුන්ට විරුද්ධව ජාතිවාදී සහ ජනතාව කුපිත කරවන ප්‍රකාශයන් කර ඇත.[71] ඔහුගේ ප්‍රකාශයන් නිසා කලහකාරී පිරිස් උසිගැන්වූ අතර වටේ පිහිටා තිබුන මුස්ලිම් ව්‍යාපිරික ස්ථාන සහ නිවාසවලට පහරදී ඇත. මෙම කෝලාහල නිසා මුස්ලිම්වරු තුන්දෙනෙක් ඇතුලුව හතරදෙනෙක් මරුමුවට පත්වූ අතර සියයකට වඩා ප්‍රමාණයක් මුස්ලිම්වරුන්ගේ නිවාස සහ කඩවල් විනාශ විය. මෙම කෝළහාල ගැන මානව හිමිකම් කොමිෂන් කාර්යාලය සඳහන් කරතිබුනේ .ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ සිදුවූ ඉතාමත් නරක නිකායිකවාදී(sectarian) ප්‍රචණ්ඩත්වය ලෙසටයි.[72]

නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් නැවත වරක් ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීමට අපොහොසත් විය. ඔවුන්ට විරුද්ධව තිබුන විශේෂිත චෝදනාව වුයේ මුස්ලිම් ප්‍රජාවට පහරදුන් කලහකාරී පුද්ගලයින් අතර සංවිධානයවූ කොටස්ද ක්‍රියාකාරීවී ඇති බවයි. උදාහරණ වශයෙන්, සිද්ධිය දුටු සාක්කිරුවන් කියා සිටියේ බොහෝ පහරදුන් අය හෙල්මට් සහ බූට් සපත්තු පැළඳසිටි අය බවයි. මින් හැඟියනවා, සමහර අපරාධකරුවන්හට හමුදා උපකරණවලට ප්‍රවේශයක් තිබුන අතර, ඒවා සාමාන්‍ය මහජනතාවට ලබා ගැනීමට හැකියාවක් නැත.[73] මෙවැනි වාචික සාක්කිවලින් මෙම කෝළාහල සඳහා රාජ්‍ය මැදිහත්වීම ගැන බලගතු සැකයක් මතුකරවයි.

*දකුණු පළාතේ සිදුවූ ආගමික පහරදීම්* *Religious attacks in southern province*

2014 සහ 2014 දී ක්‍රිස්තියනි ආගමිකයින්ට විරුද්ධව සිදුවූ බොහොමයක් පහරදීම් සිදුවූයේ හම්බන්තොට සහ ගාල්ල දිස්ත්‍රික්කවලයි. මෙම කාලය තුල විශේෂිත පහරදීම් 27ක් මෙම දිස්ත්‍රික්ක දෙකෙන්ම වාර්තාවී ඇත. සැළකියයුතු දෙය වන්නේ පොලිසියේ හෝ වෙනත් රාජ්‍ය නිලධාරීන් ක්‍රියාකාරීව හෝ රහසිගතව මෙම සිදුවීම් 13 කට සහභාගීවී ඇත. මේ ගැන සමහර උදාහරණ පහතින් විස්තර කර ඇත.

2013 මාර්තු මස 19 සහ අප්‍රේල් මස 6 වෙනිදින හම්බන්තොට, වලස්මුල්ල ප්‍රදේශයේ (Assemblies of god ) ඇසැම්බ්ලි ඔෆ් ගොඩ්ස් පල්ලියේ සියලුම යාඥා රැස්වීම් අත්හිටුවන ලෙස පොලිසිය නියෝගකරඇත. පසුව, ආගමික නායකයින් සහභාගිවූ රැස්වීමක් 2013 මැයි මස 10 දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මෙහෙයවීමෙන් පැවැත්විය. එම රැස්වීමේදී පලාතේ බෞද්ධ භික්ෂූන් විසින්, කලින් රජයේ අවසරයක් නොගත් සියලුම පල්ලි වහාම වසා දමන බලෙන් ඉල්ලා සිටියා.

2014 ජනවාරි 5 වෙනිදිනල පොලිස් නිලධාරීන් පස්දෙනෙක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු, ගාල්ලේ, හික්කඩුවේ ( Assemblies of god ) ඇසැම්බ්ලි ඔෆ් ගොඩ්ස් පල්ලිය විසින් භාවිතාකරන පූජනීය ස්ථානයට පැමිණ ඇත. මෙම නිලධාරීන් විසින් මෙම ස්ථානයේ පවත්වාගෙන යන යාඥා රැස්වීම් වහාම අත්හිටුවන ලෙස ඉල්ලා සිටියේය. දින දෙකකට

---

[70] Farzana Haniffa, Harini Amarasuriya & Vishakha Wijenayake, *Where Have All the Neighbours Gone? Aluthgama Riots and its Aftermath: A Fact Finding Mission to Aluthgama, Dharga Town, Valipanna and Beruwela*, Law & Society Trust (2015) at 1. Also see Gehan Gunatilleke, *Confronting the Complexity of Loss*, Law & Society Trust (2015), at 33.

[71] Haniffa *et al.* at 1.

[72] Oral update of the High Commissioner for Human Rights on promoting reconciliation, accountability and human rights in Sri Lanka, 22 September 2014, A/HRC/27/CRP.2, at para.46.

[73] Haniffa *et al.* at 31-32.

පසුව, මෙම පල්ලියේ දේවගැතිවරයා හික්කඩුව පොලිස් ස්ථානයට පරීක්ෂණයක් සඳහා කැඳවිය. බෞද්ධ භික්ෂූන් දෙනමක් ඉනික්බිතිව පොලිස් ස්ථානාධිපතිඉදිරියේදීම වාචිකව පරිභව කර ඇත.

2014 ජනවාරි 26 වනදින පොලිස් නිලධාරීන් අටදෙනෙක් සහ බෞද්ධ භික්ෂුවක් ගාල්ලේ රත්ගම පිහිටි (Calvary free church ) කල්වරි දේවස්ථානයේ යාඥා රැස්වීම් පැවැත්වෙන අවස්ථාවේදී, එයට ඇතුල්වී ඇත. පොලිස් නිලධාරීන් යාඥා රැස්වීම නවත්වා එයට සහභාගිවූවන්ට පරීක්ෂණයක් සඳහා පොලිසියට වාර්තා කරන ලෙස නියෝග බර ඇත. 2014 ජනවාරි මස 29 දින පොලිසිය විසින් ගාල්ල මහේස්ත්‍රාත් උසාවියේ සාමය කඩවීම ගැන දේවස්ථානයේ දේවගැතිවරයාට විරුද්ධව නඩුවක් ගොනුකර ඇත.

2014 පෙබරවාරි මස 24 වෙනිදා හම්බන්තොට මාමදල්ල පිහිටි Assemblies of god ඇසැම්බ්ලි ඔෆ් ගොඩ් පල්ලියේ දේවගැතිවරයාට පරීක්ෂණයක් සඳහා පොලිසියේ පෙනී සිටීමට ඉල්ලා ඇත. මෙම පරීක්ෂණයේදී පොලිසියේ OIC සහ තවත් බෞද්ධ භික්ෂූණ් දෙනමක් පෙනිසිටි අතර ඔවුන්, දේවගැතිවරයාට සියලුම ආගමික කටයුතු නවතා දමන ලෙස ඉල්ලා සිටියා. මේ ප්‍රදේශයේ ආගමික කටයුතු කිරීම සඳහා, බුද්ධ සාසන සහ ආගමික කටයුතු අමාත්‍යංශයේ පූර්ව අනුමැතිය අවශ්‍ය බවට එහිදී විවාද කර ඇත.

2014 ජුනි 6 වෙනිදින පොලිසියේ OIC විසින්, යාඥා රැස්වීම පුද්ගලික ස්ථානයක පැවැත්වීම ගැන, හම්බන්තොට අගුනුකොලපැලැස්ස ඇසැම්බ්ලි ඔෆ් ගොඩ් පල්ලියේ දේවගැතිවරයාට වාචිකව පරිභවකරඇතග ඔහු තවදුරටත් යාඥා රැස්වීම් පැවැත්වීම නැවැත්වීමට අකමැති නම් ඔහුට ගමෙන් පිටව යන ලෙස ඉල්ලා ඇත.

තමම සිදුවීම් හැම එකකින්ම පෙන්වන්නේ සමහර පොදු ලක්ෂණයි. පළමුවේ ඔවුන් හසුවෙනවා ක්‍රිස්තියිනි ලබ්දිකයින් යාඥා රැස්වීම් හෝ ආගමික සේවාවන් අසම්මත ප්‍රදේශවල පැවැත්වීමෙන්. මෙසේ දෙවියන් අදහස ස්ථානයන් බොහෝවිට පුද්ගලික නිවාසයන් වන අතර ඒවා ආගමික ස්ථාන ලෙස 2008 දි එවකට ආගමික කටයුතු සහ සදාචාර අභිවෘර්ධික අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද චක්‍රලෙඛනයක් අනුව ලියාපදිංචිකර නැත දෙවනුව, පලාතේ බෞද්ධ භික්ෂූන් රාජ්‍ය සේවකයින්ව වරින්වර, මෙම ස්ථානයන් වසා දැම්මට හෝ යාඥා රැස්වීම් අත්හිටුවා දැම්මට උසුගන්වනවා. ඒ හැරෙන්නට බෞද්ධ භික්ෂූන් පොලිස් නිලධාරීන් හෝ වෙනත් නිලධාරීව් ඉදිරියේ දේවගැතිවරුන්ට වාචිකව පරිභව කිරීම් සිදුකරයි. එදිරිවාදිකම් මධ්‍යයේ බෞද්ධයින්ගේ සාංකාව වී ඇත්තේ මෙම ආගමික කටයුතු කරගෙන යාමෙන් බලාපෙරොත්ත ු වන්නේ ක්‍රිස්තියානි ආගම ප්‍රජාව තුල පැතිරවීමයි. තුන්වනුව, රාජ්‍ය නිලධාරීන්-විශේෂයෙන් පොලිස් නිලධාරීන් දේවගැතිවරුන් සහ ආගම අදහන්නන්ට තර්ජනය කිරීමෙන් සහ තැතිගැන්වීමෙන් එසේම ආගමික කටයුතු අත්හිටුවීමටට නියෝග කිරීමෙන්, ක්‍රියාකාරී කොටසක් ගෙන ඇත. ගතයුතු කරුනක් වන ක්‍රිස්තියානි විරෝධී ප්‍රචණ්ඩත්වය, වරින්වර සුවිශේෂ හැඩයක් ගත්බව. මෙම ලක්ෂණයන්ගෙන් පැහැදිලි කරනවා. මෙම ප්‍රචණ්ඩත්වය ක්‍රමානුකූලව ගැලපෙනසේ. නොයෙක්විට සිදුවූයේ අඩු වේගයකින්, ඒත් එය දිගටම සිදුවුනි. ක්‍රිස්තියානි දහමට විරුද්ධ මෙම නැඹුරුව, සමහර වැදගත් වෙනසක් ආගමික ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය අනුව ආවර්ජනය කරනවා. මෙම වෙනස්කම් පසුව මේ අධ්‍යයනයේ සාකච්ජා කරනු ඇත. එසේම ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය ගැන ගැඹුරු අවබෝධයක් ලබාගැනීමට ප්‍රයේජනවත්වෙනවා.

## 2.5 ජනවිකාශනය අනුව ආගමික පහරදීම් සිතියම් ගතකිරීම

Demographic mapping of religious attacks

ශ්‍රී ලංකිය සමාජය විස්තර කර තිබෙන්නේ, එහි ජනවාර්ගික සහ ආගමික විවිධත්වය උඩ, (‘an ethno-religious mosaic’) .ජනවාර්ගික-ආගමික විචිත්‍රයක්. ලෙසයි.[74] ලගදි එනම් 2012 දි සිදුකල සංගහණය අනුව ජනගහණයෙන් 74.9 සිංහලයින් වේ. ද්‍රවිඩ ජනගහනය 15.2%

[74] See Sasanka Perera, *The Ethnic Conflict in Sri Lanka: A Historical and Sociopolitical Outline*, World Bank (February 2001), at 11.

(වතුකරයේ සිටින 4% ක්වූ ජනතාව සමග) සහ යෝනකවරුන් ජනගහනයෙන් 9.2% ක්වේ. මේ අතරතුර, ජනගහනයෙන් 70% ක් බෞද්ධයින් වන අතර හින්දු ජනගහනය 12.6% ක් වේ. මුස්ලිම් සහ ක්‍රිස්තියානි භක්තිකයින් ප්‍රමාණය පිළිවෙලින් ජනගහනයෙන් 9.7% ක් සහ 7.4% ක් වේ.[75]

2013 සහ 2014 දි සිදුවූ ආගමික පහරදීම් පිළිබඳ දත්තයන්, එහි රටාව සහ නැඹුරුව ගැන අනාවරණය කිරීමට විශ්ලේෂණය කරනවා. මෙම විශ්ලේෂණය කිරීමට යොදාගත් ක්‍රමය වන්නේ පහත සඳහන් පරිදියි. පළමුවෙන්, සියලුම පහරදීම්, ඒවා සිදුවූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව වර්ග කරනු ලැබේ. ඊලගට 2012 දි ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජනගහන දත්ත, ජනගහනය ආගම අනුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ බෙදා වෙන්කර පෙන්වීමට විශ්ලේෂණය කරනවා. ජනගහනය දත්ත, තවදුරටත් විශ්ලේෂණය කරනවා. හැම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම ජනවිකාශන පැතිකඩ හරියටම දැනගැනිමට-. උදාහරණ වශයෙන් ආගමික විවිධත්වයේ මට්ටම සහ ආගමික සුලුතරය සංකේන්ද්‍රණයවී සිටින ආකාරය අනුවයි. වර්ගිකරණය පහත සඳහන් උපමාණය උඩ සිදුකර ඇතට

**ආගමික විවිධත්වය** **Religious Diversity:**

ඉහල - ආගමික ප්‍රජාවන් දෙකකට වඩා තිබෙන ජනගහන කොටස >10%
මධ්‍යම - ආගම් දෙකක තිබෙන ජනගහන කොටස >10%
පහල - එක ආගමක තිබෙන ජනගහන කොටස >10%

**ආගමික සුලුතරයේ සංකේන්ද්‍රණය** **Concentration of Religious Minorities:**


ඉහල - ආගමික සුලුතරය:උදා. බෞද්ධ-නොවන- යුක්තවෙනවා >66 ජනගහනයෙන්
මධ්‍යම - ආගමික සුලුතරය යුක්තවෙනවා <66 නමුත් >33 ජනගහනයෙන්
පහල - ආගමික සුලුතරය යුක්තවෙනවා <33% ජනගහනයෙන්

මේ දත්ත, ඊලගට ප්‍රචණ්ඩත්වය සිදුවූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය සහ එම කොට්ඨාශයේ ජනවිකාශන පැතිකඩ අතර සහසම්බන්ධතාවයක් තිබෙනවාද යන්න පරීක්ෂාකිරීමට විශ්ලේෂණය කරනවා. එහි ප්‍රතිඵල චිත්තාකර්ෂණීය නැඹුරුවක් පෙන්නුම් කරයි.
2013 සහ 2014 දි රට වටේ ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 88 ක ආගමික පහරදීම් සිදුවිය. ආගමික විවිධත්වය අනුව සහ ආගමික සුලුතරය සංකේන්ද්‍රණයවී ඇති ආකාරයට මෙම ප්‍රා. ලේ. කොට්ඨාශ (profile) ආකෘති/පැතිකඩක් කරඇත. පහත සඳහන් කොටු සැලැස්මෙන් ආගමික පහරදීම් විසිරී තිබෙන ආකාරය විදහා දක්වයි.

[75] *Ibid*.

**රූපසටහන 13: විශේෂිත ප්‍රා.ලේ. කොට්ඨාශ ආගමික සුලුතරය/විවිධත්ව පැතිකඩ ලෙස වර්ගීකරණය**

**Classification of Specific D.S. Divisions by Religious Minority/Diversity Profile**




ඉහත සදහන් රූප සටහනින් 2013 සහ 2014 දි ආගමික පහරදීම් සිදුවූ ප්‍රා.ලේ. කොට්ඨාශ 88 ක ජනවිකාශන පැතිකඩවල් 88, විදහා පෙන්වනවා. එසේම මුලු රටේම ඇති ප්‍රා.ලේ. කොට්ඨාශ මුලු ගණන 328 ක් බව සදහන්වේ. ආගමික පහරදීම් සිදුවූ ප්‍රා.ලේ. කොට්ඨාශ 88 න් 45 ක්ම අයත්වන්නේ 'LL'. වර්ගයටයි. උදා). අඩු ආගමික විවිධත්වයක් ඇති සහ අඩු සංකේන්ද්‍රණයක් ආගමික සුලුතරයක් ඇති ප්‍රදේශයි. ප්‍රා.ලේ. කොට්ඨාශ 19 ක් 'ML' වර්ගයට, එනම් මධ්‍යම ආගමික විවිධත්වයක් ඇති සහ අඩු සංකේන්ද්‍රණයක් ආගමික සුලුතරයක් ඇති ප්‍රදේශයන්ය. මෙම ජනවිකාශන පැතිකඩවල්, ආගමික පහරදීම් සිදුවූ 72% ප්‍රා.ලේ. කොට්ඨාශ වලට අදාල කරගතහැකිය. විවිධත්වයේ සමස්ථ ව්‍යාප්තිය සහ ආගමික සුලුතරයේ සංකේන්ද්‍රණයවීම ඉතිරිවූ 240 ක්වූ:2013 සහ 2014 වසරවලදි කිසිම ආගමික පහරදීමක් වාර්තාවී නැත.) ප්‍රා.ලේ. කොට්ඨාශ හරහා යොදා විශ්ලේෂණය කර බලනවිට 'LL' සහ 'ML' කොට්ඨාශවල ආගමික පහරදීම් ඇතිවීමට සුවිශේෂ ප්‍රවනතාවයක් ඇතිබව තහවුරුවෙනවා.

මෙම නිරීක්ෂණයන් මෙතරම් පැටලිලි සහිත දෙයක් වු කරුනක් වුයේ ප්‍රචණ්ඩත්වය අඩුවෙන් ව්‍යාප්තව තිබෙන්නේ ප්‍රා.ලේ. කොට්ඨාශයන් ඉහල සංකේන්ද්‍රයන් ඇති විශේෂිත සුලුතර ජනවාර්ගික පිරිසක් සිටින නමුත් පහල විවිධත්වයක් ඇත. (උදා). හින්දූන්ගේ ඉහල සංකේන්ද්‍රණයක් තිබෙන නමුත් පහල සංකේන්ද්‍රණයක් ඇති වෙනත් ආගමික කණ්ඩායම් මෙම කොට්ඨාශයේ ඇත). එමනිසා 2013 සහ 2014 දි සිදුවූ වාර්තාගත ප්‍රචණ්ඩ ක්‍රියාවලින්

තුනෙන් දෙකක්ම සිදුවී ඇත්තේ බහුතරය බෞද්ධයින් සිටින අඩු සංකේන්ද්‍රණයක් ඇති සුලුතරයක් සිටින එක්කෝ පහල හෝ මධ්‍යම විවිධත්වයක් ඇති ප්‍රදේශවලයි.

එමනිසා, මෙම දත්තවලින් නැඹුරුවක් මතුවීතිබේ.- මෙම නැඹුරුව තවදුරත් ගවේෂණය කිරීම අනාගත පර්යේෂණ කටයුතු සදහා වටිනා දෙයක් වේ. ආගමික සුලුතරකට පහරදීම සිදුව ඇත්තේ අඩු සංකේන්ද්‍රණයක් ඇති සුලු ආගමිකයින් සිටින ප්‍රදේශවලයි. එසේම පහල සහ මධ්‍යම විවිධත්වයක් ඇති ප්‍රදේශවලයි. මේ අතරතුර, සුලු පහරදීම් කිපයක් වාර්තාවී ඇති ප්‍රදේශවල විවිධත්වය එක්කෝ ඉහල හෝ මධ්‍යම මට්ටමේ ඇත. පහත සදහන් ප්‍රා.ලේ. කොට්ඨාශයන් ‘LL’ හෝ ‘ML’:වශයෙන් වර්ගකරඇත.

**වගුව 2: දිස්ත්‍රික්කයන් සහ ප්‍රා.ලේ.කොට්ඨාශ ඛඛ පැතිකඩයන් සහිත**
**Districts and D.S. Divisions with LL Profiles**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය |
|---|---|
| අම්පාර | මහඔය |
| | අම්පාර |
| අනුරාධපුරය | මැදවච්චිය |
| බ□ල්ල | මහියංගනය |
| කොළඹ | මහරගම |
| | හෝමාගම |
| | පාදුක්ක |
| ගාල්ල | බෙන්තොට |
| | ඇල්පිටිය |
| | ඉමදුව |
| | හික්කඩුව |
| ගම්පහ | දොම්පෙ |
| හම්බන්තොට | අම්බලන්තොට |
| | අඞුණුකොළපැලැස්ස |
| | තංගල්ල |
| | සූරියවැව |
| | වීරකැටිය |
| | වලස්මුල්ල |
| කළුතර | කළුතර |
| | ඉංගිරිය |
| මහනුවර | යටිනුවර |
| | හතරලියද්ද |
| කෑගල්ල | වරකාපොල |
| | රඹුක්කන |
| | රුවන්වැල්ල |
| | කෑගල්ල |
| | අරණායක |
| කුරුණෑගල | නාරම්මල |
| | ඉබ්බාගමුව |
| | ගල්ගමුව |
| | මාස්පොත |
| මාතලේ | දඹුල්ල |
| | නාඋල |
| මාතර | මාතර |
| | අකුරැස්ස |

| | |
|---|---|
| | දික්වැල්ල |
| මොණරාගල | සෙවනගල |
| | බුත්තල |
| පොලොන්නරුව | දඹුලුගල |
| රත්නපුර | ඕපණායක |

**වගුව 3: දිස්ත්‍රික්කයන් සහ ප්‍රා.ලේ.කොට්ඨාශ එබ පැතිකඩයන් සහිත**

**Districts and D.S. Divisions with ML Profiles**

| **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය** |
|---|---|
| අනුරාධපුරය | මල්වතුඔය |
| | පලාගල |
| | කැකිරාව |
| කොළඹ | මොරටුව |
| | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| ගම්පහ | මහර |
| | කැළණිය |
| | ගම්පහ |
| හම්බන්තොට | ගම්බන්තොට |
| කළුතර | පානදුර |
| මහනුවර | හාරිස්පත්තුව |
| කෑගල්ල | මාවනැල්ල |
| | බුලත්කොහුපිටිය |
| කුරුණෑගල | කුලියාපිටිය-නැගෙනහිර |
| | කුරුණෑගල |
| | මල්ලවපිටිය |
| | රිදීගම |
| මාතර | කොටපොල |
| | වැලිගම |
| රත්නපුරය | බලංගොඩ |
| | රත්නපුර |
| ත්‍රිකුණාමලය | කන්තලේ |

වැඩිදුරටත් වැඩිවී ඇති ආගමික ප්‍රචණ්ඩත්වයට ඇති නැම්ම ගැන සලකා බැලිය යුතුය. විෂය අධ්‍යයනයන් දෙකක් මගින් පැහැදිලි කල පරිදි, ආගමිකව වෙනස්වූ ප්‍රදේශයන් සමහර හදිසියේ ඇතිවන ප්‍රචණ්ඩකාරී සිදුවීම්, ඒවා අනිකුත් පැනනගින අනිකුත් සිදුවීම් අභිබවා ගොස් ඇත.ග ග්‍රෑන්ඩ්පාස් සහ අලුත්ගම යන දෙපැත්තේම ඇත්තේ ඉහල මට්ටමක ආගමික විවිධත්වය සහ සුලුතර ආගමික සන්කේන්ද්‍රණයයි. ග්‍රෑන්ඩ්පාස් පිහිටා ඇත්තේ කොළඹ ප්‍රා.ලේ.කොට්ඨාශය තුල අතර එහි ඇත්තේ ‘HH’ පැතිකඩක් වන අතර අලුත්ගම පිහිටා ඇත්තේ බේරුවල ප්‍රා.ලේ.කොට්ඨාශය තුලයි. එහි ඇත්තේ ‘MM’ පැතිකඩකි. මෙම ප්‍රදේශයේ ඇත්තේ සාමාන්‍යයෙන් පහල මට්ටමක ආගමික පහරදීමය. එහෙත් ඔවුන් වරින්වර අතුරු සිද්ධීන් සමග සීමාන්තික ප්‍රචණ්ඩත්වයන් ඇතිකරනවාග

## 2.6 නිදන්ගත සහ දරුණු ප්‍රචණ්ඩත්වය Chronic and acute violence

වෙනස නම් අපි නිරීක්ෂණය කල ‘LL’ දර ‘ML’ කොට්ඨාශයන් සහ ප්‍රසංගික episodic ප්‍රචණ්ඩත්වයන් වර්ගයන් අතර වෙනසයි. ප්‍රසංගික ප්‍රචණ්ඩත්වයන් නිරීක්සණය කලේ ග්‍රෑන්ඩ්පාස් සහ අලුත්ගමදිය. කලින් සඳහන් කල ප්‍රධාන වශයෙන් දිගටම සිදුවන අඩු තත්වයේ ප්‍රචණ්ඩත්වයන්, විස්තර කර ඇත්තේ .නිදන්ගත. ප්‍රචණ්ඩත්වය ලෙසයි. 2013 සහ 2014 දි ශ්‍රී ලංකාවේ සිදුවූ 90% ක්වූ සියලුම ආගමික ප්‍රචණ්ඩත්වයන් සමන්විත වන්නේ තර්ජනය කිරීම් සහ තැතිගැන්වීම්, පහරදීම්, දේපොලවලට කරන සුලු හානි, සහ වෛරී ව්‍යාපාර සහ ප්‍රචාරයන් ආදියෙන්ය. මෙම පහරදීම් විස්තර කරනවා .ආවේනික. ලෙස ඔවුන්ගේ හෙමින් සීරුවේ ඉදිරියටම කරගෙන යන, අඩු වේගයකින් සිදුවන අතර, ඉදහිට පැතිරියනවා විද්‍යාමානවන ප්‍රචණ්ඩත්වයක් විදියට. උදා. ලෙස ජනවාර්ගික කෝලාහලවලදී මෙවැනි ප්‍රචණ්ඩත්වයන් නිරීක්ෂණය කලහැකිවේ. නැවත පටන්ගත් සිදුවීම භූගෝලීය විෂය අධ්‍යයනය වන දකුණු පලාතේ සිදුවුන ක්‍රිස්තියානි විරෝධී පහරදීම් මේ ගනයට වැටෙන නිදන්ගත ප්‍රචණ්ඩත්වයයි. සොයාගත් ‘LL’ සහ ‘ML’ කොට්ඨාශ සාපේක්ෂකව යමක් දෙසට නැමුනු ප්‍රචණ්ඩත්වය සොයායන බැවින් නිදන්ගත ප්‍රචණ්ඩත්වය යන තේරුමට සුදුසුකම් ලබයි. එයට පරස්පර විදියට, පසුව විස්තරකල ප්‍රසංගික විදියේ (episodic form) ප්‍රචණ්ඩත්වයන් විටින්විට ඇතිවන ස්වභාවය සහ වේගවත් කමින් වැඩිබවත් නිසා .දරුණු. ප්‍රචණ්ඩත්වයක් ලෙස. එය විස්තර කරන්න පුලුවන්. මෙවැනි ප්‍රචණ්ඩත්වයන් ඕනෑම තැනක වැරදිමගක් උඩ, පෙළඹවීම් උඩ, හදිසියේ ඉස්මතුවෙන සිදුවීමක් උඩ, මෙලෙස දරුණු ප්‍රචණ්ඩත්වයක් සිදුවිය හැකියි. මෙවැනි දරුණු ප්‍රචණ්ඩත්වයක් ඉහල මට්ටමේ විවිධත්වයක් සහ ඉහල සංකේන්ද්‍රණයක් ඇති ආගමික සුලු පිරිස් සිටින ප්‍රදේශයක ඇතිවෙන්න පුලුවන්.

නිසැකවම, ආවේනිකවූ සහ දරුණු ප්‍රචණ්ඩත්වයන් වෙන්කරන රේඛාව හැම වෙලාවේම පැහැදිලි නැත. උදාහරණ වශයෙන්, 2014 ජනවාරි 12 වෙනිදා, බෞද්ධ භික්ෂුවක් විසින් මෙහෙයවනු ලැබූ 300 පමණ වූ කලහාකාරී පිරිස් විසින් හික්කඩුවේ ‘LL’ කොට්ඨාශකය පිහිටි පල්ලි දෙකකට පහරදී හානිකලේය. මෙම සිදුවීම ප්‍රචණ්ඩත්වය යන වර්ගීකරණයට පිළිවෙලකට වැටෙන්නේ නැත. මෙය දරුණු ප්‍රචණ්ඩත්වයක් ලෙස වර්ගීකරණය කලහැකි බවට තර්ක කලහැකියි. මෙම සිද්ධිය හටගත්තේ හික්කඩුවේ සිදුවූ විශේෂිත නිදන්ගත ප්‍රචණ්ඩත්වය ඇතිවීමත් සමගය. ඒ ගැන මෙම විෂය අධ්‍යයනයේදි නැවත තොරතුරු සපයා ඇත. එමගින් නිදන්ගත සහ දරුණු ප්‍රචණ්ඩත්වයන් අතර ඇති සම්බන්ධතාවයන් පැහැදිලි වෙනවා. එය තවදුරටත් සහතික කරනවා කලින් ඇතිවූ සිදුවීමත් සමගම බොහෝවිට තැනින් තැන ඇතිවන මතුවීම් පසුව පැමිනෙනවා.

එසේවුවත්, හික්කඩුවේ සිදුවීම, ග්‍රෑන්ඩ්පාස් සහ අලුත්ගමදි දැකපු ප්‍රචණ්ඩත්වය එහි ප්‍රමානය සහ එය සිදුවූ වේගය ගැන සලකාබලන විට එය හා සංසන්ධය කරබැලීමට නොහැකියි. එමනිසා එය ඉහල මංපෙත්තක් නියම කිරීමට එය දරුණු ගනයේ ප්‍රචණ්ඩත්වයක් ලෙස වර්ගකිරීමට වැදගත් වෙනවා :කොහොම නමුත්, මෙම පහරදීම නිසා සිදුවූ හානියේ බරපතලකම තීරණය වන්නේ ඒස සමගම මෙම පහරදීමට පැමිණි පුද්ගලයින් සහ පහරකෑම නිසා විපතට පත්වූවන් අනුවයි.- එවැනි මංපෙතක් (threshold) යොදාගත්තක් ඉන් ප්‍රත්‍යක්ෂ වෙනවා ඉහල සහ මධ්‍යම විවිධත්වයක් ඇති පුදේශවල දරුණු ප්‍රචණ්ඩත්වයන් සිදුවෙන්න පුලුවන්. මෙම නැඹුරුව සහජ ඥණයක් ඇතිකරනවා, ආගමික කණ්ඩායම්වලට එරෙහිව සිදුකරන පැතිරීගිය ප්‍රචණ්ඩත්වයන් මැඩලීමට ඉහල සංකේන්ද්‍රණයක් ඇති කණ්ඩායම් අවශ්‍ය වෙනබවට. ඉලක්කගත කණ්ඩායම් විශාල නොමැති කමත්ද, ඒ සඳහා ක්‍රියාකිරීමට බලය නොමැති හෙයින් පැතිරයන පහරදිම්වලට මුහුනදිමට නොහැකි නිසා පහල මට්ටමක විවිධත්වයක් ඇති ප්‍රදේශයන්වල දරුණු ප්‍රචණ්ඩත්වයන් ඇතිකරයි. මෙයට හාත්පසින්ම වෙනස්ව, ඉහල විවිධත්වයක් ඇති ප්‍රදේශයන්හි ජිවත්වන සැලකියයුතු සුලුජාතික ජනගහනයට හදිසියේ ඇතිවී පැතිරගෙනයන දරුණු ගණයේ ප්‍රචණ්ඩත්වයකට මුහුණදිමට සිදුවේ. ඊලග කොටසින් සාකච්ජා කලපරිදි, විශේෂිත දේශීය සන්දර්භය බොහෝවිට ඇතිකරගත් වැරදි මාර්ගයන් නිසා මෙම විවිධත්වයක් ගත් ප්‍රදේශයන් අන්ත ප්‍රචණ්ඩත්වයකට ලක්වේ. ග්‍රෑන්ඩ්පාස්

සහ අලුත්ගමදි දක්නට විදියට, එවැනි ප්‍රචණ්ඩත්වයක් හදිසියේ මතුවූ සිදුවීමකින් සංවිධානවූ වෛරී කණ්ඩායම් විසින් වරින්වර කුපිතකරනු ඇත.

නිදන්ගත සහ දරුණු ගනයේ ප්‍රචණ්ඩත්වයන් අතර වෙනස තේරුම්ගැනීම සහ විශේෂිත ජනවිකාශන ලක්ෂණ අනුව ඒවාහි පැතිර පැවතීම සහ සන්දර්භවය අනුව, අනාගත ප්‍රචණ්ඩත්වයන් මැඩලීමට අවශ්‍ය මූලික කරුණවේ. ̧එවැනි තේරුම්ගැනීමකින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට අනාගත මැදිහත්වීම් සඳහා සහාය විය හැකියි.නීති ක්‍රියාත්මක කරන නිළධාරීන් සහ සාමය ගොඩනැගීමේ උත්සාහයන් සඳහා මෙම තේරුම්ගැනීමෙන් ප්‍රයෝජන ලබනු ඇත. මේ සම්බන්ධව සිදුකලහැකි මැදිහත්වීම් ගැන මෙම අධ්‍යයනයේ සමාප්ති කොටසේදි සාකච්ඡා කරනු ඇත.

## 3ග ආගමික ප්‍රචණ්ඩත්වයේ සන්දර්භය Context of Religious Violence

කලින් කොටසේ සාකච්ඡා කලපරිදි, 2013 සහ 2014 වසර වලදි හදිසියේ සිදුවූ ආගමික පහරදීම්වලින්, සුලු-ජනවාර්ගිකයින් කළඹන ඔවුන්ට විරෝධී මතයන් ගොඩනැගීමේ නැඹුරුවක් ඇතිබව අනාවරණය කරනවා. පසුගිය වසර දෙක තුල සිදුවූ ප්‍රසාංගික ප්‍රචණ්ඩත්වයන් කරා වර්ධනය වීම වෛරී ව්‍යාපාරයන් මගින් කලින් සිදුකල අතර එමගින් නිදන්ගත දරුණු ප්‍රචණ්ඩත්වයන් අතර ඇති සම්බන්ධතාවය තවත් ශක්තිමත් විය.ග උදාහරණ වශයෙන,̔ බොදුබලසේනාව (BBS) වෛරී ව්‍යාපාරයන් කිහිපයක් මුස්ලිම් ප්‍රජාවට විරුද්ධව දියත්කර ඇත මින් ඉතා ප්‍රසිද්ධ ව්‍යාපාරය වූයේ 2013 දි සිදුකල හලාල් විරෝධී ව්‍යාපාරයයි.[76] මෙම ව්‍යාපාරය විශාල වශයෙන් සාර්ථකවූ අතර එහි ප්‍රතිඵලය වූයේ සමස්ත ලංකා ජම්යතුල් උල්මා ඔවුන්ගේ හලාල් සහතිකය, දේශීය වෙළඳපොලේ ඇති සියලුම නිශ්පාදනවලින් ඉවත්කර ගැනීමයි.[77]

මාස ගණනක් තිස්සේ මුස්ලිම් ප්‍රජාවට විරුද්ධව කල වෛරී ව්‍යාපාරයන් සහ ප්‍රචාරක කටයුතු උච්චස්ථානයට පැමිණීම සහ ආගමික නොඉවසුම් ගතිය ස්ථිර වශයෙන් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස 2014 ජුනි මස සිදුවූ අලුත්ගම කෝලාහලය පෙන්විය හැකිය. .අලුත්ගම ඇත්ත වශයෙන්ම, නොඉවසුම් ගතියේ උච්ච ස්ථානයට පැමිණීමට මූලිකවූ, නොඉවසුම් ගතිය පැනනැගීමට හේතුවූ සන්දරභයේ ආකාරය ගැන විමසීම එසේම වැදගත් වෙනවා. පහත සඳහන් උප කොටස්, ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වයන්ට හේතුවූ සන්දර්භානුගත පසුතිරයන් :ජදබඑංඑමක ඉ්ජනාරදච- ඒ අනුව ගවේෂණය කරබලනවා. එසේම, කොහොම නමුත්, තනි හේතුවක් හෝ කරුනු වලින් ප්‍රචණ්ඩත්වය තේරුම්කර දීමට නොහැකිය. පශ්චාත් යුද්ධ සමයේ එය බොහෝ ව්‍යාජ කරුණක් වන්නේ, විවිධ සන්දර්භානුගත කරුණුවල සම්මිශ්‍රණයකින් ආගමික නොඉවසුම් ගතිය වැඩිවීමට සහ ආගමික ප්‍රචණ්ඩත්වය මතුවීමට දායකවීමයි. තවදුරටත්, ඉදිරිපත් කරන ඒකක වලට වෙන්කිරීම පහත සඳහන් කොටස්වල/විවිධ සන්දර්භයන්:උදා. සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භයන්- අඩුකර දැක්වීමට සහ වරින්වර සිදුවෙන අන්‍යෝන්‍ය වෙරගැන්වුම්, සන්දර්භානුගත සාධකයන් අතර සේවයේ යෙදවීම නොකල යුතුයිග

### 3ග1 සමාජ-සංස්කෘතික සන්දර්භය Socio-cultural context

සසංක පෙරේරා බුද්ධාගම සහ සිංහල ජාතිය ආරක්ෂා කිරීම සඳහා ඉතිහාසය නැවතවරක් කියාසිටිමින් බෞද්ධ භික්ෂූන් විසින් මහාවංශයේ විස්තර කරන පරිදි සිංහල පාලකයින් විසින් යුද්ධ ව්‍යාපාරයක් පවත්වාගෙන ගියබවට ප්‍රකාශකර සිටිනවා.[78] ඔහු හිම්කම් පාමින් දක්වන්නේ මෙම වාර්තාවන් අවසාන වශයෙන් සිංහල බහුතරයක විඥාණයට බලපවත්වනවා සහ සමකාලීන ශ්‍රී ලංකාවේ වැදගත් පෙනුමක් ඇතිකරනවා.[79] 19 වන ශතවර්ෂය අවසාන

[76] බලන්න ධාරිෂ බැස්ටියන්, 'මේ සිංහල රටයි, සිංහල රජයයි'': බොදුබලසේනා' *Daily FT*, 18 February 2013, at http://www.ft.lk/2013/02/18/this-is-a-sinhala-country-sinhala-government-bodu-bala-sena.

[77] බලන්න කුසුම් බණ්ඩාර, 'Govt. to formulate new Halal mechanism'. *The Daily Mirror*, 14 March 2013.

[78] Sasanka Perera, *op. cit.* at 4.

[79] *Ibid*. at 8.

භාගයේ මතුවූ සිංහලයින් පනගන්වන ව්‍යාපාරය නිසා සිංහල-බෞද්ධ ජාතිමමත්වය ඇතිකරවන කතන්දරයන්/විස්තරයන් පැතිරවීමට උනන්දුව ඇතිකරන කරුනක් විය. 1948 දී ශ්‍රී ලංකාව ස්වාධීනත්වය ලබාගත් කාලය වනවිට, සිංහල-බෞද්ධ ජාතිමමත්වය ප්‍රමුඛ මතවාදයක් ඇතිකරන ශක්තියක් විය. [80]

අධ්‍යාපන විෂයමාලාවේ පාඩම් පොත් ඇතුලුව, සිංහල බෞද්ධ ජාතිය, ගැන කතන්දරවලින් සවිබලගන්වා ඇත. අදටත්, ඉතිහාස පාඩම් පොත්වලට විශාල වශයෙන් සහ අවිචාරවත් ලෙස මහාවංශයෙන් කරුනු උකහාගෙන ඇත. අදටත්, 6 වන ශ්‍රේනියේ ඉතිහාස පෙලපොතේ 6 වන පරිච්ඡේදයෙන් ක්‍රි.පූ 161 සහ 137 කාලයේ සිටි එලාර රජු පැරදූ දුටුගැමුණු රජු ගැන සවිස්තරාත්මක විස්තරයක් දක්වා ඇත. මෙම පෙළපොතේ කතාන්දරයන් කෙලින්ම මහාවංශයෙන් අරගෙන ඇති අතර, එය සදහන් කරන පරිදි ද්‍රවිඩ පාලකයා .විදේශකයකු. බවත්, සිංහල පාලකයාගේ ඉලක්කය වූයේ .රට විදේශ ආධිපත්‍යයෙන් නිදහස් කරගැනීමයි., .රට නැවත එක්සත් කිරීම. සහ .බුද්ධාගම ආරක්ෂා කිරීමයි.. සිත්ගන්නා කරුන වූයේ මෙම පෙලපොතේ දෙමල භාෂාවෙන් නිකුත්කල පිටපතට-අනුව එය සකස්කර ඇත්තේ-සිංහල නොවන දෙමල සහ මුස්ලිම් ලමුන් සඳහායි. එයි දැක්වෙන්නේ-සිංහල පිටපතට වඩා වෙනත් සකස්කිරීමකි. උදාහරණ වශයෙන්, සිංහල පිටපතේ පරිච්ඡේදයේ අවසාන ජේදයන් සදහන් කරන්නේ දුටුගැමුණු රට විදේශ පාලනයෙන් නිදහස්කරගත් බවත් රට වසර 44කට පසුව එක්සේසත් කලබවයි. එම සමාන ජෙදයන් දෙමල පිටපතේ දැක්වෙන්නේ අවුරුදු 44 කට පසුව පලමුවරට අනුරාධපුරය අල්ලාගත් බවයි. එහි එළාර සාධාරනව රට පාලනය කල බවයි. [81]

ස්වාධීනත්වය ලැබීමට ප්‍රථමයෙන්, ශ්‍රී ලංකාවේ සමාජීය දේශපාලන ජීවිතයේ ප්‍රසිද්ධ සංකල්පවාදි පිරිසක් ලෙස, සිංහල බෞද්ධ ජාතිවාදය මතුවීමට පටන්ගත් බව කතෘවරුන් වන රිචඩ් ගොම්බ්‍රිච් සහ ගණනාත් ඔබේසේකර ප්‍රකාශ කරනවා. නව ජාතිවාදි-ආගම්වාදි මතවාදය සම්ප්‍රදානුකූල බෞද්ධ ප්‍රතිපත්ති වලින් කැඩීගිය අතර එය කූට රෙපරමාදු කරන වූ බුද්ධාගමක්වූ අතර එය සිංහල බෞද්ධ ජාතිය යන අදහසට සෑහෙනදුරට නැමෙන සුලුවූ එකකි.[82] මේ තත්වය යටතේ සිංහල බෞද්ධ ජාතිය රැකගැනීමට බලය යෙදීම, ඉවතලන්නේ නැත. දුටුගැමුණු විසින් එළාර පරාජය කලාසේම. ප්‍රචණ්ඩත්වය බුද්ධාගම සමග එකට සම්බන්ධවී සිටින්නේ අනාදිමත් කාලය සිට, එනම් 1915 සිට ජනවාර්ගික කලකෝලාහල, මහනුවරදී මුස්ලිම්වරුන් විසින් බෞද්ධ පෙරහැරකට පහරදීම නිසා ගිනිපුපුරුසේ මතුවුනා [83] කෝළාහලය, බෞද්ධ ජාතිවාදයට සම්බන්ධ බවට පුලුල් සමාජ සංස්කෘතික හෝ දේශපාලන උනන්දුව ඇතිකරන කරුනුද යන්න, තවමත් යෝජනා කරන්න කිසිම සාක්ෂියක් නැත. මෙම සම්බන්ධය පැහැදිලිවූයේ තරමක් කල්ගතවූ පසුවය. පශ්චාත්-ස්වාධීන කාලයේදී, සිංහල බෞද්ධ ජාතිවාදය මතුවීම සහ ස්ථාපිතවීම ප්‍රවේශමෙන් වංශකථාවේ සටහන් කරඇත. ප්‍රචණ්ඩත්වය ඇතිවීමට, බෞද්ධ ආයතනවල හදවත්වල මූලයේ ඇතිවන මතවාදයන් අවසානයේ හේතුවෙන බවට ගොම්බ්‍රිජ *et al*, තර්ක කරනවාග.[84] මෙම නිරීක්ෂණයන් ප්‍රකාශකලේ 1987 ඉන්දු ලංකා ගිවිසුමට විරුද්ධව පැවති බෞද්ධ භික්ෂූණ්ගේ ප්‍රචණ්ඩ ප්‍රතිචාර අනුවයි. ඉන් බලාපොරොත්තු වූයේ රටේ උතුරු සහ නැගෙනහිර පලාත්වල අර්ධ-ස්වයංපාලනයක් ඇතිකරගැනීමයි. මෙම නිරීක්ෂණ සන්දර්භගතකිරීමෙන්, පිළිගත්

[80] Richard Gombrich & Gananath Obeyesekere, *Buddhism Transformed: Religious Change in Sri Lanka* (1988), at 202-238.

[81] R.A.L.H. ගුණවර්ධනගේ අර්ථනිරූපනයට අනුව, මහාවංශයේ මුල් ග්‍රන්ථය සහ වෙනත් ඓතිහාසික මූලාශ්‍ර අනුව, දුටුගැමුණුගේ ව්‍යාපාරය වූයේ සිංහල-දෙමල ඝට්ටනය නොවේ. ගුණවර්ධන තර්ක කරනවා මෙම ව්‍යාපාරය හුදෙක් මුල්කරගන්නේ. එළරගෙන් පමණක් නොව අනිකුත් බහුවිධ ප්‍රාදේශීය නායකයන්ගෙන් භූමි ප්‍රදේශය අල්ලාගැනීමයි. බලන්න See R.A.L.H. ගුණවර්ධන, 'The People of the Lion: The Sinhala Identity and Ideology in History and Historiography' (1979) 5(1) & (2), The Sri Lanka Journal of the Humanities 1-36.

[82] රිචර්ඩ් ගොම්බ්‍රිජ් සහ ගණනාත් ඔබේසේකර, *Buddhism Transformed: Religious Change in Sri Lanka* (1988).

[83] කුමාරි ජයවර්ධන, '1915 කෝළාහලයේ ආර්ථික සහ දේශපාලන සාධක (Economic and Political Factors in the 1915 Riots') (1970) 29(2) The Journal of Asian Studies 223-233.

[84] Gombrich & Obeyesekere*, op. cit.* at x.

අහිංසාවාදි ආගමික ප්‍රතිපත්තියක් තිබියදිත්, ජනවාර්ගික ජාතිමමත්වයක් මතුවුයේ ඇයි විවේචනාත්මකව විස්තරකිරිම අපහසුවේ.[85]

පශ්චාත්-යුද්ධ සමයේ, මෙරට මුස්ලිම් විරෝධී මතයන් අන්තගාමි ලෙස වැඩිවීම ගැන සාක්ෂි දරයි. සිංහල-බෞද්ධ ජාතිමමත්වය මුලින්ම යොමුවුයේ දසක කිපයක් තිස්සේ පැවති ද්‍රවිඩයින් අතර තිබු ජාතිමමත්වය කොටස් වශයෙන් බිඳදැමීම, යුද්ධය අවසානවීමත් සමගම එය දැන් යොමුවී ඇත්තේ මුස්ලිම්වරුන්ට විරුද්ධවයි. 1981 සිට ශ්‍රී ලංකාවේ යෝනක ජනගහණ කොටස/භාගය විද්‍යාමාන ලෙස වැඩිවීම නිසා සැකය/භිතිය වැඩිවීමට පටන්ගැනිම :මුලු ජනගහනය 7.05% සිට 9.23 දක්වා වැඩිවීම- සහ මුස්ලිම්වරු ආර්ථිකය පාලනය කරනබව දැකිම- ඊලග කොටසින් මෙම සංකල්පනය විස්තර සහිතව ගවේශනය කරනු ඇත. මෙම සැකයන් ඊරීග බොදුබලසේනා වැනි සමහර අන්තවාදි සිංහල කණ්ඩායම් මතුවිම මගින් මෙම කණ්ඩායම ඔවුන්ගේ අවධානය මුලමනින්ම පාහේ යොමුකලේ මුස්ලිම් විරෝධි හැගීම් ප්‍රචාරය කිරීමටයි. දකුණේ සිටින මුස්ලිම්වරුන් වෛරී ව්‍යාපාරයට සහ සංවිධානවූ ප්‍රචණ්ඩ ක්‍රියාවලට ඉලක්කයක්විය. මෙම නොඉවසුම් ගතිය උච්චස්ථානයට පත්ව අලුත්ගමදි මුස්ලිම් විරෝධි කෝලාහල සිදුවිය. එය තවදුරටත් කුපිත කලේ එදිනම BB විසින් කරන ලද වෛරී කථාවන් නිසාය. රජය බොහෝදුරට උදාසීනවීමෙන් ප්‍රචණ්ඩත්වය දරාසිටිමෙන් සහ එහි විපාකයට සමාව ඉල්ලා නොසිටින අතර, ප්‍රචණ්ඩත්වය සඳහා කුපිත කරවීම ගැන මුස්ලිම්වරුන්ට දෝෂාරෝපණය පැවරිය.[86]

මේ අතරතුර, ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ විවිධ අවස්ථාවලදි, ක්‍රිස්තියානි කණ්ඩායම්වලටද ප්‍රචණ්ඩත්වයට මුහුණුදිමට සිදුවිය. වෙරළාසන්න ප්‍රදේශයන්, විශේෂයෙන් බටහිර වෙරලතිරයේ, සැළකියයුතු ක්‍රිස්තියානි ජනගහණයක් සිටින්නේ, වසර 500 පෙර යුරෝපීය යටත්විජිත පිහිටුවීම සහ ජනතාව ක්‍රිස්තියානිකරණයවීම සමගම එය අනුගමනය කිරීමට පෙළඹීමේ ප්‍රතිඵලයක් ලෙසයි. යටත්විජිත සමයේදි, ඉංග්‍රීසි කථාකරන ප්‍රභූ පන්තිය ඉතා ප්‍රබලලෙස ක්‍රිස්තියානුවන් වූ අතර ආර්ථිකව අනිසි අනුග්‍රහ ලැබූ අතර දේශපාලන අනුග්‍රයද භුක්ති වින්දේය. එසේ ඓතිහාසික එදිරිවාදිකම් සහ ජාතිභේදවාදි වැරදි මාර්ගයන් ක්‍රිස්තියානුවන් සහ බෞද්ධයින් අතර පැවතුනි. එවැනි නොඉවසුම් ගති නිසා වරින්වර ගැටුම් ඇතිවිය.

ක්‍රිස්තියානිවරුන්ටව විරුද්ධව පුලුල් පරාසයක් තුල සිදුකෙරෙන ප්‍රචණ්ඩත්වය සාපේක්ෂ වශයෙන් අලුත් සංසිදියක් වන අතර එය තවදුරටත් සම්පූර්ණ නිවැරදිබවින් අධ්‍යයනය කලයුතුවේ. කොහොම නමුත් ප්‍රධාන නොඉවසුම් ගතිය මෙම ප්‍රජාවන් අතර ඇතිවන්නේ ප්‍රශ්නය රඳා පවතින ප්‍රධාන කරුන වන ප්‍රචාරණයයි.-බොහෝවිට යොදාගන්නා වචනය වන .හැරවීම. ගැනයි. ක්‍රිස්තියානි ඇවන්ජලිකල් නිකාය ඉලක්ක කරගන්නේ ආගම ප්‍රචාරය කිරීමටයි ඉන් ව්‍යවස්ථාවේ මුලධර්මයන් සමග වාසි අවාසි තත්වයක් ඇත. ව්‍යවස්ථාවෙන් අපේක්ෂා කරන්නේ බුද්ධාගම ආරක්ෂා කිරීමට සහ පෝෂ්‍ය කිරිමයිග ඉහත සාකච්ජා කල පරිදි, ආගමක් ප්‍රචාරය කිරීම ගැන, බුද්ධාගම හැරෙන්නට අනිත් සියලුම ආගම්

[85] Gunatilleke, *Confronting the Complexity of Loss*, *op. cit.* at 8. ගණනාත් ඔබේසේකරගේ නිරික්ෂණ The observations of Gananath Obeyesekere in 'Buddhism, Ethnicity and Identity: A Problem of Buddhist History' (2003) 10 Journal of Buddhist Ethics 192-242, at 192 is perhaps worth reproducing: 'බටහිර උගත් වියතුන් අපෙන් නිතරම අසන ප්‍රශ්නයක් වන්නේ ඇයි බුදුදහම වැනි ප්‍රචණ්ඩත්වයෙන් තොර අහිංසාවාදය ගරුකරන ආගමක් ඇති ශ්‍රී ලංකාවේ ජනතාව පසුගිය දසක දෙකතුල ඉතා දරුණු ගනයේ ප්‍රචණ්ඩත්වයක් ඇතිවූ සංස්කෘතියක් ඇතිවූයේ කෙසේද යන්නයි, මගේ අදහස, එය පැහැදිලි ප්‍රශ්නයක් වුවත් එය ඇසියයුතු වැරදි ප්‍රශ්නයක් වේ. බුද්ධාගම ලෝකයේ අනිත් ආගම් වගේ නොව ජාතියට තර්ජනයක් වන විශාල සමාජ සහ ආර්ථික විපත්වලට/දුකට ප්‍රතිශක්තියක් ලෙස රැදෙනවා. කොහොම නමුත්, යමෙකුට අසන්න පුලුවන් අදාල ප්‍රශ්නයක්: බෞද්ධ ගිහියන්-ජනයා සහ භික්ෂුන්ට, සමකාලින ජිවිතයට විචාරාත්මක පරික්ෂාවක් ගෙනඒම මගින් යම් බලපෑමක් ඇතිකිරීමෙන් සමාජයේ නව දැක්මක් ඇතිකිරීම සැලකිල්ලට ගන්න පුලුවන්, බෞද්ධ ආගම පිළිබඳවූ වටිනාකම් අනුව, විනාශකාරි සිංහල ජාතිමමත්වය දෙසට යනවට වඩා යමෙක් හොදින් කිරීමට පුලුවන් වේ."

[86] P.K. බාලචන්ද්‍රන්, 'Sri Lankan Government Accuses Muslims, President Orders Probe', *New Indian Express*, 22 June 2014, at http://www.newindianexpress.com/world/Sri-Lankan-Government-Accuses-Muslims-President-Orders-Probe/2014/06/22/article2293193.ece.

දෙස රජයේ සියලුම ආයතනයන්, අධිකරණයත් ඇතුලුව බලන්නේ ඉතාමත් සැකයෙනි. ග කොහොමනමුත්, ශ්‍රී ලංකාවේ ආගම් ප්‍රචාරය කිරීමට ප්‍රසිද්ධව උත්සාහ කිරීම බුද්ධාගම ප්‍රමුඛතාවය තිබෙන සමාජ-සංස්කෘතිකයට තර්ජනයක් ලෙස දකින අතර සහ එවැන්නකට තදින් විරෝධය පානුඇත. එවැනි විරෝධතා ප්‍රචණ්ඩත්වයට පත්වූ සිදුවීමක් 2014 ජනවාරි 14 දින කලහකාරී පිරිස් භික්කඩුවේ පල්ලි දෙකකට පහරදීමෙන්, එහි දේපොලවලට විශාල හානියක් සිදුවීමෙන් දැකිය හැකිය.[87]

මේ තත්වය යටතේ, ආගමික ප්‍රචණ්ඩත්වය යනු වර්තමානයේ ඇති අන්තර් ආගමික නොඉවසීම ස්වභාවිකව උච්චස්ථානයට පැමිනිමයි. මුස්ලිම් ජනගහනය පුලුල්වීම සහ ක්‍රිස්තියානි ප්‍රචාරණය ඉලක්කයන් නිසා, සිංහල-බෞද්ධ ජාතිමමත්වයට-ඇති ඓතිහාසික හිම්කම සිංහල-බෞද්ධ අයිතිය-මූලිකවගයෙන් රැදෙනබව දකිනවා. පශ්චාත්-යුද්ධ සමයේ මතුවූ බොහෝ ප්‍රචණ්ඩත්වයන් මෙම සමාජ-සංස්කෘතික ගැටීම් (underscore) නිසා ඇතිවූ දේවල්ය.

### 3ග2 ආර්ථික සන්දර්භය Economic context

ආගමික ප්‍රචණ්ඩත්වයෙහි ආර්ථික සන්දර්භය, කලින් ප්‍රකාශයට පැමිණ තිබුන ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රචණ්ඩත්වයට සමාන්තරව ඇත. නිව්ටන් ගුණසිංහ ඔහුගේ නිබන්ධනය, *The Open Economy and its Impact on Ethnic Relations in Sri Lanka*, විවෘත ආර්ථිකය සහ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සම්බන්ධතා. නිව්ටන් ගුණසිංහ කියා සිටිනවාට ජනවාර්ගික ගැටුම් නිතර නිතර සිදුවුනේ 1977 වසරේ සිටයි.[88] 1955-1977 අතර දේශපාලන අනුග්‍රාහක ව්‍යුහයක් සටහන් කල රටේ ආර්ථිකය 1977 දි ගලවා වැටුනබව ඔහු පෙන්වාදුන්නාත විවෘත ආර්ථික ප්‍රතිපත්ති නව සහ අනපේක්ෂිත නොඉවසුම් ඇතිකලා. 1977 පෙර, .සමහර අංශවල සිංහල ව්‍යවසායකින් දේශපාලන අනුග්‍රහයක් වශයෙන් විශේෂ සහනයකයක් ලබාගැනීමට බලාපොරොත්තුවුනා.. ගුණසිංහ තර්ක කරනවා, .රජයේ රෙගුලාසි අහෝසිකිරීමත් සමග එවැනි සහන ලබාගැනීමේ හැකියාව අතුරුදහන්විය.. වෙළදපොල බලවේග සහ ණය ලබාගැනීමේ හැකියාව උඩ ආර්ථිකයේ සාර්ථකත්වය තිරණයවිය.[89] ඔහු තවදුරටත් පෙන්වා දෙනවා 1977 ට පෙර තිබූ නරක තත්වයට රජය වගකිවයුතුබව පෙනියන්නේ අඩු වැටුප්, ඉහල රැකියාවියුක්තියක්, ජීවන තත්වය පිරිහියාම එම ලකුණුවලින් පෙනේ.[90] මෙලෙස ඉච්චිභංගය සහ ආරවුල් ඇතිකරගැනීම නාගරික දුපපතුන්ට දැනුන නිසා ඔවුන් රජයට විරුද්ධ දෙසට යොමුවුනා, අන්තිමේදි එය මුදුන්පත්වුයේ 1976 දි සිදුවූ වර්ජන රැල්ලකිනි.[91]

1970 අගභාගයේ සහ 1980 මුලදි, නාගරික දුප්පතුන් අතර තිබූ අදහස වුයේ දෙමල භාෂාව කථාකරන ව්‍යවසායකයින්ට විවෘත ආර්ථිකය නිසා බොහෝදුරට ලාභ ප්‍රයෝජන ලැබුනා සිංහල ව්‍යවසායකයින්ට වඩා, එමනිසා ඔවුන් ප්‍රධාන ප්‍රවාහය විය. පිටකොටුව වෙළදපොල, උදාහරණයක් වශයෙන් මෙම සංසිධිද්ධිය නියේජනය වේ.[92] තවදුරටත්, මේ කාලය තුල පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පුලුල්වී ඇත, දේශපාලන අනුග්‍රහයක් නැතිව පුරවැසියන්ට නව රැකියා ලබාගැනිම සඳහා ඉඩප්‍රස්තා ඇතිකිරීමද සිදුවී ඇත. මෙම මාරුව නිසා සුලුජාතින්ට අත්‍යාවංශ වාසියක් ඇතිනොවේ. කොහොමනමුත් අනිත් කරුන වන්නේ පුද්ගලික අංශයේ වැඩකරන භාෂාව වන්නේ බොහෝදුරට ඉංගිරිසි භාෂාවයි., සිංහල-භාෂාව කථාකරන රැකියා සොයන්නන් ඉංගිරිසි භාෂාව දන්නා ප්‍රභූවරුන්, අනිකුත් ජනවාර්ගිකයින් ඇතුලුව, සමග තරගකාරීත්වයක් නැතිවිය. වැදගත් කරුන වන්නේ, මෙම නව සංවර්ධනය,

---

[87] ‘Video: Buddhist Monk Led Mob Attacked Christian Church’, *colombotelegraph.com*, 13 January 2014, at https://www.colombotelegraph.com/index.php/video-buddhist-monk-led-mob-attacked-christian-church.

[88] Newton Gunasinghe, ‘The Open Economy and its Impact on Ethnic Relations in Sri Lanka’ in Michael D. Woost (Ed.), *Economy, Culture, and Civil War in Sri Lanka* (2004), at 99.

[89] *Ibid*. at 102.

[90] *Ibid*. at 107.

[91] *Ibid*. at 108.

[92] It is noted that economic stereotypes of Tamils and Muslims as better at business, and antagonisms between majority and minority communities over business space predated 1977. Also see Jayawardena, *op. cit*. and S. J. Tambiah, *Sri Lanka: Ethnic Fratricide and the Dismantling of Democracy* (1986), at 52.

1977ට පෙරතිබුන කාලය සමග බලන විට, තියුනු අසමානතාවයක් පැවතුනි. සිංහල කතාකරන (demographic) පිරිස් රාජ්‍ය අංශය, බලවත් කම්කරු කණ්ඩායම-පොදුවේ ගත්කල, ප්‍රධානත්වය ගෙන සිටියේය.[93] පශ්චාත්-1977 යුගයේදී, රටේ ආර්ථිකය මෙහෙයවූ යාන්ත්‍රණය, රාජ්‍ය අංශය වෙනුවට පෞද්ගලික අංශය විසින් කරනලදී. මේ තත්වය යටතේ සිහල නොවන රැකියා සොයන්නන්, විශේෂයෙන් ඉංගිරිසි හොදින් දන්නා අයට, කලින් රාජ්‍ය අංශය මෙහෙයවූ රැකියා වෙළඳපොලෙන් අනර්ථයක් සිදුවූයේ නැත. මෙයින් සුලුජන කොටස්වලට පෞද්ගලික අංශයේ රැකියා සුරක්ෂිතතාවය ඇතිබවට හැගීමක් ඇතිවූ අතර සිංහල තරුණ කොටස්වලට රැකියා විරහිතව සිටීමට සිදුවිය.

පශ්චාත්-1977 යුගයේදී, මෙම ආර්ථික සංවර්ධනයන් සිංහල සහ දෙමල ප්‍රජාවන් අතර නොඉවසුම් ගතිය underscore වැඩිකිරීමට හේතුවිය. මෙම නොඉවසුම් ගතිය අවසාන ප්‍රතිඵලයවූයේ 1983 ජුලි මාසයේදී සිදුවූ දෙමල විරෝධී (pogrom) වදබන්දනයට ලක්වීමබව ගුණසිංහ අවසානයේදී සදහන්කරයිට

> නාගරික දුප්පතුන් අතරවූ අසතුටුදායක කොටස්, ඔවුන්ගේ එදිරිවාදිකම් කලින් රජයේ රෙගුලාසිවලට එරෙහිවකල විදියට, රජයට විරුද්ධව එල්ලකලේ නැත. ආර්ථිකය ගැනවූ රජයේ කාර්යයභාරය අඩුම වශයෙන්වූ බව පෙනිගිය බැවින්, වර්තමානයේවූ ව්‍යාධියට පිළියමක් ලෙස වෙනත් කරුනක් එදිරවාදිකමක් ලෙස සොයාගැනිමට සිදුවිය. හරියටම මෙතැනදී ඔවුන්, කලින් එය මධ්‍යම-තලයේ සිටි වෙළෙන්දන් අතර ඇතිවූ උග්‍ර සිංහල ජාතිවාදී මතය සිංහල සමාජතල ගිලගැනීමට සරුබිමක් ලෙස මෙම ජාතිවාදය යොදාගත්තා.[94]

1983 ජනවාර්ගික කෝලාහල සහ පශ්චාත් යුද්ධ සමයේ සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්වයන් අතර ආර්ථික සමානකම් ඇඳ බැලීම් සිත්ගන්නා සුලුයි.ග වර්ධනය පිළිබඳ සංඛාලේඛණ සිත්ගන්නා සුලු වුවද ඒවා ලගින් විමසා බලනවිට බිම්මට්ටමේ යතාර්ථය පශ්චාත්-යුද්ධ වර්ෂයන්වල හගවන්නේ තිරසාර වර්ධනයක් ලඟානොවූ බවයි.[95]පශ්චාත්-යුද්ධ සමයේ ආර්ථික වර්ධනයවූ 7%ට ඇත්තවශයෙන්ම සාන්ද්‍රණය වී ඇත්තේ අංශයන් කීපයකට පමනි, නම්වශයෙන් ආනයන වෙළඳාම, ප්‍රවාහන සහ ඉදිකිරීම් අංශවල පමනි. තවදුරටත්, මේ කාලය තුල නිලවශයෙන් සේවා නියුක්ති අනුපාතය පහතට වැටුනි, මෙම අඩුවීම අවසාන වශයෙන් සංක්‍රමණික සේවා නියුක්තිය වැඩිවීමට සහ රාජ්‍ය සේවයේ බඳවාගැනිම් වැඩිවීමට බලපෑවේය[96]

[93] ගුණසිංහ, *op. cit.* at 112. එසේම බලන්න හරිනි අමරසූරිය, කැනන් ගුන්ඩුස් සහ මාරකස් මෙයර්, (Canan Gündüz & Markus Mayer), *Rethinking the nexus between youth, unemployment and conflict: Perspectives from Sri Lanka*, International Alert (March 2009), at 19. අනෙත් අය ප්‍රකාශකලා: 'පසුගිය වසර 50 තිස්සේ,, සුභාසාදක රාජ්‍ය මිනුම් යොදාගෙන මැතිවරණයේදී ජන්දය ලබාගැනීමට, සිමාන්තික දේශපාලන අනුග්‍රහයක් ලබන ක්‍රමයක් ගොඩනැගා මතුකිරීමට ශ්‍රී ලංකාව පලපුරුදුකම් ලැබුවා. මෙයට ඇතුලත්වෙනවා, දේශපාලන ප්‍රභූපන්තිය විසින් ඔවුන්ගේ දේශපාලන පක්ෂයේ හෙන්චයියන් අතර රජය විසින් පාලනය කරන කම්කරු වෙළඳපොල සඳහා රැකියාවන් බෙදාහැරීම.

[94] *Ibid*. at 113., ගුණසිංහගේ ආර්ථික විශ්ලේෂණය අනිකුත් ජනවාර්ගික ගැටුම ගැන ඇති අර්ථනිරූපනයන් සමග කියවීමට අවශ්‍යවෙන බව එහි සඳහන් වෙනවා. ජොනතන් ස්පේසර්, උදාහරණයක් වශයෙන්. මෙම අරගලයේ ඓතිහාසික සහ සමාජ-දේශපාලනික සන්දර්භය සවිස්තරාත්මකව ගැඹුරට කිදාබසියි. ඔහු හඳුනාගත්තා යටත්විජිත සමයේ ජනවාර්ගිකකිරීමේ ක්‍රියාවලිය සහ 20th ශතවර්ෂයේදී ජනවාදී-ආගම්වාදී ජාතිමමත්වය වර්ධනයවීම යන දෙකම, ශ්‍රී ලංකාවේ ජාතිවාදී නොසන්සුන්කම ඇතිවීමට බලපා ඇත.. බලන්න ජොනතන් ස්පේසර් , 'Introduction: the power of the past' in Jonathan Spencer (ed.), *Sri Lanka: History and the Roots of Conflict* (1990), at 8. මේ තත්වය යටතේ, ආර්ථික නොසන්සුන්කම , ගැඹුරට ගිය ඓතිහාසික වැරදි මාර්ගවල හේතුන් ලෙස නිගමනය කලහැක.

[95] ප්‍රේමචන්ද්‍ර අතුකෝරළ සහ සිසිර ජයසූරිය, 'Victory in War and Defeat in Peace: Politics and Economics of Post-Conflict Sri Lanka' (2015) 14(3) Asian Economic Papers; World Bank, *Sri Lanka - Country partnership strategy for the period FY2013-16* (2012), at: http://documents.worldbank.org/curated/en/2012/04/16253477/sri-lanka-country-partnership-strategy-period-fy2013-16.

[96] අතුකෝරළ සහ ජයසූරිය, *op. cit.* (2015).

පහල කම්කරු සහභාගිත්ව අනුපාතය 2013 දි 53ග3 පමනක් විය.[97] මින් ආර්ථිකයේ රැකියා වර්ධනයට අදාලව පවතින ප්‍රශ්නය ගැන ඇගවීමක් කරයි.[98]

යුද්ධයෙන් පසුව රජය පොරොන්දුවූ ආර්ථික සෞභාග්‍යය ඉටුකරදීමට අසමත්වීම උඩ අනුන්ගේ වරදට දඬුවම් විදින පුද්ගලයෙක්. (scapegoat) ඔවුන්ට අවශ්‍යවෙනවා. අහිලන් කදිරගාමර් කරුනු දක්වනවා මුස්ලිම්-විරෝධි ව්‍යාපාරයට සිංහල ජනගහනයෙන් බහුතර කොටසක් පශ්චාත්-යුද්ධ ආර්ථිකය ගැන සමාජීය කලකිරීමක් තිබෙනතෙක්, මෙය පිලිගැනීමට හැකිකෙනෙක් සොයාගැනීමට නොහැකිවන අතර, ඉන් අදහස් කරන්නේ සෞභාග්‍යය රැගෙනඒමයි..[99] කදිරගාමර්ට අනුව වෙළදාම් කිරීමේ සහ වෙළද ව්‍යාපාරයන්හි නිරත මුස්ලිම් ප්‍රජාවගේ කොටසකට අනුන්ගේ වරදට දඬුවම් විදින පුද්ගලයන් බවට පත්වී ඇත. .[100] මුස්ලිම් ප්‍රජාවගේ ආර්ථික වාසි සදහාවන ඒකාධිපතිත්වය පිළිබද ඇති සංස්කෘතික (paranoia) විකෘතිභාවය පෝෂ්‍යකිරීම මගින් ඔවුන්ගේ ප්‍රතිපත්තිවලට වියහැකි විවේචනයන් පැත්තකට තැබීමට රජයට හැකිවුනා. මෙම විකෘතිභාවය (paranoia) පෝෂ්‍යකර ඇතිදැඩිකරන්නේ ඉස්ලාම් භීතිකාව මෙහෙයවන දේශිය සහ ලෝක ව්‍යාප්ත දේශනා මගින්ය.[101]

මෙම විශ්ලේෂණයට ප්‍රතිසංවාදයක් ලෙස කොහොමනමුත් වේගයෙන් වැඩෙන සිංහල-බෞද්ධ මධ්‍යම පන්තිය ඇත්තවශයෙන්ම ප්‍රතිවාදය නම් විවාදයට ලක්වූ පශ්චාත් යුධ සමයේ අනුග්‍රාහකත්ව ක්‍රමය උඩ සමෘධිමත්විය. එමනිසා, ආර්ථික කරුනු අනුව, ආගමික ප්‍රචණ්ඩත්වය වැඩිවීම අඩුනොකිරීමට වැදගත්වෙනවා. වෙනත් දේශපාලන සංවර්ධනයන්ගේ බලපෑමෙන් ඇතිවූ චින්තනය නිසා සිංහල-බෞද්ධ මධ්‍යම පන්තියේ කොටස් අතර අනිතුත් ප්‍රජාවන් කෙරෙහි ඇති එදිරිවාදිකම වැඩිවීමක් සිදුවිය. ඊලග කොටස පශ්චාත්-යුද්ධ ආගමික ප්‍රචණ්ඩත්වයන් පැවතිම පිළිබදව දේශපාලන කාචයෙන් නිරික්ෂණය කිරීමට ඒ අනුව යොදාගන්නවා.

### 3ග3 දේශපාලන සන්දර්භය Political context

මුස්ලිම් විරෝධි හැගීම් මතුවූ මෑත කාලයේදි ඇතිවූ දේශපාලන සන්දර්භය ලෝ ඇන්ඩ් සොසයිටි ට්‍රස්ට් Law & Society Trust. ප්‍රකාශනයකට යොදාඇත. *Where Have All The Neighbours Gone? Aluthgama Riots and its Aftermath* (2014). *කොහේද මේ අසල්වාසීන් ගියේ අලුත්ගම කෝලාහල සහ එහි විපාක* :2014-[102] යනුවෙන් එය ප්‍රකාශයවී ඇත. මෙම අධ්‍යයනයෙන් සිංහල බෞද්ධයින් දේශපාලන මතවාදයන් ලෙස ප්‍රාග්-යටත්විජිත සමයේ සිට වර්තමාන පශ්චාත්-යුද්ධ සමය දක්වා මතුවීමේ පියවරවල් සොයායයි. 1956 දි S.W.R.D බණ්ඩාරනායක මහතා ප්‍රධාන දේශපාලන ධාරාවේ සිංහල බෞද්ධයින්ට ක්ෂණික පුණර්ජීවයක් ලබාදීම සදහා, සිංහල බෞද්ධ පොදු ජනතාවගෙන් ආයාචනා කර සිටියේය. A. R. M ඉම්තියාස් මෙම අලුත් උද්යෝගය විස්තර සහිතව විවරණය කරයි. 1956 දි බණ්ඩාරනායක මහතා ලැබූ ජයග්‍රහණයෙන් පළමුවරට සිංහල බෞද්ධ දේශපාලන සම්ප්‍රදායට රාජ්‍ය අනුග්‍රහය ලැබීම ගැන සංඥා කරන බවට ඔහු තර්ක කරයි.[103] වසර කීපයකට පසුව, මේ දේශපාලන සම්ප්‍රදායේ සූරයන් වන ලේඛකයින් වන නලින් ද සිල්වා වැන්නවුන් දෙමල බෙදුම්වාදයට එරෙහිව කරන යුද්ධය සාධාරණය කිරීමට මේ දේශපාලන සම්ප්‍රදාය දිගුකර

[97] ශ්‍රී ලංකා මහාබැංකුව, *වාර්ශික වාර්තාව* 2014 (2015).

[98] 'Defence swallows UDA, substitutes for jobless growth: think tank – Allocations for education, healthcare see no growth', *The Island*, 12 March 2013, at http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=74549.

[99] අහිලන් කදිරගාමර්, 'The Political Economy of Anti-Muslim Attacks', *The Island*, 2 March 2013, at http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=73829.

[100] *Ibid*.

[101] *Ibid*.

[102] Haniffa *et al., op. cit*.

[103] A. R. M. Imtiyaz, 'Politicization of Buddhism and Electoral Politics in Sri Lanka' in Ali Riaz, *Religion and Politics in South Asia* (2010).

ඇත. එක අධ්‍යයනයකට අනුව, ශ්‍රී ලංකාවේ බුද්ධාගම හැඩගැසී ඇති විදිය ලෝකයේ තිබෙන ප්‍රශ්නවලට සුදුසු පිළිතුරක් ලෙස ආරක්ෂා කිරීමට අවශ්‍ය වෙනබව ඔහු තර්ක කරයි.[104] ඔහු තවදුරටත් තර්ක කරනවා .වර්තමානයේ ඇති අර්බුදයන්ට සුදුසුම විසඳුම බුදුන් වහන්සේගේ චක්‍රවත් චින්තනයි. එවැනි චින්තනයන් සංරක්ෂණය කලහැක්කේ ශ්‍රී ලංකාවේ ඇති ථේරවාදී බුද්ධාගමේ පමණකි. මන්දයත්, සිංහල සංස්කෘතියේද සමාන චින්තනයක් ඇති නිසයි.[105] මේ තත්වය යටතේ, සිංහල බෞද්ධ නොවන්නන්ගේ ප්‍රබල වෘපෘතිවලට එරෙහිව ඇති එදිරිවාදිකම්/සතුරුකම් මූලික වශයෙන් සාධාරණය කලහැකියි, එසේම ඉන් අදහස්කලා, බුදුන් වහන්සේ ගැන සිතීම ආරක්ෂා කලයුතුබව.යි[106]

පසුගිය පශ්චාත්-නිදහස ලැබූ කාලසීමාවේ බෞද්ධ භික්ෂූන් දේශපාලනයේ නියැලීම සහ ඒකෙරෙහි බලපෑම් ඇතිකිරීම සැලකිය යුතුදෙයකි. මාපිටිගම බුද්ධරක්ඛිත හිමියන් කොහොමනමුත් පළමුවෙන් බලපෑම් ඇතිකල පශ්චාත්-නිදහස් කාලයේ දේශපාලනයේ නිරතවූ භික්ෂුවක් විය. එක්සත් භික්ෂු පෙරමුණ මෙහෙයවීමට ශක්තියක්වූ උන්වහන්සේගේ පෙරමුණ, 1956 දී S.W.R.D බණ්ඩාරණායක සැබැවින්ම බලයට ගෙනඒමට හැකිවිය. බුද්ධරක්ඛිත හිමියන් බණ්ඩාරණායක මහතාගේ ඝාතනයට සම්බන්ධවූ බැවින් එක්සත් භික්ෂු පෙරමුණ කාලයාගේ ඇවෑමෙන් පරිහාණියට පත්වියග කොහොම නමුත්, බෞද්ධ භික්ෂූන් පලාත්පාලන සහ ජාතික මට්ටමේ දේශපාලනයට පසුගිය දශක කීපයක්තුලම බලපෑම් කලෝය. 2000 වසරේදී බද්දේගම සමිත හිමියන් පාර්ලිමේන්තුවට තේරීපත්වූ පළමු බෞද්ධ භික්ෂුව විය. 2004 වසරේදී ජාතික හෙළ උරුමය (JHU) බෞද්ධ භික්ෂූන් 200 දෙනෙක් මහා මැතිවරණය සඳහා තරගකල අතර ඉන් ආසන 9 ක් සාර්ථකව ජයගැනීමට හැකිවිය.[107] පක්ෂය ප සිංහල-බෞද්ධ දේශාභිමානිය දැක්මක් රට වෙනුවෙන්, භික්ෂූන් වැළඳගත් අතර සහ පක්ෂයට සහාය දෙන අඩිතාලම වුයේ ආධාරකරුවන් අතර සිටියේ නාගරික මැදපන්තියේ සිංහල බෞද්ධයින්ය. ආගම සහ දේශපාලන විෂයපතය අතර වෙනස නොපැහැදිලි වන අතර වෙනස් නොකලහැකි පරිදි බෞද්ධ භික්ෂූන් කෙලින්ම දේශපාලනයට සම්බන්ධවී ඇත. මේ කාළය තුල, තරුණ භික්ෂුවක්වූ ගලබොඩඅත්තේ ඥාණසාර ස්ථවිරයන් ජාතික හෙළ උරුමය :ඍඹ- හි කොටසක් ලෙස එහි ප්‍රධාන සමායෝජකයා විය. ඔහු සහ කිරමේ ධම්මනන්ද හිමි පක්ෂයය අතහැර ගිය අතර ඔවුන් ප්‍රකාශකර සිටියා "එය බුද්ධාගම රැකීමට යුද්ධකාමීත්වය ප්‍රමාණවත් නැතිබවයි"..ග[108] ඔවුන් ඉන්පසුව නව සිංහල-බෞද්ධ ව්‍යාපාරයේ ආරම්භක සාමාජිකයින් වූ අතර, එය කලින් සිටි පූර්වගාමී සංවිධානයට වඩා යුද්ධකාමීත්වයෙන් වැඩිවිය.-එය බොදුබල සේනාවයි(BB).

බොදුබල සේනාව (BB).2012 දී නිල වශයෙන් ආරම්භ කලඅතර බෞද්ධ පැවිද්දන් කිහිපදෙනෙක් සහ ගිහි පුද්ගලයෙක්ගෙන් සමන්විත විධායක කොමිටුවක්ද පත්කරගෙන ඇත.[109] එය පසුව, ආගමික පුද්ගලයින් 1ල500 කින් සමන්විත ජාතික සම්මේලනය 2012 ජුලි මාසයේදී පවත්වන ලදි.[110] ඉස්ලාමීය අන්තවාදීන්ට විරුද්ධව කරන විවිධ විරෝධතා පැවැත්වීමට, මුස්ලිම් විරෝධී හඬ නැගීමට න්‍යායපත්‍රයක් පටන්ගැනින. එවැනි එක විරෝධතාවයක් බදුල්ලේදී පැවැත්වුනේ ඇෆ්ඝනිස්ථානයේ මුජයහදීන් ත්‍රස්තවාදී කණ්ඩායම විසින් බුද්ධගයාවේ සිදුකරන ලද විනාශකිරීමට විරුද්ධවයි.[111] බොදුබල සේනා ආධාරකරුවන්

---

[104] Paul Hedges, *Controversies in Contemporary Religion: Education, Law, Politics, Society, and Spirituality* (2014), at 71.
[105] *Ibid*. Also see Nalin de Silva, *Ape Pravada* (2006), at 172-175; Nalin de Silva, *Panashye Daruwo* (2005), at 40-41.
[106] Hedges, *op. cit*. at 71.
[107] Mahinda Deegalle, 'Politics of the Jathika Hela Urumaya Monks: Buddhism and Ethnicity in Contemporary Sri Lanka, (2004) 5(2) Contemporary Buddhism 83-103.
[108] Gamini Karunasena & Wasantha Rupasinghe, 'Sri Lankan Buddhist chauvinists provoke violence against Muslims', *World Socialist Website*, 9 January 2013, at: http://www.wsws.org/en/articles/2013/01/09/sril-j09.html.
[109] See 'Genesis of Bodu Bala Sena, *The Asian Tribune*, 7 April 2013.
[110] See 'Buddhist clergy wants birth control operations banned', *The Island*, 29 July 2012.
[111] See 'Bodu Bala Sena protest', *The Daily Mirror*, 25 October 2012.

සහ මුස්ලිම් ප්‍රජාව අතර නැගිගෙනයන නොඉසුම් තත්වය අවසානයේදි උච්චතත්වයට පත්ව ප්‍රචණ්ඩත්වය කරායයි. මෙවැනි ප්‍රචණ්ඩත්වයන්වල විශේෂත්වය නම් බරපතල දුර්විපාක කල අපරාධකරුවන් විසින් කල ඒවායි. උදාහරණ වශයෙන් බොදුබලසේනා සාමාජිකයින් සිදුනල ගැටුමක් නිසා මුස්ලිම්වරුන් කිහිපදෙනෙක්ම තුවාලවී බුවැලිකන්ද රෝහලේ රෝහල් ගතකිරීම ගැන ඔවුන්ට විරුද්ධව චෝදනා තිබියදිත් කිසිම විමර්ෂණයක් සිදුනොවිය[112] 2013 ජනවාරි 7 වෙනිදින බොදුබලසේනාව BB නිති විද්‍යාලය ඉදිරිපිට, මුස්ලිම් ශිෂයයන්ට වාසිවන පරිදි විභාග ප්‍රතිඵල වෙනස්කිරීම ගැන චෝදනා කරමින් විරෝධතාවයක් සිදුකලා.[113] ඔවුන් එසේම බෞද්ධ විරෝධි කියා අනුග්‍රහය දක්වන බව කියමින් ව්‍යාපාර ආයතනවලට පහරදීමට පටන්ගෙන ඇත. උදාහරණ ලෙස 2013 ජනවාරි මස 21 දින ඔවුන් බේරුවල හෝටලයකට .බුදුන් වහන්සේට අහිතකර රාත්‍රි භොජන සංග්‍රහයක් පැවැත්වීම මුල්කරගෙන බලපුලුවන්කාරකම පෙන්වා පහරදි ඇත.[114]

දේශපාලන භූ දර්ශනය ඇතුලත, බොදුබල සේනාව ඔවුන්ගේ පොදුපැතිකඩ චමඉකසජ චරදසෙකැ ඉහලට නැංවීමට පටන්ගෙන ඇත. වසර 2013 මුලදි මල්වත්ත පාර්ශවයේ මහානායක තැන්පත් අතිපූජ්‍ය.තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල නාහිමියන් විසින් බොදුබල සේනාව වෙත සුභාශිංෂණ පණිවුඩයක් යවමින් සංවිධානයේ ක්‍රියාකාරිකම් ඉතා වැදගත් සිංහල ජනගහනයේ සහ බෞද්ධ පන්සල්වල ප්‍රබල ලෙස අඩුවීම ගැන අවධානය යොමුකරගැනීමට ඉල්ලා සිටි. [115] ඊරී බොදුබලසේනාව එවකට ආරක්ෂක ලේකම්ව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහතිකය සුරක්ෂිත කරගත්තා, [116] එසේම ඔවුන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාද ඔහුගේ නිළ නිවාසයේදි හමුවී ඇත.[117] 2013 මාර්තු මස 9 වන දින, ආරක්ෂක ලේකම් විසින් බොදුබලසේනාවේ ගාල්ලේ පිහිටි .මෙත්මැදුර. සංස්කෘතික සහ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය උත්සවාකාරයෙන් ආරම්භ කරනලදි. මෙම උත්සවයට ආරක්ෂක ලේකම්ගේ සහභාගිත්වය මගින් විශ්වාසය ඇතිකිරීමට අනුමාන කිරීමට, මෙම ව්‍යාපාරයට ප්‍රමාණවත් ආරක්ෂක ආයතනවලින් ඇති දායකත්වය සුරක්ෂිත කිරීම සහ සැලකියයුතු දේශපාලන බලය ඔසවා තැබීම ආදියට මගපෑදිනි.

කලින් කොටසේ දත්ත ඉදිරිපත් කල ආකාරයට 2013 සහ 2014 කාලවලදි ආගමික සුලු ජනයාට සිදුවූ පහරදීම්වලදි ඊරී මැදිවී සිටිබවට දක්වනවා. මෙම පහරදීම්වල ප්‍රධාන අංග වුයේ නැවතවරක් මෙම කණ්ඩායම දඩුවමින් බේරීමේ අත්තනෝමතික බලය සපචමබසඑහ බුක්තිවිද ඇත. එසේම සමාන කණ්ඩායම් මේ කාලයතුල මතුවීමට පටන්ගත්තේය. සිංහල රාවය සහ රාවණා බලය, මේ යටතේ සදහන් කලහැකි අතර, ඔවුන්ද සමාන දඩුවමින් බේරීමේ බලයක් සහිතව එය ඊරී ට වඩා සුලු වශයෙන් ක්‍රියාත්මකවේ. මේ සංවිධාන දෙකම ග්‍රෑන්ඩ්පාස් පල්ලියේ සිදුවීමට විශේෂයෙන් කැපී පෙනේ. දේශපාලන සන්දර්භය එවැනි දඩුවම් වලින් බේරීමේ බලය පෝෂ්‍යකිරීම ගැන සමහර විස්තර කිරීමක් අවශ්‍යවේ. මේ ගැන ඇති උපකල්පකයක් කිපයක් මගින් පශ්වාත්-යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිමමත්වය යුද්ධකාමි හැඩයක්/ආකෘතියක් ගැනීම ගැන සහ එයට රාජක්ෂ රජය විසින් අනුග්‍රහය දැක්වීම ගැන විස්තර කරනු ඇත. ග

---

[112] See ‘Sri Lankan Buddhist chauvinists provoke violence against Muslims’, *World Socialist Web Site*, 9 January 2013.
[113] See ‘Law school entrance delayed by a week’, *Hiru News*, 8 January 2013.
[114] See ‘Hotel managers arrested over ‘Nirvana style’ dinner event’, *The Sunday Times*, 27 January 2013.
[115] See ‘Malwatte Mahanayake welcomes Bodu Bala Sena’, *Forum for Peaceful Co-existence Sri Lanka*, 1 January 2013, at https://mffcoexist.wordpress.com/2013/01/01/malwatte-mahanayake-welcomes-bodu-bala-sena.
[116] See ‘Sri Lankan Buddhist chauvinists provoke violence against Muslims’, *World Socialist Web Site*, 9 January 2013.
[117] See ‘President Rajapaksa stresses need for respecting rights of all communities’, *The Island*, 28 January 2013.

### *සිංහල-බෞද්ධ අනුග්‍රාහක පදනම උනන්දුකිරීම*
### *Galvanising a Sinhala-Buddhist support-base*

යහපත් ආර්ථික අපේක්ෂාවෙන් ගමේ සිට නගරයට සංක්‍රමණයවූ සිංහල-බෞද්ධයින්, නගරයේ වැඩිවෙමින් පවතින ජනවාර්ගික සහ ආගමික විවිධත්වය නිසා එකිනෙකාට වෙන්ව හුදකලාව සිටීමේ අවදානමට මෙම සංක්‍රමණිකයින් මුහුණපානවා. මේ තත්වය යටතේ සිංහල බෞද්ධයින් එක ප්‍රජාවකට උනන්දුකිරීම එක දේශපාලන න්‍යායපත්‍රයක් වන්නේ එහි පිටුපස සිටින ගංගොඩවිල සෝම හිමියන් විසින් මෙහෙයවන ව්‍යාපාරයි.

සිංහල-බෞද්ධ අනන්‍යතාවය නැවත පනගැන්වීමට සහ මෙම ප්‍රජාවන් පැහැදිලි ඡන්ද පදනමකට මහත්සේ උනන්දුකිරීමට ක්‍රියාවලිය පටන්ගත් අතර, එවැනි ව්‍යාපාරයන් සාර්ථකවුනාග සිංහල-බෞද්ධ දේශමානි පක්ෂය නමින් *සිහල උරුමය* නව ඡන්දපදනම යටතේ වාසිලැබූ පලමුවන දේශපාලන පක්ෂය වූ අතර, 2000 මහමැතිවරණයේදී ඡන්ද 127,000 ලබාගෙන පාර්ලිමේන්තුවේ ආසනයක් හිමිකරගත්තේය. JHU, අවුරුදු හතරකට පසුව ඡන්ද ලක්ෂ පහක් (මිලියන බාගයක්) සහ පාර්ලිමේන්තුවේ ආසන නමයක් අතපත් කරගැනීමෙන් ශ්‍රී ලංකාවේ බැරෑරුම් ඡන්ද පදනමක් පහලවීම ගැන සංඥා කරයි.

මෙම ඡන්ද පදනම ජනවාර්ගික-ආගමික හඳුනාගැනීම අත්‍යාවශ්‍යයෙන් තබාගන්නා අතර එය නිතරම reinforcement වෙරගැන්නුමට අවශ්‍යවෙනවා. එවැනි වෙරගැන්වීමකින් තොරව, එය අඩුම තරමේ සත්‍යයක් මෙන් පෙනෙන, ආර්ථික සංවර්ධනය සහ (social mobility) සමාජ සචලතාවය ආදිය ඡන්දදායකයාගේ මනාපය තීරණය කිරීමට අනිකුත් ඉලක්ක කරා යායුතුවේ. මේ අන්තර්ගතය අනුව, සටන්කාමී හැඩයක් ගත් සිංහල-බෞද්ධ දේශමමත්වය, එය බිහිසුණු වෙන ජනවාර්ගික-ආගමික අන්‍යන්නතාවයට පරමාදර්ශයක නියමය වේ. එමනිසා, ඊරී වැනි කණ්ඩායම්වල පැමිණීම මෙම අනන්‍යතාවය ශක්තිමත් කිරීමට ගෙනයාමට ආක්‍රමණශීලීත්වයින්, අතිබිහිසුනු ව්‍යාපාරය හරහා නගරාසන්නව ජීවත්වන සුලු ජනවාර්ගික පිරිස් ඉලක්ක කරගෙන සිදුවීම තේරුම්කර දියහැකිවේ. පාලක ප්‍රභූ පන්තිය මෙම ඡන්ද පදනම උනන්දුකිරීමට යොදාගන්නා කුමණ ක්‍රියාවලියකින් හෝ කෙලින්ම ප්‍රයෝජන ලබන්නේ එමගින් ඡන්ද 500,000 වඩා ලබාගැනීමට සහතිකවීමෙනි. එබැවින්, මෙම විචාරශීලී ඡන්ද පදනම පාලනය කිරීමට අලංකාරික උපක්‍රමයක් ලෙස ඊරී බොදුබලසේනාව ක්‍රියාකරනු ඇත.

### ***ප්‍රතිසංවිධානය*** ***Counterpoint to JHU***

2010 දී, JHU එක්සත් ජනතා නිදහස් සංධානයේ (UPFA) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග ඡන්ද ව්‍යාපාරය ගෙනයාමට තීරණය කලේය. 2004 හා සසදනවිට පක්ෂය මෙම මැතිවරණවලට එතරම් හොඳින් වැඩකල බවක් නොපෙනේ. පාර්ලිමේන්තු ආසන තුනක් පමණක් දිනාගැනීමට හැකිවිය. නගරාසන්න දේශාභිමාණී සිංහල-බෞද්ධයන්ගේ සහාය දැන් ඒකාබද්ධවී ඇත්තේ පුලුල් සිංහල-බෞද්ධ දේශාභිමානි ව්‍යාපෘතියකයි. එය යුද්ධයට පෙර හා යුද්ධයට පසුවත් රටපුරා වේගයෙන් ගමන්කර ඇත.

එහෙත් න්‍යෂ්ඨ මතුවී ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට එක්වීම එක අපේක්ෂකයෙකුගේ සාර්ථකත්වයෙන් පැහැදිලිවේ. JHU පාර්ලිමේන්තු මන්ත්‍රීවරු අතරින් පාඨලී චම්පික, ඔහු ජනකාන්ත දේශපාලඥයෙක්, අනාගත ජනාධිපති පාලනය පවත්වාගෙන යාහැකි දක්ෂ දේශපාලඥයෙක් වේ. පාඨලී චම්පික රණවක ඡන්ද 120,000 කොළඹ දිස්ත්‍රික්කයෙන් ලබාගත්- අතර ඔහු මේ යටතේ ඉහල මනාප ලබාගත් හතරවැනියා විය. JHU සහාය පදනම UPFA ඡන්ද පදනම යටතේ ඔහුගේ දේශපාලන සාර්ථකත්වයට අර්බුධකාරී තත්වයකට පත්වඇත. [118] පාලක පන්තියේ ප්‍රභූන්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ඇතුලුව,

[118] එහි සඳහන්වෙනවා 2015 මහ මැතිවරණයේදී රණවකගේ දේශපාලන ආයාචනය UPFA ඡන්දදායකයින්ට එහාගිය එකක්බව ඔප්පුකර තිබෙනවා.ඔහුගේ තීරණයෙන් පසුව විධිමත් ලෙස ඔහුගේ සහායදීම මහින්ද රාජපක්ෂට අවසන්වූ පසුව, මෛත්‍රීපාල සිරිසේනට පක්ෂව 2015 ජනවාරි මාසයේදී පැවති ජනාධිපති

කොහොමනමුත් ඔවුන්ගේ ආධිපත්‍යයට තර්ජනයක් ඇතිබව දැකසිටියා. මෙම තර්ජනයට සිදුවිය හැකි ප්‍රතිචාරය වූයේසිංහල-බෞද්ධ දේශපාලනය තුල තවත් බොහෝ අන්තගාමී (රැඩිකල්වාදී) විකල්පයන් ඍඹ ඇතුලත නිර්මානය විමයි. බොදුබලසේනාව BBS නගරාසන්න සිංහල-බෞද්ධයන්ට ඍඹ වෙනුවට වෙනත් විකල්ප හඬක් නැගීමට ඉදිරිපත්වී ඇත. මේ තත්වය යටතේ, BB වැනි සටන්කාමී කණ්ඩායම් පාලක පන්තියේ ප්‍රභූන්ගෙන් ප්‍රයෝජන ලැබුන අතර ඔවුන් ඍඹ සම්ප්‍රදායික නගරාසන්න සිංහල-බෞද්ධ ඡන්ද පදනමට රහසින් අනතුරු හැගවීම සිදුකරයි.[119]

***මිලිටරීකරණය, ජාතික ආරක්ෂාව සහ බලය රැකගැනිම***
***එසකසඒරසීඑසදබල ඛ්එසදඛ්ක`උජමරසඑන 'ඛා රුඑැබඑසදබ දෙ වදඇර***

වසර 2009 දී 30 වසරක යුද්ධය නිමාවීමත් සමගම රජයේ අපේක්ෂාවන්ද (වෙනස්විය) මාරුවිය. "සාමය ආරක්ෂාකිරීම" සිට "ආර්ථික සංවර්ධනය ආරක්ෂාකිරීම" දක්වා මෙම මාරුවීම සිදුවිය. 2005 දී රාජපක්ෂ රජය පිහිටුවේ LTTE පැරදවීමටත් සහ රට නැවත එක්සත් කිරීම යන (mandate) වරම් පදනම් කරගෙනයි. 2006 සහ 2009 කාලයේ ජාතික ආරක්ෂක රාජ්‍යයක් පිහිටුවීමට සහ ශ්‍රී ලංකාවේ පශ්චාත්-නිදහස් ඉතිහාසයේ සමහර ඉතා දරුණු හදිසි නීති බලාත්මක කිරීම. මෙම වරම සාධාරණය කිරීමට යොදාගත්තා.[120] ජාතික ආරක්ෂාව යටතේ ආරක්ෂා සැලසීම සහ ආරක්ෂාව පවත්වාගෙන යාම පිළිබඳ කාර්යය ඉටුකරගැනිම, 2010 ජනාධිපතිවරණය සහ මහා මැතිවරණයනින් ලැබූ රාජපක්ෂගේ සාර්ථකත්වයට හැම පැත්තකින්ම මූලිකවේ. කොහොමනමුත්, ජාතික ආරක්ෂාව සඳහා වූ අවශ්‍යතාවය පශ්චාත් යුද්ධ සමය වනවිට හෙමින් පිරිහීමට පටන්ගෙන තිබුනි. මේ අතර ජාතික ආරක්ෂාවට තිබූ තර්ජන ගර්ජන උදාසීන කරඇති අතර ශීඝ්‍ර ආර්ථික වර්ධනයට ඇති බලාපොරොත්තුව රජයට බෙහෙවින් බර දැරීමට සිදුවිය. ජනාධිපති 2011 අගෝස්තු 25 දින පාර්ලිමේන්තුවේදී කල අලංකාර කථාවෙන් ඔහු ප්‍රකාශ කර සිටියා හදිසි නීතිය අහෝසිකිරීම ගැන. මින් පැහැදිලිව සවිබල ගැන්වෙනවා ත්‍රස්තවාදී තර්ජනයන් නිශ්ක්‍රිය කරඇති අතර රට නැවත සිවිල් පාලනයට නතුවීම වහා සිදුවිය යුතුබවයි.[121] මෙම අලංකාර කථාවෙන් ඒ මිලිටරීකරණයේ ව්‍යාපෘතිය සහ ජාතික ආරක්ෂාව සඳහා බලය රැකගැනීම අර්බුධකාරී උගතෝකෝටික ප්‍රශ්නයක් වී ඇත.

අනිත් අතට රජයේ සංවර්ධන න්‍යායපත්‍රය රදාපවතින්නේ දිගටම සිදුවන හමුදාවේ සම්බන්ධවීම උඩයි. ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යංශ ධුරයන් එක අමාත්‍යංශයක් යටතට ගෙන එනලද අතර ගෝඨාභය රාජපක්ෂ එහි ලේකම් විය. යටිතල සංවර්ධන ව්‍යාපාතින් යුද්ධ හමුදාව මත බරටම විශ්වාසය තබනු ඇති අතර, 2011 දී මහා පරිමාන ඉදිකිරීම් සහ නාගරික අලංකාරකරණීය කටයුතු පටන්ගත්තේය. තවදුරටත්, උතුරු සහ නැගෙනහිර අතිවිශාල තණබිම් ඉඩම් අතිවිශාල ප්‍රමාණයක් හමුදාව විසින් විවිධ කාර්යයන්

මැතිවරණයේදී ක්‍රියාකලේය. පසුව ඔහු මහ මැතිවරණයේදී UNP සමග සැදූ සංධානය වන, යහපාලනය සඳහා වන එක්සත් ජාතික පෙරමුණේ අපේක්ෂයකු ලෙස ඉදිරිපත් විය. ඔහු ඡන්ද 100,000 වඩා ලබාගෙන නව දේශපාලන තත්වයට හැඩගැසීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කලේය. .

[119] JHU ජාතික හෙල උරුමයේ ඡන්ද පදනම මහින්ද රාජපක්ෂගේ උපාය මාර්ගයන්වූ අන්තවාදී සිංහල බෞද්ධ කොටස්වල සහාය ලබාගැනිම නිසා පහතට වැටුනි. 2015 ජනවාරි ජනාධිපතිවරණය කාලයේදී JHU දෙදෙරා ගිය අතර උදය ගම්මන්පිල මහින්ද රාජපක්ෂට සහායදුන් අතර චම්පික රණවක මෛත්‍රීපාල සිරිසේනට සහායට එක්විය. 2015 අගෝස්තුවල පැවති මහමැතිවරණයේදී මෙම දෙදරායාම තවදුරටත් පැවතුනි. ඉහත විස්තර කලපරිදි, රණවක සිත්ගන්නා පරිදි ක්‍රියාකල අතර ඔහු මනාප ඡන්ද 100,000 කට වඩා ප්‍රමාණයක් ලබාගෙන තිබුනි. කොහොමනමුත්, UPFA අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්වූ ගම්මන්පිල ආසන්න වශයෙන් මනාප ඡන්ද 200,000 ලබාගෙන සිටි. ඒ අනුව, JHU ඡන්ද පදනම විශාල වශයෙන් UPFA විසින් ග්‍රහණය කරගෙන ඇත.

[120] For a more in-depth analysis of this issue, see International Commission of Jurists, *Authority without Accountability: The Crisis of Impunity in Sri Lanka* (October 2012).

[121] Parliamentary Debates (Hansard) Volume 201 - No. 7, Thursday, 25 August, 2011.

සඳහා සහ වාණිජමය ව්‍යාපෘති සඳහා ඇතුලුව පවරාගන්නා ලදි.[122] යුද්ධ හමුදාව පශ්චාත් යුද්ධ සංවර්ධන යාන්ත්‍රණයෙහි ඒකාබද්ධ කොටසක් බවට පත්විය.ග[123]

අනිත් අතට, රජයට පොදු ආරක්ෂාව පවත්වාගෙනයාම හැරන්නට වෙනත් හේතුවකට, හමුදාව රැස්කිරීමට කොහොමවත් කලනොහැකියි. මේ තත්වය යටතේ, හමුදාව රටේ සියලුම දිස්ත්‍රික්කවලට යෙදවීමට 1947 අංක 25 දරණ පොදු ආරක්ෂක පනත, 12 වන වගන්තිය යටතේ (section 12 of the Public Security Ordinance (PSO), No. 25 of 1947) ජනාධිපතිට පුරුද්දක් වෙලා තිබුනා. යම් සිවිල් පරිපාලනයකට හමුදාව යෙදවීම අත්‍යාවශ්‍යයෙන්ම ජනාධිපති විසින් PSO බලතල යටතේ කරන මාසිකව නියෝගයෙන් නිකුත් කරයි. ජිධල කොහොම නමුත් ජනාධිපතිට පමණක් බලය පවරනවා හමුදාවන් යෙදවීමට, ඔහු නිගමනය කරනවා නම් "පොදු ආරක්ෂාවට තර්ජනයක් ඇතිවිතිබෙන බවට" සහ "ආරක්ෂාවට පොලිසියේ ප්‍රමණවත් නොවන බවටත්". රෙජිමයේ ආර්ථික න්‍යායපත්‍රය එමනිසා ප්‍රත්‍යක්ෂ ලෙසම යැපෙන්නේ "පොදු ආරක්ෂාව" යන සංකේතයක් උඩ වන බැවින්, හමුදාව විසින් එම පොදු ආරක්ෂාව න්‍යායපත්‍රය ඉටුකරයි. මෙලෙස ගැඹුරු සහ පැතිරි පවතින අනනුගුණත්වය පවතිනවා නිතිමය ප්‍රතිපාදක යටතේ, හමුදා යෙදවීමට සහ සත්‍ය අරමුණ එසේ යෙදවීම එය අනුමත කරනවා. මෙම අනනුගුණත්වය (incongruence) සඵල ලෙස විසඳුනානම් මෙය ඇත්තටම පොදු ආරක්ෂාවට තර්ජනයක් ලෙස ගොඩනන්වන ලද එකකි. එමනිසා, පොදු ආරක්ෂාවට ඇති තර්ජනය, මුස්ලිම් ප්‍රජාව සහ පාලක ප්‍රභූන්ගේ වාසිය සඳහා ගැතිකම් කරන සිංහල-බෞද්ධ කණ්ඩායම් අතර නොඉවසුම් ගතිය ඇතිකර නිර්මාණය කිරිම සිදුකරයි. ඊට් බොදුබල සේනාව මෙසේ සකස්කරන උපයමාර්ගයක්, රටේ ස්ථිරත්වයට තර්ජනයක් ලෙස සැකසූ මාර්ගයක ප්‍රතිඵලයක් වන අතර, එය රාජපක්ෂ රජයට පමනක් කලහැකි මැඩපැවැත්වීමකි.

## 3.4 විශේෂිත දේශිය ූසන්දර්භය Particular local context

විශේෂිත ස්ථානගත කරනලද සන්දර්භය, වඩා බෙහෙවින් විශේෂිත සිද්ධිවලට වඩා අභිරූපනයවූ සමාජ-සංස්කෘතික, ආර්ථික හෝ දේශපාලන සන්දර්භයන්ට වරින්වර දායකවේ. උදාහරණ වශයෙන්, 2014 අලුත්ගමදි සිදුවූ කෝලාහල, මුල්වරට සිදුවූ ජාතිවාදි කෝලාහල නොවන අතර 2006 දි මෙම ස්ථානයේදිම ජාතිවාදි කෝලාහලයක් සිදුවි ඇතිබව සඳහන්වේ. පෙනෙන ලෙසට එය නොවැදගත් දෙයක්වූ අතර, සිංහල සහ මුස්ලිම්වරයෙක් අතර මොබයිල් දුරකථනයක් සම්බන්ධව පැනනැගි දබරය ජාතිවාදි කෝලාහලයක් දක්වා වැඩිවි මින් අවට ප්‍රදේශයේ කඩ සාප්පු කිහිපයක් විනාශයට පත්විය.[124] මින් පෙනියන්නේ, මෙම විශේෂිත ආගමික සන්දර්භයක් වන නොඉවසීම අලුත්ගම පවති. මෙවැනි වැරදි මගවල් මතුපිටන් නොපෙනුනත්, ඉන් පැහැදිලිවන්නේ වරදක් සිදුනොවූ සුලු සිද්ධියක් වුවත් මහත් පැතිරීගිය පුචණ්ඩත්වයක් ඇතිකිරීමට හැකිවේ.

2013 අගෝස්තු 11 දින, කොළඹ ග්‍රෑන්ඩ්පාස්හිදි වන්දනාමාන කරන ස්ථානයට පහරදිම, දේශිය සන්දර්භයකින් නැතහොත් නැඹුරුවකින් ආගමික ප්‍රචණ්ඩක්වය ඇතිකිරීම ගැනවූ ඊලග හොඳ උදාහරණයක්වේ. මෙම පහරදිම සරලව කියවියහැකියි මුස්ලිම් විරෝධි පහරදිමක් ලෙස, එහෙත් පහරදුන්නන් තේරුම්ගන්නේ එය "අනුමත නොකල ගොඩනැගිල්ලක්" ලෙසයි- මෙය ආගමික ගොඩනැගිලිවලට පොදුවේ සිදුවන වරදක් වේ. කොහොමනමුත්, මෙම සිදුවීම ගැන කරනලද ගැඹුරු විශ්ලේෂණයකින් අනාවරණය වෙන්නේ එම ප්‍රචණ්ඩත්වය

---

[122] බලන්න ගෙහාන් ගුණතිලක සහ විද්‍යා නැතැනියල්, 'Illegal Land Dispossession' in *Sri Lanka Governance Report – Transparency International Sri Lanka* (May, 2014).

[123] ඔසේම බලන්න රාජෙස්වෙනුගෝපාල් 'The Politics of Market Reform at a Time of Civil War: Military Fiscalism in Sri Lanka', (2011) 46 Economic & Political Weekly 67. කතුවරයා දත්ත වසර 1980 සිට 2000 මුල් වසර දක්වා "ආරක්ෂක හමුදාවල සංඛාවේ නියත වර්ධනය" සහ "රාජ්‍ය අංශයේ සිවිල් සේවා නියුක්තියේ අඩුවීම" අතර සම්බන්ධය පරීක්ෂාකර බලයි'.මෙම නිරීක්ෂණයෙන් තවදුරටත්, පශ්චාත් යුද්ධ සමය තුල රාජපක්ෂ රජය විසින් තර්කානුකූලව මිලිටරකරණයට භාවිතා කලබවට කලින් තිබූ නැඹුරුතාවය, අනාවරනය කරගත්තා.

[124] Haniffa, *et al*. at 39.

මතුවූයේ සුවිශේෂ ස්ථානීය තත්වය උඩයි. සිත්ගන්නා දෙය වන්නේ, පැරණි මස්ජිදුල් දිනුල් ස්ලාම් පල්ලියට නුදුරුව පිහිටි සමාධි විහාරය-බෞද්ධ විහාර බිම් පෙදෙස පවරාගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින්(UDA)යෝජනාකිරීමයි. පසුව UDA විසින් එම පවරාගැනීම අවලංගුකිරීමෙන් පන්සලටත් යහපතක් සිදුවිය. මේ පන්සලේ අනාගතය සුරක්ෂිත කිරීම ගැන කල්පනා කරන අය වන්දනාමාන කරන ස්ථානයට පහරදීමට කුපිතකල අය බව අනුමාන කරයි. මෙම සිදුවීම වලින් පෙනියන්නේ සන්දර්භානුගත සංකීර්ණතාවයන් මෙහි යටින් ඇති බව පෙන්නුම් කරයි. මේ හේතුව උඩ පුලුල් සමාජ-සංස්කෘතික, ආර්ථික හෝ දේශපාලනික සන්දර්භානුගත කරුණු ආගමික ප්‍රචණ්ඩත්වය විස්තර කිරීමටප්‍රමානවත් නොවේ

මේ හේතුව අලුත්ගම සහ ග්‍රෑන්ඩ්පාස් යන තැන්දෙකේම පෙන්නුම් කලවිදියට, සිදුවීම්වලට අදාලවෙන අතරමෙම වැරදි මාර්ගයන්ට "ක්ෂණික සිදුවීම් ප්‍රචණ්ඩත්වය ඇතිකිරීමට වරින්වර අවශ්‍යවෙනවාමින් ඇයි ප්‍රචණ්ඩත්වය සිදුවන්නේ විශේෂිත මොහොතක මිසක් හැමවිටම නොවේ යන්න පැහැදිලිවෙනවා. මෙසේ මෙම වැරදි මාර්ගයන්වල ස්වභාවය සහ ප්‍රමාණය මෙන්ම මෙවැනි "ක්ෂණික සිදුවීම්" ඇතිකිරීමට හැකි පුද්ගලයින් තේරුම්ගැනීම ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සහ ලිහිල්කිරීම සඳහා වන ප්‍රධාන කරුණ වේ.

### 3.5 පශ්චාත්-රාජපක්ෂ සංවර්ධන Post-Rajapaksa developments

2015 ජනවාරි මාසයේදි, මහින්ද රාජපක්ෂ මහතා පැරදුන අතර, .පොදු අපේක්ෂකයා. වන මෛත්‍රීපාල සිරිසේන මහතා තේරී පත්විය. සිරිසේන මහතා ඇත්ත වශයෙන් කියතොත් ඔහු රාජපක්ෂ මහතාගේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක්ව් සිටියේය. කොහොම නමුත්, එක්සත් ජාතික පක්ෂයත් ඇතුලුව විරුද්ධ පක්ෂයේ සිටි පක්ෂ සමග ඇතිතරගත් සන්ධානය සමග, හැම මට්මකම සිටි පුරවැසියන්ගේ සහයෝගත්වයෙන්, පෙරලාදැම්මට අපහසුවූ පෙර පාලනය (regime) වෙනස්කිරීමේ ව්‍යාපාරය කරලියට ගෙනඒම මුන්පත්විය.
සිරිසේන මහතාගේ ජනාධිපතිධුර කාලයේදි (BB) බොදුබලසේනාව වැනි විපාක නොලබා සිටින :සපවමබසඑහ-කණ්ඩායම් දුර්වලවිය. තවදුරටත්, වෛරී කතාබස් මැඩලීමට පියවර ගෙනඇත. වෛරී කතාබහට විරුද්ධ නීතිරීති කෙටුම්පත් කිරීම සහ ඒ වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම වැනි සමහර ක්‍රියාදාමයන් අරගෙන ඇත.[125] එසේ තිබියදිත්, කරුනක් වූ ජාතික වෛරී ව්‍යාපාරයක් අඩුවෙන් දෘශ්‍යමානවනල ආගමිකව වෙනස්කොට සැලකීම, අසහනය සහ ප්‍රචණ්ඩත්වය නොනැසි පවති. මුස්ලිම් ලේකම් කාඳයාලයේ මෑතදි නිකුත්කල වාඳතාවට අනුව, 2015 ජනවාරි මාසයේ සිට මුස්ලිම් ප්‍රජාවට විරුද්ධව සිදුකල පහරදීම් අඩුම තරමේ 37 ක් වාර්තා කරඇත. [126] මෙම සිදුවීම් අතර, 2015 අප්‍රේල් මස 4 වෙනි දින රත්නපුර, කුරුගල පල්ලිය බිඳදැම්මට උත්සාහ කිරීමද වේ. මෙම බිඳදැම්ම පොලිසියේ මැදිහත්වීමෙන් වලක්වා ඇති අතර ඔවුන් 150 පමණවූ කලහකාරි පිරිසක් විසුරුවා ඇත. මෙම විරෝධකරුවන් *සිහල රාවයේ* සාමාජිකයින් බවට වාර්තාවි ඇත.

මේ අතරතුර, අතීතයේ සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්වයන්හි යෙදුන අපරාධකරුවන්ට විරුද්ධව අභිචොදනා කිරීම පිළිබඳ කිසිම ප්‍රගතියක් නැත. උදාහරණ වශයෙන් අලුත්ගම කෝලාහලයට සම්බන්ධව ප්‍රචණ්ඩක්‍රියාවල යෙදුනු සැකකරුවන් තවමත් අභිචෝදනා කරනැත. මේ තත්වය යටතේ 2015 පශ්චාත්-ජනවාරි යුගය, බරපතල ගණයේ ආගමික ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සහතික කරයි. යථාකාලයේදි දුර්විපාක නොලබා සිටීම අවසන් කිරීමට, පසුගිය කාලයේ සිටි අපරාධකරුවන් නීතියට හමුවට ගෙන ඒමට නවරජය අව්‍යාජ පියවරවල් ගන්නවා ඇතැයි අපේක්ෂා කරයි. !

---

125 'Decisions Taken at the Cabinet Meeting Held on 1st April, 2015', *News.lk*, at http://www.news.lk/cabinet-decusions/item/6928-decisions-taken-at-the-cabinet-meeting-held-on-1st-april-2015.

126 Secretariat for Muslims, *2015 Anti Muslim Sentiment In Sri Lanka: Hate Incidents – January To April 2015* (2015).

## 4. මාධ්‍යයේ කාර්යභාරය (භූමිකාව) The Role of the Media

මාධ්‍යයේ කාර්යය ආගමික නිදහස පිළිබඳ කථාවන් හොඳින් තේරුම්ගතහැක්කේ, මෑතදී එහි කාර්යයභාරය අලුත්ගම කෝළාහල සිදුවීමට පෙර සහ ඉන්පසුව තත්වය සලකාබැලීමෙන්ය. ප්‍රධාන මාධ්‍යයන් අලුත්ගම සිදුවීම වාර්තාකලේ නැත, පසුව ඒ පිළිබඳ විස්තර පසුව දිගහැරෙන්නට විය. කෝළාහලය සිදුවූ දවසේ, ප්‍රධාන මාධ්‍යයන් එම සිදුවීම යාවත්කාලින කරමින් ප්‍රකාශකලේ "එම ප්‍රදේශයේ කලබලකාරී තත්වයක් උදාවී ඇති බවයි"ග[127] එය ඉන්පසුව, එතැන සිදුවූ සිද්ධිය ගැන නිවැරදිව වාර්තා කිරීමට අසමත්විය. රාජ්‍ය මාධ්‍ය විශේෂයෙන් විකෘතිකල සහ sanitised ප්‍රබන්ධකල සිදුවීමක් මේ ගැන ඉදිරිපත් කරතිබුනි. 2014 ජූනි මස 17 දා ඉංගිරිසි මාධ්‍ය ප්‍රවෘත්තිපත්‍රය ඩේලිනිවුස් *ඊසකහ හැඅි,* කතෘ වාක්‍යයෙන් කියා තිබුනේ මෙම සිදුවීම "තනිකරවූ" සිදුවීමක් වන අතර එය විශාලකර දක්වා ඇතිබවත්ය.[128] මේ අතරතුර, කෙහෙලිය රඹුක්වැල්ල, ජනමාධ්‍ය සහ තොරතුරු ඇමතිවරයා ප්‍රකාශනයක් නිකුත්කර එය *DailyNews* පුවත්පතේ ගෙනගියා අතර, මාධ්‍යයට නියෝගයක් කරමින් "වගකීමක් ඇතිව ක්‍රියාකරන ලෙස"-එසේම දෝෂාරෝපණය කරමින් සිදුවීම සංවේදජනක බවත් දක්වා ඇත.[129] පෞද්ගලික අයිතිය ඇති ප්‍රවෘත්තිපත්‍ර වන අයිලන්ඩ් සහ ඩේලිමිරර් ඉතා සුලු ප්‍රමාණයක තොරතුරු මෙම සිදුවීම ගැන ඉදිරිපත් කර තිබුනි. ඇත්ත වශයෙන් කියතොත්, 2014 ජූනි 16 දින අයිලන්ඩ් කතෘවාක්‍යය දෝෂාරෝපණය කරමින් සඳහන් කලේ චොදනාව ඇත්තේ මුස්ලිම් ප්‍රජාවට වන අතර, එසේම දක්වන්නේ ඊර් රැලියට සහභාගිවූවන් මුලින්ම එයට පහරදුන් බවයි.[130] ප්‍රධාන මාධ්‍යයන්වල සිදුවීම් ගැනවූ විස්තරයන් අවසානයේදී රජයේ නිල ප්‍රකාශයට තරමක් දුරට සමානව තිබීඇත.[131]

මේ කාලයතුල, සමාජමාධ්‍යයන් විකල්ප තොරතුරු මාර්ගයක් ලෙස එළිදරව්වුනා. ස්වාධීන පත්‍ර කලාවේදීන් වාර්තාකරණය සඳහා උපකාරිවුනා.-යථාකාලයේදී-අලුත්ගම සිදුවීම් ඊජැඉදදන මුහුණුපොත සහ ඔඅසඑ්එැර ට්විටර් වැනි සමාජමාධ්‍ය ජාලවල වේදිකාවන් යොදාගෙන ඇත, රජය විසින් ප්‍රධාන මාධ්‍යයන් වෙත කරන අතිවිශේෂ පාලනය සමාජමාධ්‍ය ජාලය දක්වා දික්කර ඇතිබව දක්නට නැත. ස්වාධීන මාධ්‍යවේදීන්ට නිදහසේ තොරතුරු හුවමාරුකරගැනීමට සහ යාවත්කාල කිරීමට මෙන්ම සංස්කරනය නොකල සිදුවීම්ද ඔවුන්ට දිගහැරගනී.[132] මෙවැනි තොරතුරු අවසාන වශයෙන් අලුත්ගම කෝළාහල ගැන පොදු ජනතාව දැනුවත්කිරීමට මෙවලමක් කරගෙන ඇත. රජය මෙම සංසිද්ධියට වයැබදපැබදබ ස්වාධීන මාධ්‍යවේදීන්ට අවමන් කිරීම මගින් තදින්ම ප්‍රතිචාර දැක්වූවා. ඔවුන් මෙවැනි සිද්ධීන් වාර්තාකිරීමට, සමාජමාධ්‍ය ජාලයන් වේදිකාවන් භාවිතාකරනවා. 2014 ජූනි මස 17 වෙනිදින *ඊසකහ හැඅි* පුවත්පතේ කර්තෘ වාක්‍යය මගින් සමාජ මාධ්‍ය ජාලය.වැඑ්එහ වදකසඑසජ්ක ඪ. සුලු දේශපාලන අරමුණු දක්වා ලුහුබැදයාමක් ලෙස විවේචනය කරනවා[133] රජය සමාජ මාධ්‍යය ගැන සැලකිල්ලට ගන්නා බවට ලකුණු පෙන්වීමට සුලු බලපෑමක් කරයි. තවදුරටත් නිර්නාමිකත්වය සහ (fluidity) ගලායන ස්වභාවය සමාජ මාධ්‍යය තුල අන්තර්ගතවී ඇතිබව පැහැදිලි වීමෙන් මෙම ක්ෂේත්‍රය පාලනය කිරීමට ඉතා අපහසුබව පෙනේ.

---

[127] ‘Tense situ in Aluthgama’, *The Daily Mirror*, 12 June 2014, at http://www.dailymirror.lk/48354/tense-situ-in-aluthgama.

[128] See ‘They Try in Vain’, *The Daily News*, 17 June 2014, at http://www.dailynews.lk/?q=editorial/they-try-vain.

[129] See ‘Act with responsibility - Minister Keheliya’, *The Daily News*, 17 June 2014, at http://www.dailynews.lk/?q=local/act-responsibility-minister-keheliya.

[130] See ‘Police curfew clamped in Alutgama, Beruwala’, *The Island*, 16 June 2014, at http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=105187.

[131] Balachandran, *op. cit.*

[132] See for example, ‘What happened in Aluthgama, a verified account’, *Republic Square*, 15 June 2014, at http://www.therepublicsquare.com/news/2014/06/what-happened-in-aluthgama-yesterday.

[133] ‘They Try in Vain’, *The Daily News*, 17 June 2014, at http://www.dailynews.lk/?q=editorial/they-try-vain.

මේ කාලයතුල, ස්වාධින ජනමාධ්‍යවේදින් අලුත්ගම කෝලාහල සම්බන්ධව රජයේ අලසකම/ ක්‍රියාරහිතබව ගැන විවේචනය කිරීමට පටන්ගත්තා. ධාරිෂා බැස්ටියන් වැනි ජනමාධ්‍යවේදි මේ සම්බන්ධව එය මෙවලමක් කරගත් අතර සහ ඇයගේ ලිපි ප්‍රධාන ධාරාවේ පුවත්පතක් වන ඩේලි එෆ්ටි Daily FT ලොකු අකුරින් සහ කුපිතකරවන කොටසි.එරසනසබට එයැ ඒඑජය. "ගිණිකූරක් ගැසීම" මාතෘකා කරගෙන පලකරඇත. ඇය ප්‍රකාශකලාට

> රජය විසින් මාධ්‍යවේදි ජේ.එස්. තිස්සනායගම් දේශපාලඥ අසාත් සාලි සහ මානව හිමිකම් ක්‍රියාකරු රුකි ප්‍රනාන්දු සහ ප්‍රවීන් මහේශන් පියතුමා, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ ජාතිවාදි නොසන්සුන්කම ඇතිකිරීමට පෙළඹවීම උඩ අත්අඩංගුවට ගත්තද, ගලබොඩඅත්තේ ඥාණසාර හිමි සාපරාධී චොදනාවලින් අත්හැරදමා ඇත.[134]

සමාජ ජාලවලින් සහ නිදහස් පුවත්පත් කලාවෙන් මතුකරන නව තර්ජනයන් ප්‍රමාණය ආරක්ෂක ආයතනයන් තේරුම් ගෙන ඇත. එය එමනිසා, 2014 අවසාන භාගයේදි, නිදහස් මාධ්‍යවේදින්ට තර්ජනය කිරීමට ව්‍යාපාරයක් පටන්ගත්තා සහ සමාජමාධ්‍යයන් ජාතික ආරක්ෂාවට තරජනයක් ලෙස පෙන්වා දුන්නා.[135] ඇත්තවශයෙන් කියතොත් 2014 ජුලි මස 8 දින මාධ්‍යවේදි දිනුක් කොළඹගේ පොලිසියේ අපරාධ දෙපාර්තමේනතුවට කැඳවා අලුත්ගම සිද්ධිය ගැන ඔහුගේ මාධ්‍ය ආවරනය ගැන පැය හතරක් තිස්සේ ප්‍රශ්න කරනලදි.[136] සමාජ මාධ්‍යජාලය හරහා, කොළඹගේ අලුත්ගම අලුත් තත්වය පිළිබදව ජනතාවට විස්තර සැපයීමේ මෙවලමක් විය. 2014 ජුලි මාසයේදි රජය විසින් සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාකාරකම්වලට, ආරක්ෂක අමාත්‍යංශය විසින් නිකුත් කරනලද ලිපියක් හරහා සීමාවක් පැනවියග[137] මෙම ලිපියෙන් සියලු සිවිල් සමාජ සංවිධාන, පුවත්පත් සාකච්ඡා, වැඩමුලු සහ මාධ්‍යවේදින් සඳහා පුහුණුවීම් කටයුතු කිරීමෙන් වැලකි සිටින ලෙස උපදෙස් දි ඇත. (Transparency International Sri Lanka) ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා විසින් සංවිධානය කරතිබූ විමර්ෂණ පුවත්පත් කලාව පිළිබද වැඩමුලුව, සංවිධානාත්මක කලහකාරී පිරිස් විසින් කල විරෝධය සහ කඩාකප්පල්කිරිම උඩ අත්හිටුවීමට සිදුවිය.[138] එසේවුවත් ආරක්ෂක ලේකම්ගේ ලිපියට නීතිමය බලයක් හිමිව තිබුනේ නැතත්, එය සංවිධානවලට තර්ජන කිරීම් සහ එපමනත් නොව සිවිල් සමාජ සිදුවීම් කඩාකප්පල් කිරීම අනුමතකර ඇතිබව පෙනේ. ආරක්ෂක ආයතනවල ව්‍යාපාරයන්ට නිදහස් මාධ්‍යවේදින් අලුත්ගම කෝලාහල වාර්තාකලේ කෙසේද යන්න දැනගැනීමට ඕනෑකමක් ගැන, කාලනියමයන් සහ ශබ්දමාලාවන් අනුව පැහැදිලි සම්බන්ධයක් තිබුනා.

---

134 බලන්න ධරිෂා බැස්ටියන්ස්, 'http://www.ft.lk/article/313452/Striking-the-match' *The DailyFT*, 26 June 2014, at http://www.ft.lk/article/313452/Striking-the-match#sthash.kg9F0kFc.dpuf.

135 ගෝඨාභය රාජපක්ෂ, 'ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව', ආරක්ෂක අමාත්‍යංශය - *defence.lk*, 19 August 2014, at http://www.defence.lk/new.asp?fname=Sri_Lankas_National_Security_20140819_02; ගෝඨාභය රාජපක්ෂ , 'Reconciliation will enhance national security', *The Sunday Observer,* 31 August 2014, at http://www.sundayobserver.lk/2014/08/31/fea02.asp. ආරක්ෂක ලේකම් ප්‍රකාශකලා: 'ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට ඇතිවූ අවසාන තර්ජනය වුයේ නව තාක්ෂණයෙන් මතුවූ, එමගින් ක්‍රියාකරන සමාජමාධ්‍යයන් වන Facebook මුහුණුපොත, Twitter ට්විටර් සහ වෙනත් වෙබ්අඩවියන්ය.....විශේෂයෙන් අන්තර්ජාලය ඔස්සේ ක්ෂණිකවයාම හරහා සහ ශ්‍රී ලංකාවේ පරිඝණක සාක්ෂරතාවය වැඩිවීම සමගම, බොහෝ යෞවනයන් සමාජජාල ගැන හොඳින් හුරුපුරුදු වි ඇති බැවින්, ඔවුන් ඒවා තොරතුරු ලබාගැනීමට මෙන්ම අදහස් පතුරුවාලීමටද යොදාගනි. පෞද්ගලික ඕනෑකම් හෝ බලතල ඇති පාර්ශවයන් සමාජජාලයන් වලින් අයුතු පුයෝජන ගන්නා අතර ශ්‍රී ලංකාවට හෝ වෙනත් රටකට, සමහර මතවාදයන් (online ඔන්ලයින්) මාර්ගගතව සංසරණය කරන අතර ජනතාව එක්රැස්කිරීමෙන් සහ සංවිධානය කිරීමෙන් ප්‍රශ්න ඇතිකරනවා. මෙය සිදුකරන්නේ අවම වශයෙන් ශාරීරිකව පෙනිසිටීමෙන් නිසා, තර්ජනයකට පත්වෙන අතර එය ජාතික ආරක්ෂාවට ඇති සම්ප්‍රදායික මෙවලම්වලින් මැඩපැවැත්වීමට අපහසුවේ.'

136 'Journalist quizzed by CID over Aluthgama', *The DailyFT*, 8 July 2014, at http://www.ft.lk/article/318944/Journalist-quizzed-by-CID-over-Aluthgama;

137 K. රත්නායක, 'Sri Lankan government imposes political gag on NGOs' *The World Socialist Website*, 10 July 2014, at https://www.wsws.org/en/articles/2014/07/10/sril-j10.html.

138 දිනුක් කොළඹගේ, 'Sri Lanka accused of trying to gag NGOs', *Al-Jazeera*, 22 September 2014, at http://www.aljazeera.com/indepth/features/2014/09/sri-lanka-accused-trying-gag-ngos-201492263518312357 .html.

2013 සහ 2014 කාලවලදී, රජය සුලු ආගමික කොටස්වල උදව්වෙන් වර්ධනා අන්තවාදී සිංහල බෞද්ධ ජන්දපදනම උනන්දුකිරීමට, වැරදිලෙස ගණන් සාදාඇත. ජනාධිපතිවරයේදී සුලු ආගමික කොටස්, මහින්ද රාජපක්ෂට විරුද්ධව ජන්ද දීමෙන් ඔහුව කොන්කර දැමීමට උදව්විය. තවදුරටත්, සිවිල් සමාජ ක්‍රියාකාරින් සහ ස්වාධීන මාධ්‍යවේදින්, ඔවුන්ව රජය විසින් මර්දනය කලත්, ඔහුගේ විරුද්ධවාදියා වූ මෛත්‍රිපාල සිරිසේනගේ සහායට ව්‍යාප්තව ව්‍යාපාරයක් ගෙනගියා. :සරදබහ- උත්ප්‍රාසය සම්පූර්ණ කිරීමට,සමාජ මාධ්‍ය වේදිකාවන් සිරිසේනගේ ව්‍යාපාරය වැඩිදියුණු කිරීමට මෙවලමක් විය. එය අවසානයේදී යහපාලනය සඳහා වන ව්‍යාපාරය ලෙස සකස්කලා. සාරාංශ වශයෙන්, පශ්චාත්-යුද්ධ සමයේ ආගමික ප්‍රචණ්ඩත්වයට රජයේ නොහැකියාව සහ කුමන්ත්‍රණවලට හවුල්වීම 2015 ජනවාරි 8 දා සිදුවූ රෙජිමයේ නැතහොත් රාජ්‍ය පාලනයේ සැලකියයුතු වෙනස්වීමට මූලිකවශයෙන් දායකවිය.

## 5ග සමාප්තිය Conclusion

ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය ගැන යට සඳහන්කල සාකච්ඡා වලින් ප්‍රධාන සොයාගැනීම් කිපයක් මතුවී තිබේ. මෙම සොයාගැනීම් කොහොමටත් විස්තර සහිත වෙනවා. කොහොම නමුත් පුලුල් ආදර්ශයන් පරාවර්ථනය වෙනවා, දත්ත සහ මෙම විෂය සම්බන්ධ ශාස්ත්‍රිය ග්‍රන්ථවලින් ඒවා ඉගෙනගන්න පුලුවන්.

පළමුවෙන්, ශ්‍රී ලංකාවේ සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්වයන්, අත්‍යාවශ්‍ය හැඩයන් දෙකකින් දක්වා ඇත. අනිත් අතට සුලු ආගමික කොටස් දිගටම, හෙමින් හෙමින් සිදුවන පහරදීම්වලට භාජනය වෙනවා. එය තවදුරටත් පෙලගැස්මෙන් බලනවිට, වෛරකිරීමේ නැතහොත් ද්වේශ කිරීමේ ව්‍යාපාරයන් සහ මඩ ප්‍රචාරයන්, තර්ජනය කිරීම්, තැති ගැන්වීම්, දේපොළවලට කරන සුලු තරමේ හානි සහ වරින්වර සිදුකරන ශාරීරික ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවේ. මෙවැනි ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා ‘chronic’ .ආවේනික ප්‍රචණ්ඩත්වය ලෙස විස්තර කලහැකිවේ. අනිත් අතට, ආගමික ප්‍රජාවන් කඩින්කඩ සිදුවන සිද්ධීන් නිසා ඉතා දරුණු ගණයේ ප්‍රචණ්ඩත්වයට ලක්වෙනවා. මෙවැනි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය විශේෂයෙන් බරපතල වන අතර, ඒවාහි ගතිලක්ෂණ අනුව පුලුල්ව පැතිරගිය ශරීරික පහරදීම්, දේපොළ විනාශකිරීම්, සහ පොදුවේ නීතිය සහ සාමය බිඳවැටීම පෙන්විය හැකිය. මෙවැනි ප්‍රචණ්ඩත්වය (‘acute’ violence) දරුණු ප්‍රචණ්ඩත්වය ලෙස විස්තර කලහැකිය.

සිතේ තබාගතයුතු දෙයක් නම්, "ආවේනික" සහ "දරුණු" අතර රේඛාවක් හැමතිස්සේම පැහැදිලි නැත. කොහොමනමුත්, මෙම වර්ගීකරණය එහි බැරෑරුම්කම ඇඟවීමට නොවනබවයි. දරුණු ප්‍රචණ්ඩත්වය නිසැකයෙන්ම වැදගත්කමෙන් අඩුනොවේ, එයට නොනැසී පවත්නා රිනාත්මක සහ දිගුකාලින බලපෑමක් ඉලක්කගත ප්‍රජාවන් කෙරෙහි ඇතිවිය හැකි නිසායි.ග අපගේ අවබෝධය අනුව මෙම දෙබෙදුම (dichotomy) ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රශ්නය විසඳීමට සහ ක්‍රියාකාරී මැදහත්වීමකට උපක්‍රමයක් සොයාගැනීමට ඉතා වැදගත් වේ.

දෙවනුව, ආගමික පහරදීම් පිළිබඳ භූගෝලීය දත්ත, ජනවිකාශන දත්ත සමග සංසන්දනය කරද්දී ඉතා වැදගත් නැඹුරුවක් මතුවුනාග ආවේනික සහ දරුණු දෙබෙදුම විශේෂයෙන් මේ සම්බන්ධව අදාලවේ.

පහල සහ මධ්‍යම ගනයේ ආගමික විවිධත්වයන් ඇති සහ අඩු සාන්ද්‍රණයක් ඇති ප්‍රදේශයන්හි සිටින ආගමික සුලුතරය බොහෝදුරට, ඔවුන්ට විරුද්ධව සිදුවන දරුණු ප්‍රචණ්ඩත්වයන් ගැන සාක්ෂි දරණ බව සොයාගෙන ඇත. මෙම සොයාගැනීම් ඇත්තටම ප්‍රදේශයන් ආශ්‍රිතව පහරදීම් වලට සිමාවෙලා තිබුනා. මෙමගින් ‘LL’ හෝ ‘ML’ ලෙස සඳහන් ප්‍රදේශයන්, ඉහල-අවදානම් සහිත ප්‍රදේශයන් විදියට සලකාබැලිය හැකි අතර එවැනි ස්ථානවල දරුණු ප්‍රචණ්ඩත්වයන් සිදුවිය හැකිය. මෙම නැඹුරුවට පැහැදිලි විශේෂත්වයක් තිබෙනවා, එනම්, ඉහල විවිධත්ව මට්ටමක සිටින හෝ ඉහල සංකේන්ද්‍රණයක් ඇති නැතිනම්

එකතැනක පදිංචිව සිටින ඉහල සුලු ආගමික පිරිස් සිටින ප්‍රදේශවල එසේ දරුණු ප්‍රචණ්ඩත්වයන් සිදුවිය හැකියි. කොහොමනමුත්, දරුණු පහරදීම්, නිර්වචනය කලපරිදි, ප්‍රදේශයන් විශේෂිත කරගත් ඒවා නොවන අතර ඒවා පොදුවේ ඇතිවීමට හැකිය. උදාහරණ වශයෙන්, මාධ්‍යවල ගෙනියන වෛරී ව්‍යාපාරයන් ප්‍රදේශ-විශේෂිත ඒවා නොවේ. එතකුදුවුවත්, එවැනි විරුද්ධවයක් තිබුනත්, සුලු ආගමික පිරිස් ජීවත්වන විශේෂිත ‘LL’ හෝ ‘ML’ ප්‍රා.ලේ. කොට්ඨාශයන්වල :ඒවා වගුව 2 සහ වගුව 3 හි හඳුනාගෙන ඇත. සුවිශේෂ ආවේනික ප්‍රචණ්ඩත්වයන්ට පීඩාවන්ට පත්වෙමින් මුහුණ දෙති.

සමහර ප්‍රා.ලේ. කොට්ඨාශයන් ආවේනික ප්‍රචණ්ඩත්වයන්ට විශාලතර නැඹුරුවක් පෙන්වන්නේ ඇයිද යන්න එයින් උපකල්පනය කරන්න පුලුවන්. එක අතකින්, සාපේක්ෂව අඩු සංඛ්‍යාවක් ඇති ඉලක්කගත සුලුජන ප්‍රජාවන්, ආරක්ෂා නොමැතිව අවදානමකට ලක්ව ඇතිබවට එලිදරව්වේ. මේ ප්‍රදේශයේ බහුතර ප්‍රජාවන්ට අයත් අපරාධකරුවන් පලිගැනීමට බය නැති නිසා යම් ප්‍රමාණයකට නිර්භිත කරවයි. අනිත් අතට, අඩු විවිධත්වය "සත්කාරක-ආගන්තුක ගතියක් ඇතිකරන අතර, බහුතර ප්‍රජාව ඔවුන්ව "සත්කාරකයින්" ලෙස හඳුන්වාගන්නා අතර සුලුජන ප්‍රජාව, ඔවුන් "ආගන්තුකයින්" ලෙස හඳුන්වාගනී.[139] සුලුතර ප්‍රජාව මෙම පිළියෙල කිරීම සීමාව උල්ලංගනය කරඇති බව දකින විට-උදාහරණ වශයෙන් ඔවුන් ප්‍රචාරන කටයුතුවල නිරතවීමෙන්, මේ තත්වය "සත්කාරක-බලෙන් ඇතුලුවෙන්නා" තත්වයට මාරුවේ. එවැනි තත්වයක් යටතේ, බහුතර ප්‍රජාව මෙය ජීවිතයට තර්ජනයක් වන ආක්‍රමණයක් ලෙස දකිනවා. තර්ජන, තැතිගැන්වීම් සහ විටින්විට සිදුවන පහරදීම් හෝ දේපොලවලට හානිකිරීම් ඇතුලුව ආවේනික පහරදීම්, ඊලගට සිදුවේ.

ඉහලින් වෙනසකට පත්වූ ප්‍රදේශයන් විවිධ වර්ගයේ ප්‍රශ්නවලට මුහුණපාන බව පෙනෙන්නට තිබේ. මෙවැනි ප්‍රදේශයන්වල ආවේනික ප්‍රචණ්ඩත්වයට අදාලව සුලු සිදුවීම් කීපයක් දක්නට ලැබෙනවා. එහෙත් ඔවුන්ට දරුණු ප්‍රචණ්ඩත්වයට මුහුණපෑමට සිදුවන්නේ සමහර ජාතිභේදවාදී වැරදි මාර්ගයන් පැවතිම, විශේෂිත ප්‍රදේශයේ පවතින තත්වයේ ප්‍රතිඵලයක් ලෙසයි. හදිසියේ පැනනගින සිදුවීමක් සමගම එකවර ඇතිවන පෙළඹවීමක් නිසා සංවිධානාත්මක කණ්ඩායම් විසින් එවැනි දරුණු ප්‍රචණ්ඩත්වයට මතුවීමට අවශ්‍ය තත්වයන් ඇතිකරන්න පුලුවන්. ග්‍රෑන්ඩ්පාස් සහ අලුත්ගම සිදුවූ ප්‍රචණ්ඩත්වයන් නිසැකයෙන්ම, විශේෂිත ප්‍රදේශයන් ආශ්‍රිතව ඇති නොඉවසුම් තත්වය දරුණු ප්‍රචණ්ඩත්වයක් ලෙස මතුවීමට, හදිසියේ පැනනගින සිදුවීම් සමගම පැත්තකින් කෙරෙන වෛරී කණ්ඩායම්වල කුපිත කිරීම්ද පෙන්නුම් කරනවා.

තුන්වනුව, ශ්‍රී ලංකාවේ නෛතික සහ ප්‍රතිපත්ති රාමුව, ආගමික නිදහස ආරක්ෂා කිරීමට සහ වැඩිදියුණු කිරීමට සෑහෙනදුරට ප්‍රමණවත්ය. (overarching) අභිරූපනයවූ ව්‍යවස්ථානුකූල සහ නිතිප්‍රකාර රාමුව සමගම පැත්තකින් යන පෙර පැවති සහ වර්තමාන රජයන්වල ප්‍රතිපත්ති ප්‍රකාශනයන්, ආගමික ප්‍රචණ්ඩත්වයක්, විශේෂයෙන්ම දරුණු වර්ගයේ ප්‍රචණ්ඩත්වයක් වැලැක්විය හැකි ශක්තිසම්පන්න ආරක්ෂිත රාමුවක් ඇතිකරයි. මේ අතරතුර නව නීති සහ ප්‍රතිපත්ති මෙම රාමුව වඩා ශක්තිමත් කිරීමට හඳුන්වාදීමට පුලුවන්, දැනට පවතින රාමුව පිළිබඳ ප්‍රශ්නය වන්නේ එය බලාත්මක කිරීමයි.[140] මෙරට ආගමික නිදහස පිලිබඳ නීතිවිද්‍යා අධ්‍යයනයන්, ආගමික නිදහස ආරක්ෂා කිරීමට සහ වැඩිදියුණු කිරීමට අධිකරණයේ අකමැතිකම ගැන අනාවරණය කරයි.[141] මේ අතරතුර, පශ්චාත් යුද්ධ සමයේ ආගමික ප්‍රචණ්ඩත්වයක් ගැනවූ කතන්දරයන්හි පොදු ලක්ෂණයක් වූයේ නීති බලගන්වන අධිකාරීන්ගේ ක්‍රියාරහිතබව/අලසකමයි. මෙලෙස ආගමික ප්‍රචණ්ඩත්වයන් කුපිත කිරීම- දරුණු

---

[139] මෙම අදහස Verité Research ආයතනය විසින් ඔවුන්ගේ සතිපතා ප්‍රකාශනයේ *The Media Analysis*. ගවේශනය කරඇත. See for example, Verité Research, *The Media Analysis*, Vol.3 Issue No.4 (4 to 10 February 2013).

[140] මෙම නිරීක්ෂණයන් තව තැනක සඳහන් කරඇත.. බලන්න Centre for Policy Alternatives, *Constitutional and Legal Framework Governing Religious Freedom and Related Issues* (July 2014) and ශිල්පා සමරතුංග සහ සන්ජානා හත්තොටුව, *Liking violence: A study of hate speech on Facebook in Sri Lanka*, Centre for Policy Alternatives (September 2014), at 7.

[141] වින්තු-ජයවර්ධන *et al*, *op. cit*.

ප්‍රචණ්ඩත්වයන් ඇතිවීමට ඉතා වැදගත් මූලාශ්‍රයන්- සිද්ධවෙන්නේ දුර්විපාක නොලබන සාමාන්‍ය වශයෙන් වෛරී කථාවන් ඉවසන පරිසරයකිනි. අභිචෝදනා ලබමින් සහ දඬුවම් ලබමින් සිටින අපරාධකරුවන්ගේ, ආගමික ප්‍රචණ්ඩත්වයේ අඩුම තරමේ එක අංගයක් හෝ ඉවත්කිරීම තිරණාත්මකයිග (BBS) බොදුබලසේනා, සිහල රාවය, රාවණා බලය යන කණ්ඩායම්වල පැටලීමක් නොමැතිව, දරුණු ප්‍රචණ්ඩත්වයේ බොහෝ සිදුවීම් සිද්ධනොවීමට ඉඩතිබුනි. ඇත්ත වශයෙන්, දරුණු ප්‍රචණ්ඩත්වයන් පශ්චාත් 2015 ජනවාරි සමයේදී කැපී පෙනෙන ලෙස අඩුවූයේ මෙම කණ්ඩායම්වලට තිබූ තැන අඩුවීම හා සමව පැවතීම නිසයි. අනාගතයේදී දරුණු ආගමික ප්‍රචණ්ඩත්වයන් වැලැක්වීමේ ප්‍රමුඛතාවය එමනිසා වියයුත්තේ නීති තදින් බලගැන්වීම සහ ශක්තිමත් ආයතනික ප්‍රතිසංස්කරණයි-මේ දෙකම අධිකරණය සහ නීති බලගැන්වීමේ අධිකාරීන්ය.

මේ අතරතුර, ප්‍රජා මට්ටමේ ආවේනික ප්‍රචණ්ඩත්වයන් ප්‍රාදේශීය රාජ්‍ය ආයතනවල සහාය ඇතිව හෝ ඔවුන්ගේ අනුමැතිය ඇතිව සිදුවන්නේය. උදාහරණ වශයෙන්, ප්‍රධාන ආගමික ප්‍රජාවන් විසින් සුලු ආගමික ප්‍රජාවන්ට හිරිහැර කිරීමට හෝ තැතිගැන්වීමට, ප්‍රදේශයේ පොලිසියේ, මහේස්ත්‍රාත් තැනගේ හෝ ප්‍රාදේශීය සභාවේ සහාය ලබාගැනීමට එලඹෙයි. 2014 දී ක්‍රිස්තියානිවරුන්ට විරුද්ධව සිදුවූ පහරදීම්වලට ඇත්ත වශයෙන් සම්බන්ධවූයේ රජයේ සේවකයින් හෝ රාජ්‍ය ආයතනයි. මෙම පහරදීම් බොහෝදුරට ස්වරූපයෙන් "ආවේනිකවූ" ඒවා වූ අතර වරින්වර සම්බන්ධවූයේ ආගමික වැඳුම් පිදුම් කිරීම වැලැක්වීමට තීරණය ගැනීම හෝ වැඳුම් පිදුම් කරන ස්ථානයන් වසාදැම්මයි. එමනිසා, අනාගතයේදී ආවේනික ප්‍රචණ්ඩත්වයන් වැලැක්වීමට පුලුල්වූ ආයතනික ප්‍රතිසංස්කරණ සිතට කාවදින විශාලතර පරමාර්ථයන් රාශිය ප්‍රජා මට්ටමේ ආරවුල් විසඳීමට ඉතාමත් තිරණාත්මකවේ.

හතරවෙනුව, ආගමික ප්‍රචණ්ඩත්වයන් ඇතිවූ සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලනික තත්වයන්/සන්දර්භයන් ප්‍රවේශමෙන් විශ්ලේෂණය කිරීමෙන්, රටේ ඇති සමහර පොදු වැරදි මාර්ගයන් හෙලිකරනවා. ආවේනික ප්‍රචණ්ඩත්වයන් සුලු ආගමිකයින්ට විරුද්ධව වරින්වර සිදුවන්නේ සන්දර්භානුගත කරුණු එකට හමුවීමෙන් ඇතිකරන "සත්කාරක-බලෙන් ඇතුලුවෙන්නා" තත්වයක්, සුවිශේෂ ප්‍රජාවන් ඇතුලත සිදුවීමයි. තවදුරටත්, 2013 සහ 2014 දී සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්වයන් ගැන ඇති බොහෝ උදාහරණවලින් පෙනියන විදියට, ප්‍රචණ්ඩත්වයන් හටගැනීම ගැන වඩා නිවැරදි ලෙසට, පුලුල් සන්දර්භානුගත කරුණුවලට වඩා සුවිශේෂී ස්ථානිය තත්වයන් මගින් පැහැදිලි කරයි. ප්‍රතිචාරයන් ලෙස මෙම සංකීර්ණ සන්දර්භානුගත පරිසරය, නීති බලගැන්වීමේ සහ ආයතනික ප්‍රතිසංස්කරණ වලින් ඔබ්බට ගිය ප්‍රවේශයක් අවශ්‍යවෙනවා. එබැවින් මෙම ස්ථානිය/දේශීය තත්වයන් ගැඹුරට හාරා බැලීමට සහ අවසාන වශයෙන් විසඳුම් සොයාගැනීම සහ ප්‍රජා මට්ටමින් ක්‍රියාත්මක කිරීම තිරණාත්මකයි.

අවසාන වශයෙන්, ආගමික වෛරයට සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව අවශ්‍ය කරන ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ නඩත්තුකරගැනීමට සමාජමාධ්‍යය මෙවලමක් වුනා. සමාජමාධ්‍යය ඇත්තවශයෙන්ම දෙපැත්ත-කැපෙන කඩුවක්වේ. අනිත්අතට, වරින්වර සමාජමාධ්‍යය හරහා පතුරවන වෛරී කථාවන් හඳුනාගත යුතුය. ශිල්පා සමරතුංග සහ සන්ජන හත්තොටුව ප්‍රකාශ කරන පරිදි එයට ආගමික නිදහස කඩකරන සහ වෛරය පතුරුවන වේදිකාවක් වෙන්න පුලුවන්.[142] කොහොමනමුත්, අනිත්අතට, එය, රජය විසින් පාලනය කරන ප්‍රධාන මාධ්‍යධාරාවන්ට එරෙහිව සාර්ථකව සමබරතාවයක් රැකගැනීමට සමාජමාධ්‍යයට හැකිබව හඳුනාගැනීම ඒහා සමානවම වැදගත් වෙනවා. රජය විසින් මෙහෙයවන ආගමික පහරදීම් ලේඛණගත කිරීමටත් ඒවා ගැන පොදු ජනතාවට වාර්තාකිරීමටත් සහ ඒ ගැන ක්ෂණික ප්‍රතිවිරෝධය පෑමට, එය සමහරවිට අවහිර නොකල එකම මාර්ගය වෙනවා. තවදුරටත්, සමාජමාධ්‍යය වේදිකාවන් counter-messaging ප්‍රතිවිරුද්ධ පණිවුඩ හුවමාරුව ගැන

[142] සමරතුංග සහ හත්තොටුව. *op. cit*. මෙම කතුවරුන් මුහුනු පොතේ වෛරය අඩංගු කණ්ඩායම් පිටු 20 සොයාගත් අතර එවැනි ඩිජිටල් ප්‍රමාණයක් වර්ධනය වීම ගැන සංවේගයට පත්වේ. එසේම බලන්න-සංජන හත්තොටුව, 'Liking violence: A study of hate speech on Facebook in Sri Lanka', *Groundviews*, 24 September 2014, at http://groundviews.org/2014/09/24/liking-violence-a-study-of-hate-speech-on-facebook-in-sri-lanka.

තිරණාත්මකයි, ඉන් (public domain) පොදු විෂය පථයේ ඇති ගොඩනැගෙන වෛරී කථාවන් නිෂ්ක්‍රිය කිරීමට උදව්වේ.[143] මෙම පක්ෂ සහ විපක්ෂ දේවල් ප්‍රවේශමින් සලකා බලනවිට, සමාජමාධ්‍යය වැනි නිදහස් ඉඩක් පවත්වාගෙනයාම, එහි ස්වභාවයෙන්ම උරුමව් ඇති අවදානමක් සමගම, පෙනෙන හැටියට වටිනවා. ස්වාධීන මාධ්‍යවේදීන් සහ ක්‍රියාකරුවන්ට ඔවුන්ට ආගමික ප්‍රචණ්ඩත්වයන් ගැන, එය සිදුවූ තැන සිටම පටන් වාර්තාකිරීමට මෙම ඉඩකඩ තිබිය යුතුයි. තවදුරටත්, *පුරවැසි බලය* සහ *අලුත් පරපුර* වැනි නව සිවිල් සමාජ ව්‍යාපාරයන් අතිප්‍රමුඛව සමාජ මාධ්‍යයේ ක්‍රියාකරන අතර ඔවුන්ගේ ජාතිවාදී-පීඩාකාරී ප්‍රතිවිරුද්ධ පණිවුඩ හුවමාරු වැයමට සහාය දැක්විය යුතුවේ. මෙම කණ්ඩායම් අනාගතයේදී ආගමික සහජීවනය පෙරට ගෙනයාමට ඉතා වැදගත් කාර්යය භාරයක් කරනු ඇත.

ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සිවිල් සමාජය විසින් මැදිහත්විය යුතු කරුනු ගැන කලින් කී සොයාගැනීම්වලට අනුව යෝජනාකරමින් මෙම අධ්‍යයනය නිමාකරනවා.

1. වෛරී කථාවන් පිළිබඳ නීතිරීති සවිබලගැන්වීම
   Enforcement of laws on hate speech

සිවිල් සමාජ ක්‍රියාකරුවන්ට, ඔවුන් වෙනුවෙන් කථාකිරීමට අවශ්‍යවෙන්නේ වෛරී කථනයන් ගැන තදින්ම නිති බලගැන්වීමට සිදුවෙන බැවින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට එවැනි ක්‍රියාමාර්ගයන/බලගැන්වීමක් යොදාගැනීම සහතික වීමට අවශ්‍යවිය. වෙනස්කම්කිරීමට පෙළඹවීම, එදිරිවාදිකම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා නොවෙනස්ව ප්‍රධාන අංගයන් ලෙස රැඳිසිටී. වෛරී කණ්ඩායම් ප්‍රසාංගික ප්‍රචණ්ඩත්වයන් ගොඩනැගීමට සුවිශේෂී කාර්යයක් වරින්වර ක්‍රියාකරන අතර, ශ්‍රී ලංකාවේදී ඔවුන් එය විපාක නොලබා සිටීමට සිදුකලා. දරුණු ප්‍රචණ්ඩත්වයන් සිදුවීම වැලැක්වීමට, බලාත්මක කරන නීතිවලට ඇතුලත් වෙන්නේ දණ්ඩනීති සංග්‍රහය සහ ICCPR පනත සහ වෛරී කථනයේ යෙදුන පුද්ගලයින්ට අභිචෝදනා දක්වා දඩුවම්කිරීම එහිදී වැදගත් වෙනවා. කොහොම නමුත්, එවැනි දඩුවම් කිරීමකට අවශ්‍යවෙනවා අරමුන දැනගැනීමට හා වියහැකි එවැනි කථාවකින්, වෙනස්කර සැලකීම, එදිරිවාදිකම් හෝ ප්‍රචණ්ඩත්වයට හේතුවෙනවා. මේ තත්වය යටතේ වෛරී කථනයන් (online ඔන්ලයින්) මාර්ගගතව, පාලනය කිරීමට Anja Kovacs අන්ජානා කොවච් එම නීති නිර්දේශ කරනවාට

> ඉතා අවම ප්‍රමාණයක් අව්‍යාජ සහ දැනට පවතින අනතුර පරීක්ෂණයට ඇතුලත් වියයුතුයිට අනතුරක් හෝ ප්‍රචණ්ඩත්වයක් නියම වශයෙන් ඇතිවීමට හැකියාවක් ඇති අතර මෙම අනතුර හෝ ප්‍රචණ්ඩත්වය වහා සිදුවෙයි. උල්පන්දම්දීමේ ක්‍රියාව ප්‍රසිද්ධ වියයුතුයි. අපරාධයක් කිරීමට චේතනාවක් තිබිය යුතුය, පහරදීමට සුදුසු, සහ හිංසා කිරීම හෝ වෙනස්කර සැලකීම අවශ්‍යවෙනවා ඔප්පුකර පෙන්වීමට සහ ද්වේෂය පැහැදිලිව දැක්විය යුතුය. මේ හැම ප්‍රදේශයකම ඉහල පර්යන්තයක් පිහිටුවීමෙන් පමනක් සුරක්ෂිත කරනවා වෛරී කථාවන්ට සම්බන්ධ නීති නිසා, තොරතුරු නිදහසේ ගලායාම සම්බන්ධව භයානක ප්‍රතිඵලයක් නැතිබව.[144]

රජය විසින් ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදීන් මැඩලීමට ඇති නීති අනිසිලෙස යොදාගත් ආකාරයටම, තෝරාගත්, දේශපාලන විරුද්ධවාදීන් ඉලක්ක කරගෙන ඔවුන්ට එරෙහිව වෛරී කථනයන් පිළිබඳ නීති යොදාගැනීම ගැන බරපතල අවදානමක් තිබේ. වෛරී කථනයන් පිළිබඳ නීති කුමන විදියට බලගන්නවාද යන්න ගැන ක්‍රියාකාරීන් අවදිව සිටිය යුතුවේ. එමනිසා, වෛරී කථනයන් පිළිබඳ නීති බලගැන්වීම ගැන මැදිහත්වීම කලයුත්තේ ඒ ගැන ලංව සිටීමෙන් සහ විධිමත් ප්‍රතිසංස්කරණයකින්, එමගින් ආයතනික හැකියාව සහ අපක්ෂපාතීත්වය වඩා ශක්තිමත් කිරීමෙන්ය.

[143] Samaratunge & Hattotuwa. *op. cit* at 63.
[144] Anja Kovacs *Regulating social media or reforming section 66A? Our recommendations to the Law Commission of India* (August 2014), at 4, cited in Samaratunge & Hattotuwa, *op. cit.* 59.

2. ආයතන ශක්තිමත් කිරීම
   Strengthening institutions

ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සිවිල් සමාජය යන දෙගොල්ලෝම රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණ සඳහා වැඩකල යුතුවේ. ඒවා ආගමික ප්‍රචණ්ඩත්වයන් වැලැක්වීමට සහ ප්‍රජාවන් මට්ටමේ ආරවුල් නිරාකරණය කිරීමට වගකිව යුතුවේ. පුලුල් ලෙස වාර්තාකල සහ විශ්ලේෂණය කරඇති අධිකරණයේ ඇති උදාසීනභාවය හා නිති බලාත්මක කිරීමේ නොහැකියාව හා මන්දෝත්සාහය නිසා මෙම ආයතනයන් ප්‍රතිසංස්කරණ කිරීම සඳහා රජය විසින් සම්පූර්ණ ක්‍රියාදාම සැලසුමක් සකස්කිරීම ඉතා තිරණාත්මක වේ. දරුණු ප්‍රචණ්ඩත්වයන් ආයතනවල තදබල දූර්වලතාවය නිසා සහ රජයේ collusion කුමන්ත්‍රණ නිසාත් වරින්වර හටගන්නවා. තවදුරටත්, ආවේනික ප්‍රචණ්ඩත්වයන් රාජ්‍ය නිළධාරීන්ගේ සහායෙන් හෝ ඔවුන්ගේ අනුමත වීමෙන් වරින්වර සිදුවෙනවා. ආයතනික ප්‍රතිසංස්කරණ එමනිසා කරුණු දෙකක් උඩ වැදගත් වේ. පළමුව,තද නිවාරණ නිතිවල සමාන සහ පරමාර්ථ යෙදිම, වෛරී කථනයන් පිළිබඳව රඳා පවතින්නේ පක්ෂග්‍රාහි නොවුන නිති බලාත්මක කරන සහ අධිකරණ නිලධාරින් මතය. ග නිති බලගන්වන ආයතනවල යෝග්‍යතාවය සහ අපක්ෂපාතභාවය සහ අධිකරණයේ ස්වාධිනත්වය නැවත සකස් කරන්නේ නැතිව කුමණ මුලපිරීමක් ගැන කතාකිරීම මෙම නිති තදින් බලගැන්වීමට ආරම්භකිරීම භයානකවෙනවා. දෙවනුව, ආවේනික ආකාරයේ ප්‍රචණ්ඩත්වය රාජ්‍ය ආයතන විසින් සැහෙනදුරට ඉවසයි. එවැනි විදියේ ප්‍රචණ්ඩත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, එමනිසා ශක්තිමත් ආයතනික ප්‍රතිසංස්කරණයන් අවශ්‍යවෙන අතර එමගින් එම ආයතනවලට බලාපොරොත්තු ඇතිව රැදී සිටිමට බලය දෙනවා.

අධිකරණසංවේදිකරණය සඳහා වැඩසටහන් සම්පාදනය සහ ධාරිතා වර්ධනය, ආගමික නිදහස ආරක්ෂාකිරීමට හා වැඩිදියුණු කිරීමට වෙනුවෙන් අධිකරණ සේවා කොමිෂම සහ විනිශ්චයකාරවරුන් පුහුණු_කිරීමේ මධ්‍යස්ථානය එක්ව වර්ධනය කලයුතුවෙනවා තවදුරටත්,, විදේශිය සහයෝගය ඇතිව දැනටමත් ක්‍රියාත්මක කරඇති ප්‍රජා පොලිස් වැඩසටහන, ආගමික ප්‍රචණ්ඩත්වයට අදාල කොටස් ඇතුලත් කිරීමට සුදුසු ලෙස යොදාගන්නවා.[145] පොලිස් බලකාය ඇතුලත ආගමික ආරවුල් ගැන ක්‍රියාකිරීමට පිහිටුවා ඇති විශේෂ ඒකකය- 2014 අප්‍රේල් මාසයේදී පිහිටුවීම වාර්තාකර ඇත. කොහොම නමුත් විශාල ක්‍රියාකාරී කාර්යයභාරයක් මෙයට දියයුතුයි, ආරවුල් ඇතිවීම වැලැක්වීම සහ ඒවා ප්‍රචණ්ඩත්වය තෙක් ශිඝ්‍රයෙන් වැඩිවීම වැලැක්වීම සහ ආගමික පහරදීම් විභාග කිරීමට, ආගමික සුලුතරය දරුණු සහ ආවේනික ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමට, නීති බලාත්මක කරන අධිකාරීන්ගේ දක්ෂකම සහ පදඑසඩ්එා අභිප්‍රේරණය කිරීම ක්‍රියාකාරී සැලැස්ම මගින් සහතික කරනවා. දේශිය/ස්ථානීය මට්ටමේ සේවය කරන නිලධාරින් අතර ආකල්ප ප්‍රතිසංස්කරණය කිරීමට, සමානතා සහ අරමුනු ඇති ප්‍රජාවන් අතර ඇතිවන ආරවුල් බේරුම්කරගැනිමට එය තවදුරටත් අපේක්ෂා කරනවා. සුලුතර ප්‍රජාව සහ රාජ්‍ය ආයතන අතර හෘදයංගම විශ්වාසයක් ගොඩනැගීමට එවැනි මැදිහත්වීමක් අවසාන වශයෙන් ඉලක්ක කරඇත්තේය.

3. ප්‍රජාව මුල්කරගත් කලින් දැනුම්දිමේ ක්‍රමය
   Community-based early warning systems

ආවේනික ප්‍රචණ්ඩත්වය නිසා පිඩාවට පත්වියහැකි ප්‍රදේශවල කලින් දැනුම්දිමේ ක්‍රමයක් පිහිටුවීම සඳහා සිවිල් සමාජ ක්‍රියාකරුවන්ට, වැදගත් කාර්යභාරයක් කිරීමට සිදුවී තිබේ. ජනවිකාශන පැතිකඩයන් සහ ආගමික ප්‍රචණ්ඩත්වයේ නැඹුරුව අනුව ප්‍රජාව මුල්කරගත් කලින් දැනුම්දිමේ ක්‍රමයක් ‘LL’ හෝ ‘ML’ පැතිකඩයන් අරක්ගත් ප්‍රා.ලේ. කොට්ඨාශයන්වල පිහිටුවීම ප්‍රයෝජනවත් වේ. එසේම සඳහන් වෙනවා බබසෘඝ ඔවුන්ගේ අවසාන වාර්තාවේද එවැනි ක්‍රමයක් පිහිටුවීමට නිර්දේශ කරතිබුනා. වර්ගවාදි නොසන්සුන්භාවය නිරික්ෂණය

---

[145] බලන්න, ‘UK-ආධාර සහිත උතුරු ශ්‍රී ලංකා ප්‍රජා පොලිසි ව්‍යාපෘතිය’, 3 September 2014, at https://www.gov.uk/government/world-location-news/uk-funded-community-policing-project-in-north-of-sri-lanka.

කිරීමටද මෙවැනි ක්‍රමයක් සුදුසුවේ. ඔවුන් තවදුරටත් ප්‍රජා නායකයින්ට සහ නීති බලාත්මක කරන්නන්ට, ආරවුල් නිරාකරණයට වේදිකාවක සලසා ඇත. මෙම ක්‍රමයන් ප්‍රජාව තුලින්ම ඇතිවිය යුතු අතර සහ ගම් මට්ටමේ පරිමානයක් ගතයුතුයි.

කලින් දැනුම්දීමේ ක්‍රමය අන්තර් ආගමික කොමිටුවක් ලෙස හැඩගැසෙන්න හැකිවන අතර ස්ථිර වශයෙන් සාකච්ජා කර ප්‍රශ්න විසදාගැනීමට හැකිවේ. මෙවැනි යාන්ත්‍රණයක් මගින් වැරදි මාර්ගයන් මුල් අවධියේදී අනාවරණය කරගැනීමට හැකිවෙන අතර සහ ප්‍රචණ්ඩත්වය දක්වා වැඩිවී යන නොසන්සුන්කම වලක්වාගත හැකිවේ. මෙම ක්‍රමයන්හි වෙනස්වූ සහභාගිත්වය, කාන්තාවන්, ළමුන් සහ යෞවනයන් සහ වැඩිහිටියන්ගේද සහභාගීත්වය සහතික කලයුතුවේ. මෙවැනි සහභාගිත්වයක් මගින් ලබන විසදුම් කලින් ලැබූ ප්‍රජාවන්ගේ පළපුරුද්ද උඩ සහතික කිරීමට හැරෙනවා මෙන්ම ඒවා විශ්වාසදායක සහ ප්‍රායෝගික වේ. ඊලග නිර්දේශයෙන් විස්තරකල විදියට, මෙවැනි ප්‍රජාව-මූලික කරගත් ක්‍රමයන් අවධානය යොමුකල යුත්තේ සාමය ගොඩනැගීමට සහ මානව හිමිකම් අධ්‍යයන කටයුතු සදහා විශාලතර සංවේදිතාවයක් ඇති සමානතාවය, අඩංගුකිරීම, විවිධත්වයට ගරුකිරීම සහ ප්‍රජා ඒකාබද්ධතාවය ගොඩනැගීමටද වේ.

4. සාමය ගොඩනැගිම, මානව හිමිකම් අධ්‍යාපනය සහ කථිකාවත්/දේශනා විපරිනාමය
   Human rights education, and discourse transformation

ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ, පුලුල් සහ ස්ථානගතවී ඇති වැරදි මාර්ගයන් ප්‍රජාවන් අතරේ පවතී. මෙම අධ්‍යයනය විසින් සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භයන්/නැඹුරුවන් එකට එකතුවීමෙන් ආගමික ප්‍රචණ්ඩත්වයක් ඇතිවීමට සුදුසුවන තත්වයන් ගැන සාකච්ජා කර තිබෙනවා. එය තවදුරටත්, ස්ථානීය තත්වයන් එවැන් ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවීමට දායකවූයේ කෙසේද යන්න පරීක්ෂාකරනවා. මෙම සන්දර්භානුගත වැරදි මාර්ගයන්, නීති බලාත්මක කිරීමෙන්, ආයතනික ප්‍රතිසංස්කරණ සහ පෙර අනතුරු ඇගවීම් ක්‍රමයන් මගින් පමණක් සමනය කලනොහැකිය. අපගේ සහජීවනය පිළිබද අවබෝධය වෙනස්වීම, ඊහා සමානවම අවශ්‍යවේ.

කරුණා සාමය ගොඩනැගීමේ මධ්‍යස්ථානය විසින් යෝජනාකරනලද ත්‍රිවිධ (three-pronged) (තුන්පැත්තකින් පැමින එකතුවන) ප්‍රවේශය, සාමය ගොඩනැගීමට ප්‍රයෝජනවත් පටන්ගන්නා ලකුණකි. මෙම බහුඅංගික සහ යදකසිඑසජ සමුදාය ප්‍රවේශය ඉලක්ක කරඇත්තේ සමාජ-සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන වැරදිමාර්ගයන්ගෙන් දෙනලද සන්දර්භයට ප්‍රතිචාර දැක්වීමටයි. මෙවැනි ප්‍රවේශයකට මානව හිමිකම් අධ්‍යාපන ප්‍රවේශයේ සසදනය සහ සාම අධ්‍යාපන වැඩසටහනේ හරස්කැපුමක්, ආර්ථික උනන්දුව ඇතිකරන සහ සහයෝගිතා වැඩසටහන සහ සංක්‍රාන්තික (transitional) අධිකරණ වැඩසටහනද ඇතුලත්වේ. "ජාතික එකමුතුකම සහ සංහිදියාව" පිළිබද කාර්යාලය වැනි ආයතනයන් විසින් සිවිල් සමාජ ක්‍රියාකරුවන් සමග මූලිකත්වය ගෙන සාමය ගොඩනැගීමේ වැඩසටහනක් සැදීම ශ්‍රී ලංකාවේ පැහැදිලිව දක්නට ඇති විශේෂිත ප්‍රජාවන්ගේ වැරදි මාර්ගයන්ට ප්‍රතිචාර වශයෙන් කරඇත. එවැනි වැඩසටහන් අවසාන වශයෙන් පරමාර්ථයන් දෙකක් ඉලක්ක කරගෙන සිදුකරඇත. පළමුවැන්න, ආගමික නිදහස පිළිබදව ජාතික කතිකාවතක් නිර්මානය කිරීමෙන් සියලුම ආගමික ප්‍රජාවන්ට සමාන තත්වයක් ඇතිකිරීම අවධාරණය කරයි. දෙවනුව, ඔවුන් විසින් දැනට දේශිය/ස්ථානිය මට්ටමක ඇති සත්කාරකරන්නා-ආගන්තුකයා" යන්නෙහි පෙනුම විශේෂයෙන් සිංහල බහුතරයක් සිටින ප්‍රදේශයන්වල, වෙනස්කලයුතුය. එවැනි මට්ටමක් අවසානයේදී අනුප්‍රාප්තිකයෙක් තබා, සංඛ්‍යානාත්මක වෙනසක් තිබියදිත්, සමාන තත්වයන් ඇති ආගම් කණ්ඩායම් අතර සහජීවනයක් ඇති පරිසරයක් මගින් වෙනස්කිරීම සිදුවේ.

5. සමාජ මාධ්‍ය ක්ෂේත්‍රය ආරක්ෂා කිරීම    Protecting the realm of social media

අවසාන වශයෙන්, සිවිල් සමාජය සමාජ මාධ්‍යජාල විෂය පථය සාධාරණ නොමැති රෙගුලාසිවලින් ආරක්ෂා කරගැනීමට වැඩකල යුතුයි. මෙම විෂය පථය, එහි පිරිසිදු වටිනාකම් අගය කල යුතු අතර සහ එය කිසිම විදියේ නම්‍යශිලි පාලනයකට යටත 'නොවිය

යුතුය. එහෙත්, වෛරී කථාවන් පිළිබඳ දැනට පවතින සහ යෝජිත නීති පද්ධතීන් අවශ්‍යයෙන්ම, සමාජ මාධ්‍යජාල හරහා කරන කථික සන්නිවේදනයන 'වල සාරය, එහි ස්වරූපය සීමානොකල යුතුබව ආවරණය වියයුතුයි. එමනිසා, සිවිල් සමාජය ප්‍රවේශම් සහිතව යම් යෝජනාවකට සමාජ මාධ්‍යජාලයන් පාලනය කිරීමට හෝ වාරණය කිරීමට නිර්නායකයක්(criteria) හඳුන්වාදීමට විරුද්ධ විය යුතුයි. ඒ වෙනුවට. මෙම විෂය පථය ආරක්ෂා කලයුතුය. එසේම ආදේශකල නොහැකි වටිනාකම ඒකාධිපතිවාදි පාලනය වෙනත් මාධ්‍යයන් සඳහා යෙදවීම සිහියේ තබා ගත යුතුයි. අවසානයේදී, ආගමික නිදහස, සමාජ මාධ්‍යජාලයට ඉතා ලගින් බැදී සිටිනබව ඇගවීම සාධාරණයි.

# උග්‍ර සහ නිදන්ගත

## ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සාමය තුල ආගමික ප්‍රචණ්ඩත්වය

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමය තුල ආගමික ප්‍රචණ්ඩත්වය යන ප්‍රපංචය පරීක්ෂා කර එමගින් ප්‍රචණ්ඩත්වයට හේතු වන කාරණා පිරික්සා බලා ඇත. එමෙන්ම ප්‍රචණ්ඩත්වය වැළැක්විය හැකි ආයතනික, නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුවද මෙහිදී විශ්ලේෂණය කොට ඇති අතර එයට අමතර ප්‍රචණ්ඩත්වයේ ප්‍රවණතාවයන් මෙන්ම එයට හේතු භූත වන සන්දර්භ සාධකයන්ද මැනවින් ගෙනහැර පා ඇත. මෙම විශ්ලේෂණයෙන් හෙළිවන ආකාරයට ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය අත්‍යවශ්‍ය ස්වරූපයන් දෙකක් ගනී. එකක් ''උග්‍ර'' වූ වන අතර අනෙක ''නිදන්ගත'' වූ ආකාරයයි. මෙම වෙනස් වූ ආකාරයන් හදුනාගැනීමෙන් අපට ආගමික ප්‍රචන්ඩත්වයන්හි ස්වභාවයත් ඒවාට මැදිහත්වීමේ සහ වලක්වා ගැනීමේ ක්‍රමෝපායනුත් උගත හැකි වේ. ප්‍රචන්දත්වයද නොයෙක් ආකාරයෙන් ඔඩු දුවන රෝගයක් බඳුය.එම නිසාම එයට ලබා දෙන ප්‍රතිකාරද නිවැරදි මෙන්ම ස්ථිරසාර ද විය යුතුමය.

INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

equitas
Centre international d'éducation aux droits humains
International Centre for Human Rights Education

ISBN 978-955-580-168-3

9 789555 801683

මුද්‍රණය: හොරයිසන් ප්‍රින්ටින් (පුද්) සමාගම